වාර්ෂික වාර්තාව

2016

ජාතික අධ්‍යාපන ආයතනය

මහරගම

වාර්ෂික ප්‍රගති වාර්තාව - 2016

1.0 හැඳින්වීම

1.1 ආයතනයේ අරමුණු

1985 අංක 28 දරණ පාර්ලිමේන්තු පනත මගින් දූයේ දරුවනට ගුණාත්මක අධ්‍යාපනයක් උරුම කර දීම සඳහා ඉවහල් වන පහත සඳහන් අරමුණු ඉටුකරලීමේ බලය ජාතික අධ්‍යාපන ආයතනයට පවරා ඇත.

(අ) ශ්‍රී ලංකාවේ අධ්‍යාපනය සංවර්ධනය කිරීම සඳහා වූ සැලසුම්, වැඩ සටහන් සහ ක්‍රියාකාරකම් පිළිබඳව විෂයභාර අමාත්‍යවරයාට උපදෙස් දීම;

(ආ) අධ්‍යාපනය හා අදාළ විශේෂිත ක්ෂේත්‍ර සඳහා පශ්චාත් උපාධි අධ්‍යාපනය සැලසීම හා ඒවා ප්‍රවර්ධනය කිරීම.

(ඇ) අධ්‍යාපන පද්ධතියෙහි කාර්ය සාධනය, අරමුණු, ව්‍යුහ, අන්තර්ගතය සහ විධි ක්‍රම ද ඇතුළුව අධ්‍යාපන ක්‍රමය පිළිබඳව සහ අධ්‍යාපනයේ සමාජ, ආර්ථික සහ වෙනත් අංශ අනාවරණය කර ගැනීම සඳහා අධ්‍යයන පවත්වාගෙන යාම සහ ප්‍රවර්ධනය කිරීම;

(ඈ) අධ්‍යාපනික කාර්ය සඳහා තාක්ෂණික ඥානය අනුවර්තනය කිරීම ද ඇතුළුව අධ්‍යාපන පද්ධතියේ නවීකරණ ක්‍රියාවලි ආරම්භ කිරීම සහ ප්‍රවර්ධනය කිරීම;

(ඉ) අධ්‍යාපන පද්ධතියෙහි නියැළි කාර්ය මණ්ඩලවල වෘත්තීය සහ කළමනාකරණ නිපුණතා වැඩි දියුණු කිරීම සඳහා විධිවිධාන සැලැස්වීම;

(ඊ) රජයට සහ වෙනත් අනුමත සංවිධාන සඳහා අධ්‍යාපනය හා සම්බන්ධ විශේෂඥ සේවා ලබාදීම;

(උ) විෂයභාර අමාත්‍යවරයා විසින් අනුමත කරන ලද වෙනත් අධ්‍යාපන සංවර්ධනය වැඩ සටහන් ක්‍රියාත්මක කිරීම සහ

(ඌ) සමාන අරමුණු ඇති වෙනත් ආයතන සමග සහයෝගීව කටයුතු කිරීම.

ඒ අනුව දේශීය හා ගෝලීය අවශ්‍යතාවලට සරිලන, සමාජ ආර්ථික සංදර්භයට උචිත, චිර භාවිත දේශීය දැනුම් හා උරුම අගයන ඵලදායී පුරවැසියන් බිහි කිරීම සඳහා ඉවහල් වන විෂයමාලාවක් මගින් අධ්‍යාපනයේ ගුණාත්මක බව සහතික කිරීමේ ද, පාසල් පද්ධතියට අවශ්‍ය නිපුණතා පූර්ණ වෘත්තිකයන් පිරිසක් නිර්මාණය කරනු සඳහා නායකත්වය සැපයීමේ ද, අධ්‍යාපන සංවර්ධනය ඉලක්ක කර ගත් ප්‍රතිපත්ති සම්පාදනය සුසාධ්‍ය කිරීමට හා ඊට මග පෙන්වනු පිණිස විද්‍යාත්මක විධි ක්‍රම ඔස්සේ තහවුරු කරගත් තොරතුරු පද්ධතියක් ස්ථාපිත කිරීමේ ද වගකීම ජාතික අධ්‍යාපන ආයතනයට පැවරී ඇත.

කාලයේ වේගය ඉක්මවා විවිධ ඉගෙනුම් ක්ෂේත්‍ර තුළට එකතුවන නව දැනුම ජාතියේ දරුවනට උරුම කර දීම සඳහා ශ්‍රී ලංකාවේ දැනට ක්‍රියාත්මක විෂයමාලා ප්‍රතිපත්තියට අනුව සෑම අවුරුදු 8කට වරක් ම විෂයමාලා නවීකරණ ක්‍රියාවලියක් සිදු කෙරේ. ඒ අනුව පසුගිය විෂයමාලා සංවර්ධන ක්‍රියාවලිය 2006 වර්ෂයෙන් ආරම්භ වී 2010 වසරේ දී සාර්ථකව නිම කරන ලදී. පාසල් විෂයමාලාව අරභයා 2012

වසරේ දී තබන ලද ස්ථාවර පදනම මත පිහිටා 2015 වසරේ සිට ක්‍රියාත්මක කිරීමට යෝජිත නව විෂයමාලාව සඳහා පවත්නා විෂයමාලාව විචාරවත් විෂයමාලාවක් බවට පත් කිරීමේ කටයුතු 2012 වසරේ දී ආරම්භ කරන ලදි. පවත්නා විෂයමාලාව යථාර්තවත් කිරීම සඳහා ප්‍රධාන වශයෙන් පාදක කරගනු ලැබුවේ පහත සඳහන් අංශ විෂයමාලාව හා බද්ධ කිරීම සඳහාය.

1. විෂයමාලාව පාසල් පද්ධතියේ ක්‍රියාත්මක වීම පිළිබඳව ඒ ඒ විෂය කංඩායම් මගින් ක්‍රියාත්මක කරන ලද අධ්‍යයන වලින් අනාවරණය වූ කරුණු;
2. විෂයමාලාව පිළිබඳව විවිධ සමාජ කණ්ඩායම් මගින් පෙන්වා දෙන ලද ධනාත්මක අදහස් හා යෝජනා;
3. විෂයමාලා සංවර්ධනය හා ක්‍රියාත්මක කිරීම පිළිබඳව ලෝකයේ විවිධ රටවල්වල සාර්ථක අත්දැකීම්;
4. ඒ ඒ විෂය ක්ෂේත්‍රවලට එක්වූ නව දැනුම් හා ඉගෙනුම් ක්‍රමවේද;

2016 වර්ෂයේ දී ප්‍රධාන වශයෙන් විෂයමාලා කාර්ය නාභිගත නාහිත කරන ලද්දේ 7 හා 11 ශ්‍රේණිවල විෂයමාලාව යාවත්කාලීන කිරීම, එම යාවත්කාලීන විෂය පන්ති කාමරයේ ක්‍රියාත්මක කිරීම සුපරික්ෂණය සහ ගුරු අත්පොත් සකස් කිරීම සහ එම යාවත්කාලීන වූ විෂයමාලාවට අදාළ 2,8 සහ 12 ශ්‍රේණිවල පළාත් පුහුණුකරුවන් පුහුණු කිරීම හා 2018 වර්ෂයේ ක්‍රියාත්මක වන 3,9 සහ 13 ශ්‍රේණි වලට අදාළ විෂය නිර්දේශ සකස් කිරීම සඳහාය.

1.2 මූල්‍ය තත්වය

අධ්‍යාපන ආංශික සංවර්ධන වැඩසටහන හඳුන්වා දීමෙන් අනතුරුව විෂයමාලා සංවර්ධනය හා සම්බන්ධ කටයුතු සඳහා අවශ්‍ය මූල්‍ය ප්‍රතිපාදන ප්‍රධාන වශයෙන් ආවරණය කර ගන්නා ලද්දේ වර්තමානයේ දැනුම් කේන්ද්‍රයෙහි පදනම ලෙස පාසල් අධ්‍යාපන පද්ධතිය ප්‍රතිනිර්මාණය කිරීමේ ව්‍යාපෘතිය (TSEP /DFAT) යනුවෙන් හැඳින්වෙන අධ්‍යාපන ආංශික සංවර්ධන රාමුව හා වැඩසටහන (ESDFP)හා එක්සත් ජාතීන්ගේ ළමා අරමුදල (UNICEF) හා ආසියානු සංවර්ධන බැංකු (ADB)ප්‍රතිපාදන මත ක්‍රියාත්මක වන අධ්‍යාපන ආංශික සංවර්ධන වැඩසටහන (ESDP) යන මූල්‍ය ප්‍රවාහ යටතේය.

පවත්නා මුදල් අවහිරතා නිසා මහා භාණ්ඩාගාරය මගින් ආයතනයට ලබාදෙනු ලබන ප්‍රතිපාදන ප්‍රමාණය පුද්ගල වැටුප් හා දීමනා සඳහා වැය වූ පසු ජලය,විදුලිය,පවිත්‍රතා හා ආරක්ෂක වැනි ප්‍රධාන පුනරාවර්තන වැය ශීර්ෂ පියවාගැනීමට හෝ ප්‍රමාණවත් නොවන තත්වයක් තුළ ආයතනයේ වැය පියවාගනු ලබන්නේ ආයතනය විසින් ක්‍රියාත්මක කරනු ලබන විවිධ පාඨමාලාවලින් ලැබෙන ආදායම්

උපයෝගි කර ගනිමිනි. එසේ වුව ද ආයතනය මගින් අධ්‍යාපනයේ විශේෂිත ක්ෂේත්‍ර යටතේ පවත්වනු ලබන පාඨමාලා හුදෙක් ලාබ ඉපයීමේ පරමාර්ථයෙන් ක්‍රියාත්මක කරනු ලබන ඒවා නොවන බැවින් ඒ සඳහා අයකරනු ලබන්නේ වෙනත් ආයතන මගින් සමාන පාඨමාලා සඳහා අයකරන මුදල හා සැසඳීමේ දී අඩු මුදලකි. 2016 වර්ෂයේ දී ආයතනයේ ආදායමෙන් රු. 189,122,000ක පුනරාවර්තන වියදමක් සිදු කරන ලද අතර එය ආයතනයේ පුනරාවර්තන වියදමින් 53 %ක් විය.

වගුව 1: 2016 වර්ෂයේ ආයතනයේ ආදායම් වියදම් පිළිබඳ තොරතුරු.

මූල්‍ය ප්‍රභවය	පුණරාවර්කව වියදම්		ප්‍රාග්ධන වියදම්	
	සංශෝධිත ප්‍රතිපාදනය	සත්‍ය වියදම	සංශෝධිත ප්‍රතිපාදනය	සත්‍ය වියදම
ඒකාබද්ධ අරමුදල (CF)	345,000,000	303,000,000	157,000,000	21,000,000
දැනුම් කේන්ද්‍රයෙහි පදනම ලෙස පාසල් අධ්‍යාපනය ප්‍රතිනිර්මාණය කිරීම පිළිබඳ ව්‍යාපෘතිය (TSEP)	64,000,000	20,000,000	16,000,000	16,000,000
ඔස්ට්‍රේලියානු රජයේ ප්‍රතිපාදන (DFAT)	40,000,000	84,981,156	-	-
ආයතනයේ ආදායම් (Income)	156,431,000	156,431,000	25,000,000	10,840,356
අධ්‍යාපන ආංශික සංවර්ධන වැඩ සටහන (ESDP)	65,000,000	65,000,000	-	-
එක්සත් ජාතීන්ගේ ළමා සංවර්ධන අරමුදල (UNICEF)	10,226,000	10,226,000	-	
යුනෙස්කෝව සඳහා වූ කොරියානු ජාතික කොමිසම	4,300,000	4,346,706	-	

1.3 කාර්ය මණ්ඩලය

2016 මාර්තු 16 වන දින ජාතික අධ්‍යාපන ආයතනයේ අධ්‍යක්ෂ ජනරාල් තනතුර සඳහා ආයතනය ආරම්භයේ සිට සේවය කළ, ආයතනයේ අභිවෘද්ධිය සඳහා තම පූර්ණ ශාස්ත්‍රීය දායකත්වය ලබාදෙමින් කැප වූ නිලධාරිනියකගේ පත්වීමත් සමඟ ආයතනයේ කාර්ය වඩාත් ඵලදායි හා කාර්යක්ෂම ලෙස පාසල් පද්ධතියට ගෙනයාම සඳහාත් ජාතික ආයතනයක් ලෙස පැවතීම සඳහා සපුරා ගත යුතු මානව හා භෞතික සම්පත් වර්ධනය කිරීම සඳහාත් ඉවහල්වන ක්‍රියාමාර්ග රැසක් ආරම්භ කරන ලදී.

වගුව 2 : 2016 වසර ආරම්භ වනවිට ආයතනයේ පැවති කාර්යමණ්ඩල තත්ත්වය

තනතුර	අනුමත කාර්ය මණ්ඩලය (01.01.2016 දිනට)	පවත්නා කාර්ය මණ්ඩලය (01.01.2016 දිනට)			පුරප්පාඩු සංඛ්‍යාව (01.01.2016 දිනට)
		පුරුෂ	ස්ත්‍රී	එකතුව	
අධ්‍යක්ෂ ජනරාල්	01	01	00	01	00
අතිරේක අධ්‍යක්ෂ ජනරාල්	01	00	00	00	01
නියෝජ්‍ය අධ්‍යක්ෂ ජනරාල්	06	04	00	00	02
අධ්‍යක්ෂ	27	09	06	15	12
සහා ලේකම් (අධ්‍යාපන)	01	00	00	00	01
ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය /ජ්‍යෙෂ්ඨ අධ්‍යාපනඥ	72	34	17	51	21
කථිකාචාර්ය / අධ්‍යාපනඥ	75	18	26	44	31
සහකාර කථිකාචාර්ය / සහකාර අධ්‍යාපනඥ	90	18	27	45	45
අනධ්‍යයන කාර්ය මණ්ඩලය	379	152	156	308	71
එකතුව	**652**	**236**	**232**	**468**	**184**

පාර්ලිමේන්තු පනත මගින් ආයතනයට පැවරී ඇති කාර්ය නියමිත පරිදි ඉටුකිරීම සඳහා ආයතනයේ දැනට සිටින කාර්ය මණ්ඩලය විවිධ අපහසුතා මධ්‍යයේ වුව ද දැඩි කැපකිරීමක් සිදු කළ අතර, එම අපහසුතාව සඳහා ප්‍රධාන වශයෙන් බලපාන ලද්දේ ඉහත වගුවේ දැක්වෙන පරිදි කාර්යමණ්ඩල හිඟයයි. 2016 වර්ෂයේ ආරම්භ වන අවස්ථාව වනවිට 652 වූ අනුමත කාර්යමණ්ඩලයේ පුරප්පාඩු 184ක් පැවතුනි. ආයතනයේ කාර්ය මණ්ඩල හිඟය පියවීමට ජාතික අධ්‍යාපන ආයතනය විසින් අධ්‍යාපන අමාත්‍යංශය හා කළමනාකරන සේවා දෙපාර්තමේන්තුව සමඟ එක්ව ගන්නා ලද සාධනීය පියවර හේතුවෙන් කාර්යමණ්ඩල පුරප්පාඩු 75ක් පිරවීම සඳහා අභ්‍යන්තර හා බාහිරව පුද්ගලයන් බඳවා ගැනීමට අවශ්‍ය පියවර ගෙන ඇත.

වගුව 3 : අධ්‍යාපන සුදුසුකම් අනුව අධ්‍යයන කාර්යමණ්ඩලය



2.0 ජාතික අධ්‍යාපන ආයතන සංවිධාන ව්‍යුහය

2.1 ආයතන සභාව – 2016

ජාතික අධ්‍යාපන ආයතන පනත මගින් එහි ආයතන සභාව වෙත පහත සඳහන් බලතල පැවරී ඇත:

- ව්‍යවස්ථාවෙන් නියම කරන ලද බඳවා ගැනීමේ පටිපාටි හා පත් කිරීම් සම්බන්ධ ක්‍රියා පිළිවෙලට අනුව ආයතනයේ කාර්ය මණ්ඩලය පත් කිරීම;
- ආයතනයේ කාර්ය මණ්ඩලයේ සේවා සම්බන්ධ නියමයන් සහ කොන්දේසි, වැටුප්, වේතන හා අනෙකුත් පාරිතෝෂික ඇතුළු කාර්ය මණ්ඩල සේවා ගෙවීම් සම්බන්ධ නීති රීති තීරණය කිරීම;
- ආයතනයේ විනය සම්බන්ධ නීති රීති සම්පාදනය කිරීම;
- ආයතන කාර්ය මණ්ඩලයට ප්‍රතිලාභ ලැබෙන පරිදි හා අර්ථ සාධක සහ සුභසාධක වැනි අරමුදල් ස්ථාපිත කිරීම හා විධිමත් කිරීම.

ජාතික අධ්‍යාපන ආයතන පනතට අනුව ආයතනය සම්බන්ධ මූල්‍ය හා පරිපාලන බලතල පැවරී ඇත්තේ ආයතන සභාවට ය. 2016 වසරේ ආයතන සභාව පහත සඳහන් සාමාජික සාමාජිකාවන්ගෙන් සමන්විත විය.

ඩබ්.එම්. බන්දුසේන මහතා (ලේකම්, අධ්‍යාපන අමාත්‍යාංශය)	-	*සභාපති (2016 අගෝස්තු දක්වා)*
සුනිල් හෙට්ටිආරච්චි මහතා (ලේකම්, අධ්‍යාපන අමාත්‍යාංශය)	-	*සභාපති (2016 සැප්තැම්බර් සිට)*
මහාචාර්ය ගුණපාල නානායක්කාර මහතා (අධ්‍යක්ෂ ජනරාල්, ජාතික අධ්‍යාපන ආයතනය)	-	*සාමාජික (2016.03.14 දක්වා)*
ආචාර්ය ටී.ඒ.ආර්.ජේ. ගුණසේකර මිය (අධ්‍යක්ෂ ජනරාල්, ජාතික අධ්‍යාපන ආයතනය)	-	*සාමාජික (2016.3.16 සිට)*
මහාචාර්ය එස්.සන්දරසේගරම් මහතා (හිටපු පීඨාධිපති, අධ්‍යාපන පීඨය, කොළඹ විශ්ව විද්‍යාලය)	-	*සාමාජික (2016.07.12 දක්වා)*
ආචාර්ය ටී.ඒ. පියසිරි මහතා (උප කුලපති, වෘත්තීය තාක්ෂණ විශ්ව විද්‍යාලය)	-	*සාමාජික (2016.07.12 දක්වා)*
වයි.එල්.එම්. නවාවි මහතා (ජ්‍යෙෂ්ඨ සහකාර ලේකම්, උසස් අධ්‍යාපන අමාත්‍යංශය)	-	*සාමාජික (2016.07.12 දක්වා)*
කේ.ඒ.එච්.සී. පුබුදුසිරි මහත්මිය (සහකාර අධ්‍යක්ෂක, ජාතික අයවැය දෙපාර්තමේන්තුව)	-	*සාමාජික (2016.07.12 දක්වා)*
මහාචාර්ය ඩබ්.ඩී.ඩබ්. ජයතිලක මහතා (මහාචාර්ය, රසායන විද්‍යා දෙපාර්තමේන්තුව, ශ්‍රී ජයවර්ධනපුර විශ්ව විද්‍යාලය, ජයවර්ධනපුර)	-	*සාමාජික (2016.07.12 දක්වා)*
ආචාර්ය නිර්මාල් රංජිත් දේවසිරි මහතා (ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය, සමාජ විද්‍යා පීඨය, කොළඹ විශ්ව විද්‍යාලය)	-	*සාමාජික (2016.07.12 දක්වා)*
මහාචාර්ය ජයදේව උයන්ගොඩ මහතා (සමාජ විද්‍යා පීඨය, කොළඹ විශ්ව විද්‍යාලය)	-	*සාමාජික (2016.07.12 දක්වා)*
වෛද්‍ය අමල් හර්ෂ ද සිල්වා (අධ්‍යක්ෂ, සෞඛ්‍ය අධ්‍යාපන හා ප්‍රකාශන කාර්යාංශය)	-	*සාමාජික (2016.07.12 දක්වා)*
මහාචාර්ය පී.එස්.එම්. ගුණරත්න මහතා (උප සභාපති, විශ්ව විද්‍යාල ප්‍රතිපාදන සභාව)	-	*සාමාජික (2016.07.13 සිට)*
මහාචාර්ය හේමමාලා රත්වත්ත මිය (භාෂා අධ්‍යයන දෙපාර්තමේන්තුව, විවෘත විශ්ව විද්‍යාලය)	-	*සාමාජික (2016.07.13 සිට)*

එම්.කේ. ප්‍රදීප් කුමාර මහතා	-	*සාමාජික (2016.07.28 සිට)*
(අධ්‍යක්ෂ, ජාතික අයවැය දෙපාර්තමේන්තුව, මුදල් අමාත්‍යාංශය)		
තිස්ස හේවාවිතාරණ මහතා	-	*සාමාජික (2016.07.12 සිට)*
(රාජ්‍ය ලේකම්, අධ්‍යාපන අමාත්‍යාංශය)		
එස්.එච්. කුමාරසිංහ මහතා	-	*සාමාජික (2016.07.12 සිට)*
(විදුහල්පති (විශ්‍රාමික) රාජකීය විදුහල, කොළඹ)		
ඒ.එම්.ආර්.බී. අමරකෝන් මහතා	-	*සාමාජික (2016.07.28 සිට)*
(කොමසාරිස් ජෙනරාල් (විශ්‍රාමික) විභාග දෙපාර්තමේන්තුව)		
ඩබ්ලිව්.එම්. අනුරාධ විජේකෝන්	-	*සාමාජික*
(අතිරේක ලේකම්, රජයේ නොවන උසස් අධ්‍යාපන අංශය, උසස් අධ්‍යාපන හා මහාමාර්ග අමාත්‍යංශය)		*(2016 අගෝ. සිට සැප්. දක්වා)*
වී.සි.ඩී.පී.පෙරේරා මිය	-	*ආයතන සභා ලේකම්*
(අධ්‍යක්ෂ, බාහිර සම්පත් කළමනාකරණ ඒකකය, ජා.අ.ආ)		

2.2 ශාස්ත්‍රීය කටයුතු මණ්ඩලය - 2016

ආයතන සභාවට අමතර ව ආයතනයේ සියලු ම ශාස්ත්‍රීය කටයුතු සම්බන්ධයෙන් උපදෙස් දීමට අධ්‍යාපන, කළමනාකරණ, පරිපාලන හා වෙනත් ක්ෂේත්‍රවල ප්‍රවීණත්වයක් ඇති විද්වතුන්ගෙන් සමන්විත ශාස්ත්‍රීය කටයුතු මණ්ඩලයක් පත් වන අතර, එමගින් ආයතනයේ පහත දැක්වෙන ශාස්ත්‍රීය කාර්ය හා සම්බන්ධයෙන් අධ්‍යාපනික නායකත්වය, සුපරීක්ෂණය සහ උපදේශනය ලබා දෙයි.

- සියලු ම ශාස්ත්‍රීය කාර්යවල දී ආයතන සභාවට උපදෙස් සැපයීම;
- ශාස්ත්‍රීය කටයුතු සම්බන්ධ ව ආයතන සභාව විසින් පවරන ලද කටයුතු සම්බන්ධයෙන් කරුණු සමාලෝචනය කොට වාර්තා කිරීම;
- ආයතනය විසින් පවත්වනු ලබන අධ්‍යයන පාඨමාලා, පුහුණු වැඩසටහන් සහ විභාග පිළිබඳ නිර්දේශ ආයතන සභාවට ඉදිරිපත් කිරීම;
- ආයතනය විසින් පවත්වනු ලබන අධ්‍යාපන පාඨමාලා, පුහුණු වැඩසටහන් හා විභාග සඳහා සිසුන් බඳවා ගැනීම පිළිබඳ නිර්දේශ ආයතන සභාවට ඉදිරිපත් කිරීම;
- ආයතනය විසින් පවත්වනු ලබන පාඨමාලා, පුහුණු වැඩසටහන් හෝ විභාග වලට අදාළ නීති රීති සම්පාදනය කිරීම හා ඒවා ආයතන සභාවට ඉදිරිපත් කිරීම;
- ආයතනය විසින් පවත්වනු ලබන විභාගවල දී විභාග පරීක්ෂකවරුන් වශයෙන් පත් කිරීමට සුදුසු අයගේ නම් ආයතන සභාවට නිර්දේශ කිරීම;

- ආයතන සභාව මඟින් අනුමත කොන්දේසි සම්පූර්ණ කරන ලද පුද්ගලයන් සඳහා ශිෂ්‍යත්ව, පදක්කම් සහ ත්‍යාග ප්‍රදානය කිරීම හා
- ආයතන සභාවේ අනුමැතිය ඇතිව විවිධ කමිටු සඳහා ශාස්ත්‍රීය කටයුතු මණ්ඩලයට ඇතුළත් වන අය මෙන්ම ඉන් පරිබාහිර පුද්ගලයන් පත් කිරීම;

2016 වසරේ ශාස්ත්‍රීය කටයුතු මණ්ඩලය සමන්විත වූයේ පහත දැක්වෙන විද්වතුන්ගෙනි.

ආචාර්ය එම්.ඒ. උපාලි මාම්පිටිය මහතා - සභාපති
(ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය, ගණිත දෙපාර්තමේන්තුව, කැලණිය විශ්ව විද්‍යාලය)

මහාචාර්ය ගුණපාල නානායක්කාර මහතා - සාමාජික (2016.03.14 දක්වා)
(අධ්‍යක්ෂ ජනරාල්, ජාතික අධ්‍යාපන ආයතනය)

ආචාර්ය ටී.ඒ.ආර්.ජේ. ගුණසේකර මිය - සාමාජික (2016.03.16 සිට)
(අධ්‍යක්ෂ ජනරාල්, ජාතික අධ්‍යාපන ආයතනය)

මහාචාර්ය ආර්. අරංගල මහතා - සාමාජික
(සිංහල භාෂා දෙපාර්තමේන්තුව, ජයවර්ධනපුර විශ්ව විද්‍යාලය)

එල්.එම්.ඩී. ධර්මසේන මහතා - සාමාජික (2016 ජුනි දක්වා)
(විද්‍යා පීඨ කොමසාරිස්, අධ්‍යාපන අමාත්‍යංශය)

තිස්ස හේවාවිතාරණ මහතා - සාමාජික (2016 ජුනි දක්වා)
(කොමසාරිස් ජනරාල්, අධ්‍යාපන ප්‍රකාශන දෙපාර්තමේන්තුව)

කේ.එම්.එච්.බණ්ඩාර මහතා - සාමාජික (2016 ජුලි සිට)
(ප්‍රධාන කොමසාරිස්, ගුරු අධ්‍යාපන, අධ්‍යාපන අමාත්‍යංශය)

ඊ.කේ. ගණිහිගම මහතා - සාමාජික
(සමාජ විද්‍යා දෙපාර්තමේන්තුව, ශ්‍රී ජයවර්ධනපුර විශ්ව විද්‍යාලය)

ආචාර්ය ආර්. යූ. හල්වතුර මහතා - සාමාජික
(සිවිල් ඉංජිනේරු දෙපාර්තමේන්තුව, මොරටුව විශ්ව විද්‍යාලය)

ආචාර්ය එම්.ටී.එම්. මහීස් මහතා - සාමාජික
(ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය, සමාජ විද්‍යා දෙපාර්තමේන්තුව, කොළඹ විශ්ව විද්‍යාලය)

ආචාර්ය මහීම් මෙන්ඩිස් මහතා - සාමාජික
(ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය, සමාජ විද්‍යා දෙපාර්තමේන්තුව විවෘත විශ්ව විද්‍යාලය)

වී. මුතුකුමාරස්වාමි මහතා - සාමාජික
(හිටපු විදුහල්පති, හින්දු විද්‍යාලය කොළඹ 04)
ඩබ්ලිව්.එම්.එන්.ජේ. පුෂ්ප කුමාර මහතා - සාමාජික
(විභාග කොමසාරිස් ජනරාල්, විභාග දෙපර්තමේන්තුව)
ආචාර්ය ප්‍රසාද් විමලරත්න මහතා - සාමාජික
(ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය, පරිගණක පාසල, කොළඹ විශ්ව විද්‍යාලය)
ආචාර්ය ප්‍රියන්ත ප්‍රේමකුමාර - සාමාජික
(ලේකම්, විශ්ව විද්‍යාල ප්‍රතිපාදන කොමිසම් සභාව)
අයි.එම්.කේ.බී. ඉලංගසිංහ මහතා - සාමාජික (2016.12.05 සිට)
(කොමසාරිස්, අධ්‍යාපන ප්‍රකාශන දෙපාර්තමේන්තුව,
අධ්‍යාපන අමාතංශය)
පූජ්‍ය ආචාර්ය මාඹුල්ගොඩ සුමනරතන ස්වාමීන් වහන්සේ - සාමාජික
(නියෝජ්‍ය අධ්‍යක්ෂ ජනරාල්, භාෂා, මානව ශාස්ත්‍ර හා සමාජ
විද්‍යා පීඨය, ජා.අ.ආ.)
එස්.එෆ්.ඒස්.පී. ජයවර්ධන මහතා - සාමාජික
(නියෝජ්‍ය අධ්‍යක්ෂ ජනරාල්, විද්‍යා හා තාක්ෂණ පීඨය, ජා.අ.ආ)
එන්.වී.ඒ.එස්. සමරසිංහ මහතා - සාමාජික
(වැඩ බලන, නියෝජ්‍ය අධ්‍යක්ෂ ජනරාල්,
විකල්ප අධ්‍යාපන හා ගුරු අධ්‍යාපන පීඨය, ජා.අ.ආ.)
වී.සී.ඩී.පී. පෙරේරා මිය - ශාස්ත්‍රීය කටයුතු
(අධ්‍යක්ෂ, බාහිර සම්පත් කළමනාකරණ ඒකකය, ජා.අ.ආ) මණ්ඩල ලේකම් (2016 ජනවාරි දක්වා)
ජී.එච්. අශෝකා මිය - ශාස්ත්‍රීය කටයුතු
මණ්ඩල ලේකම් (2016 ජනවාරි සිට)

අධ්‍යයන සභාවේ සහ ශාස්ත්‍රීය කටයුතු මණ්ඩලයේ උපදේශනය හා අධීක්ෂණය යටතේ ජාතික අධ්‍යාපන ආයතනය පැවරුණු කටයුතු පහත සඳහන් සංවිධාන ව්‍යුහය යටතේ ක්‍රියාත්මක කරන ලදි.

2.3 අධ්‍යක්ෂ ජනරාල් කාර්යාලය

අධ්‍යක්ෂ ජනරාල් ලේකම් කාර්යාලය, විභාග දෙපාර්තමේන්තුව, බාහිර සම්පත් කළමනාකරණ ඒකකය හා අභ්‍යන්තර විගණන අංශය අධ්‍යක්ෂ ජනරාල්වරයාගේ ඍජු අධීක්ෂණය යටතේ ක්‍රියාත්මක වේ. අධ්‍යක්ෂ ජනරාල් ලේකම් කාර්යාලය මගින් 2016 වසරේ දී ආයතන සභා රැස්වීම් 07ක් ශාස්ත්‍රීය කටයුතු මණ්ඩල රැස්වීම් 14ක් පවත්වා තිබේ.

2016 වසරේ දී ද ආයතනයේ අභ්‍යන්තර පරිපාලන ව්‍යුහය ශක්තිමත් කිරීම සඳහා අභ්‍යන්තර විගණන අංශය මගින් කාර්යක්ෂම විගණන සේවාවක් පවත්වා ගෙන යන ලදී. අභ්‍යන්තර විගණන

අංශය විසින් 2016 විගණන සැලැස්ම සහ රු. 50,000 ට වැඩි වැඩමුළු ඇස්තමේන්ත 974ක ගෙවීම් පරික්ෂා කරන ලදී.

ආයතන නිලධාරීන්ගේ වෘත්තීය සංවර්ධනය සඳහා ඉවහල් වන විවිධ පාඨමාලා සඳහා ආයතනයේ කාර්ය මණ්ඩලයට අවස්ථා සලසා දීම බාහිර සබදතා ඒකකයේ ප්‍රධාන වගකීම වේ. බාහිර සබඳතා ඒකකය මගින් 2016 වර්ෂය තුළ දී පහත සදහන් කාර්ය ඉටු කරන ලදී.

- බාහිර සම්පත් කළමනාකරණ ඒකකය මගින් විදේශ සම්පත් දෙපාර්තමේන්තුවේ සහාය ඇතිව, 2016 ජනවාරි - දෙසැම්බර් කාලය තුළ ආයතනයේ නිලධාරීන් 32 දෙනෙකු සඳහා විදේශ වැඩමුළු හා සම්මන්ත්‍රණ සඳහා සහභාගීවීමට අවස්ථා සම්පාදනය කිරීම.
- ජාතික අධ්‍යාපන ආයතනය සහ මැලේසියාවේ මලයා විශ්ව විද්‍යාලය අතර අත්සන් කළ අවබෝධතා ගිවිසුම අනුව ආයතනයේ නිලධාරින් 03 දෙනෙකු සඳහා පශ්වාත් උපාධි පාඨමාලාවක් හැදෑරීම සඳහා අවස්ථාව ලබා දීම.
- ලෝක බැංකුවේ සහ ආසියානු සංවර්ධන බැංකුවේ මූල්‍ය අනුග්‍රහය මත අධ්‍යයන කාර්ය මණ්ඩලයේ නිලධාරින් 11 දෙනෙකු සඳහා මැලේසියාවේ Science & Management විශ්වවිද්‍යාලයෙහි ආචාර්ය උපාධි හැදෑරීමට අවස්ථාව ලබාදීම.

2.4 පීඨ / අංශ

2016 වර්ෂයෙහි ආයතනයේ සංවිධාන ව්‍යුහය පහත සදහන් එක් එක් පීඨ සහ අංශ යටතේ ක්‍රියාත්මක විය.

2.4.1 භාෂා, මානව ශාස්ත්‍ර හා සමාජ විද්‍යා පීඨය

මුල් ළමාවිය සංවර්ධන හා ප්‍රාථමික අධ්‍යාපන දෙපාර්තමේන්තුව
සිංහල භාෂා දෙපාර්තමේන්තුව
දෙමළ භාෂා දෙපාර්තමේන්තුව
ඉංග්‍රීසි භාෂා දෙපාර්තමේන්තුව
සෞන්දර්ය අධ්‍යාපන දෙපාර්තමේන්තුව
ආගම් හා සාරධර්ම දෙපාර්තමේන්තුව
සමාජ විද්‍යා දෙපාර්තමේන්තුව

2.4.2 විද්‍යා හා තාක්ෂණ පීඨය

විද්‍යා දෙපාර්තමේන්තුව
ගණිත දෙපාර්තමේන්තුව
තාක්ෂණික අධ්‍යාපන දෙපාර්තමේන්තුව
වාණිජ දෙපාර්තමේන්තුව
තොරතුරු තාක්ෂණ දෙපාර්තමේන්තුව
සෞඛ්‍ය හා ශාරීරික අධ්‍යාපන ඒකකය
මුද්‍රණ හා ප්‍රකාශන දෙපාර්තමේන්තුව

2.4.3 පර්යේෂණ හා සැලසුම් පීඨය

සැලසුම් හා ඇගයීම් දෙපාර්තමේන්තුව

පර්යේෂණ හා සංවර්ධන දෙපාර්තමේන්තුව

2.4.4 අධ්‍යාපන නායකත්ව සංවර්ධන හා කළමනාකරණ පීඨය

වෘත්තීය සංවර්ධන සහ අධ්‍යාපන කළමනාකරණ දෙපාර්තමේන්තුව

අධ්‍යාපන පරිපාලන හා සංවර්ධන දෙපාර්තමේන්තුව

විදේශීය පාඨමාලා ඒකකය

2.4.5 විකල්ප අධ්‍යාපන හා ගුරු අධ්‍යාපන පීඨය

අන්තර්කරණ අධ්‍යාපන දෙපාර්තමේන්තුව

සම්භාව්‍ය, විදේශීය භාෂා හා ද්විභාෂා අධ්‍යාපන දෙපාර්තමේන්තුව

විද්‍යුත් ප්‍රචාරණ දෙපාර්තමේන්තුව

මාර්ගෝපදේශන හා උපදේශන ඒකකය

විවෘත පාසල් ඒකකය

ගුරු අධ්‍යාපන දෙපාර්තමේන්තුව

ආයතනික සංවර්ධන දෙපාර්තමේන්තුව

2.4.6 පරිපාලන, මූල්‍ය හා සහාය සේවා අංශය

පරිපාලන හා මානව සම්පත් දෙපාර්තමේන්තුව

මුදල් දෙපාර්තමේන්තුව

ඉංජිනේරු හා නඩත්තු සේවා දෙපාර්තමේන්තුව

පුස්තකාල හා කෞතුකාගාර දෙපාර්තමේන්තුව

ප්‍රවාහන ඒකකය

2016 වර්ෂයේ ක්‍රියාත්මක කරන ලද විශේෂ කාර්ය

- වසර 13ක අනිවාර්ය අධ්‍යාපන අවස්ථා ලබා දීමේ වැඩසටහන යටතේ නව වෘත්තීය විෂයය 26ක් සහ පොදු තේමා 7ක් සඳහා විෂය නිර්දේශ සකස් කර පාසල් පද්ධතියේ ද්විතීයික ශ්‍රේණි වලට අදාළ මූලික වෙනස්කම් තුළින් අධ්‍යාපනයේ ගුණාත්මකභාවය හා අදාළත්වය ඉහළ නැංවීම.
- රාජ්‍ය ආයතන වලට බලපාන හා ආයතනික ප්‍රතිඵල රාමුව (ORF) සකස් කිරීම.
- ආයතනය ආරම්භ කර තිස් අවුරුද්දක් සම්පූර්ණ විම නිමිති කොට ගෙන ජාතික අධ්‍යාපන දිනය 2016 දෙසැම්බර් 31 වන දින පැවැත්වීම.

- ඉහත සඳහන් කරුණු වලට අමතරව ජාතික අධ්‍යාපන ආයතනයේ මුදල්, පරිපාලනය, සේවක සුභසාධනය සහ යටිතල පහසුකම් දියුණු කිරීමට පහත සඳහන් විශේෂ ව්‍යාපෘති ආරම්භ කරන ලදී.
- වසර 10කට ආසන්න කාලයක් පුරා ආයතනයේ පැවති කාර්යමණ්ඩල හිගය විශේෂයෙන් අධ්‍යයන කාර්යමණ්ඩලයේ පුරප්පාඩු පිරවීම සඳහා අවශ්‍ය පියවර ගැනීම.
- අධ්‍යයන හා අනධ්‍යයන කාර්යමණ්ඩලයේ සියලු දෙනාට තම තමන්ගේ ක්ෂේත්‍රවලට අදාළ ව විවිධ පාඨමාලා හැදෑරීම සඳහා ප්‍රතිපාදන ලබා දීමට පියවර ගැනීම සහ ඒ සඳහා නියමාවලියක් සකස් කිරීම.
- ආයතනය විසින් ක්‍රියාත්මක කරනු ලබන සමූහ රක්ෂණ වැඩසටහන යටතේ ලබාදෙනු ලබන රක්ෂණ ආවරණ අවස්ථා හා ප්‍රතිලාභ වැඩි කිරීම.
- ආයතනයේ කාර්යමණ්ඩලය සඳහා පිරිසිදු පානීය ජලය ලබා දිමේ ගැටලුව නිරාකරණය කිරීම සඳහා ආයතනයේ සෑම අංශයක් සඳහා ම ජල පවිත්‍රකාරක ලබා දීම.
- ආයතනයේ ඒ ඒ දෙපාර්තමේන්තු සහ අංශවලට පැවරී ඇති ශාස්ත්‍රීය කටයුතු ඉටු කිරීමේ දී දැඩිව බලපෑ කාර්යාලීය උපකරණ හිගය පියවීම සඳහා ප්‍රමාණවත් උපකරණ මිල දී ගෙන ඒ ඒ අංශ සඳහා ලබා දීමට කටයුතු කිරීම.
- කාර්යමණ්ඩලයේ ස්වයං සංවර්ධන සැලසුම් ලබාගෙන ඒ අනුව ආයතනයේ කාර්ය මණ්ඩල සංවර්ධන සැලැස්ම සකස් කිරීම සහ එය ක්‍රියාත්මක කිරීම සඳහා මූලික පියවර ඉටු කිරීම.
- ගණනය කිරීමේ දී සිදු වූ විචලනයක් නිසා වසර දහයකට අධික කාලයක් ගෙවීම් ප්‍රමාද වී පැවති සේවක භාරකාර අරමුදල, සේවක අර්ථසාධක දායකත්ව දීමනා ගෙවීම සහ පාරිතෝෂික දායකත්ව දීමනා ගෙවීමේ ගැටළුව නිරාකරණය කර අදාළ මුදල් නියමිත පරිදි ගෙවීමේ කටයුතු ආරම්භ කිරීම.
- ආයතනයේ කාර්ය සඳහා ශාස්ත්‍රීය දායකත්වය ලබා ගන්නා සම්පත් පුද්ගලයන් සඳහා ගෙවනු ලබන දීමනා ආකර්ෂණීය මට්ටමක නොතිබුණු බැවින් පැවති ගෙවීම් චක්‍රලේඛය සංශෝධනය කර අදාළ අංශවල අනුමැතිය ලබා ගැනීමට කටයුතු කිරීම.
- ආයතනය විසින් විවිධ විෂය ක්ෂේත්‍ර යටතේ ඉටුකරනු ලබන කාර්ය සඳහා දිවයින පුරා සිටින විද්වතුන්ගේ දායකත්වය ලබා ගැනීමට හැකිවන පරිදි ඒ ඒ පීඨ යටතේ සම්පත් පුද්ගල ලේඛන සකස්කොට ඔවුන්ගේ දායකත්වය අවස්ථානුකූලව ලබා ගැනීමට කටයුතු කිරීම.
- ආයතනයේ ගිණුම් කටයුතු සහ පද්ධති පාලන කටයුතු විධිමත්ව සහ නිවැරදිව පවත්වාගෙන යාම සඳහා අවශ්‍ය දැනුම්වත්භාවය ආයතනයේ නිලධාරින්හට ලබා දීම සඳහා විගණකාධිපති දෙපාර්තමේන්තුවේ සහයෝගය ලබාගෙන සම්මන්ත්‍රණයක් පැවැත්වීම.

විෂයමාලා සංවර්ධනය වෘත්තීය සංවර්ධනය, හා අධ්‍යාපන පර්යේෂණ යන ක්ෂේත්‍ර යටතේ ආයතනයට පැවරී ඇති ප්‍රමුඛ කාර්ය හා සම්බන්ධව 2016 වාර්ෂික සැලැස්මට ඇතුළත් කාර්ය හා සෘජුව සම්බන්ධ වූ මෙන්ම සෘජුව සම්බධව නොවූ පහත සඳහන් විශේෂ කාර්ය ජාතික අධ්‍යාපන ආයතනය විසින් 2016 වර්ෂයේ දී ක්‍රියාත්මක කරන ලදී.

3.0 විෂයමාලා සංවර්ධනය

ජාතික අධ්‍යාපන ආයතනයේ විෂයමාලා සංවර්ධන කටයුතු ඉටු කරනු ලබන්නේ භාෂා, මානව ශාස්ත්‍ර හා සමාජ විද්‍යා පීඨය සහ විද්‍යා හා තාක්ෂණ යන පීඨ මගිනි.
විෂයමාලා සම්පාදනය සඳහා ආයතනයට පැවරී ඇති බලතල යටතේ භාෂා, මානව ශාස්ත්‍ර හා සමාජ විද්‍යා පීඨයට අයත් දෙපර්තමේන්තු 7ක්, තාක්ෂණ පීඨයට අයත් දෙපාර්තමේන්තු 5ක් හා විකල්ප අධ්‍යාපන හා ගුරු අධ්‍යාපන පීඨයට අයත් සම්භාව්‍ය, විදේශ භාෂා හා ද්විභාෂා අධ්‍යාපන දෙපාර්තමේන්තුව ද ඇතුළත්ව 2016 වර්ෂයේ දී විෂයමාලා සංවර්ධනය හා සම්බන්ධ ව්‍යාපෘති පනස් පහක් ක්‍රියාත්මක කරන ලදී. විෂයමාලා සංවර්ධන කාර්ය තුළින් පහත සඳහන් ප්‍රධාන අරමුණු ඉටුකර ගැනීමට අපේක්ෂා කළ අතර, යම් යම් බාධක මධ්‍යයේ වුව ද එම අපේක්ෂා වැඩි ප්‍රමාණයක් ලඟකාර ගැනීමට ජාතික අධ්‍යාපන ආයතනය සමත් වී ඇත.

- සමාජ, සංස්කෘතික, ආර්ථික සහ තාක්ෂණික අවශ්‍යතාවලට ගැළපෙන පරිදි විෂයමාලා සැලසුම් කිරීම, සංවර්ධනය කිරීම, පුනරීක්ෂණ සහ සංශෝධන කටයුතු කිරීම.
- විෂයමාලා නවීකරණ හා සමඟ ම අර්ථවත් ප්‍රායෝගික ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රියාවලියක් සඳහා වන නව විධික්‍රම පාසල් පද්ධතියට හඳුන්වා දීම.
- විෂයමාලා සංවර්ධනය හා ක්‍රියාත්මක කිරීමේ කාර්යවල නියුක්ත පිරිස්වල වෘත්තීය නිපුණතා වැඩි දියුණු කිරීම.
- විෂයමාලා සංවර්ධනය හා ක්‍රියාත්මක කිරීම යන ක්ෂේත්‍රවල තොරතුරු අනාවරණය කර ගැනීම සඳහාත් අධ්‍යාපනයේ ගුණාත්මක ප්‍රවර්ධනය සඳහාත් ඉවහල් වන පර්යේෂණ අධ්‍යයන ක්‍රියාත්මක කිරීම.
- ඉගෙනුම් - ඉගැන්වීම් ක්‍රියාවලියේ හා ඇගයීම් ක්‍රියාමාර්ගවල සාර්ථකත්වය සඳහා නව විධික්‍රම හඳුන්වා දීම.
- ශිෂ්‍යයන්ගේ සන්නිවේදන, තොරතුරු තාක්ෂණ නිපුණතා සහ ජාතික හා ජාත්‍යන්තර භාෂා නිපුණතා සංවර්ධනය කිරීම.
- සංස්කෘතික හා ස්වාභාවික උරුමය රැක ගැනීමේ සහ ආරක්ෂා කර ගැනීමේ නිපුණතා සිසුන් තුළ ඇති කිරීම.
- සමාජයේ ජීවත් වන විවිධ ජන කණ්ඩායම්වලට ආවේණික ආගමික, සංස්කෘතික හා භාෂාමය වශයෙන් පවත්නා විවිධත්වය අගය කිරීමටත් ශ්‍රී ලාංකිකයන් ලෙස සැම දෙනාට ම එක් ව සිටීමටත් අවශ්‍ය නිපුණතා සංවර්ධනය කිරීම.

වගුව 4 : 2012 2020 විෂයමාලා චක්‍රය සඳහා වන විෂයමාලා ක්‍රියාත්මක කිරීමේ සැලැස්ම

කාර්යය	2012	2013	2014	2015	2016	2017	2018	2019	2020
විෂයමාලා ව්‍යාප්ති සටහන් සැකසීම (Grid)	1-5 6-11 ශ්‍රේණි								
විෂය නිර්දේශ සකස් කිරීම	6,10 ශ්‍රේණි	1,7,11 ශ්‍රේණි	2,8 ශ්‍රේණි	3,9,12 හා 13 ශ්‍රේණි	4 ශ්‍රේණි	5 ශ්‍රේණි			
ගුරු අත්පොත් සැකසීම		6,10 ශ්‍රේණි	1,7,11 ශ්‍රේණි	2,8,12 ශ්‍රේණි	3,9,13 ශ්‍රේණි	4 ශ්‍රේණි	5 ශ්‍රේණි		
දැනුවත් කිරීමේ වැඩ සටහන් ක්‍රියාත්මක කිරීම			6,10 ශ්‍රේණි	1,7,11 ශ්‍රේණි	2,8,12 ශ්‍රේණි	3,9,13 ශ්‍රේණි	4 ශ්‍රේණි	5 ශ්‍රේණි	
විෂයමාලාව ක්‍රියාත්මක කිරීම				6,10 ශ්‍රේණි	1,7,11 ශ්‍රේණි	2,8,12 ශ්‍රේණි	3,9,13 ශ්‍රේණි	4 ශ්‍රේණි	5 ශ්‍රේණි

විෂයමාලා සංවර්ධනය වෙනුවෙන් 2016 වර්ෂයේ දී නිම කළ විෂයමාලා කාර්ය පහත දැක්වේ.

- ප්‍රාථමික අධ්‍යාපන ක්ෂේත්‍රයේ 4වන ශ්‍රේණියට අදාළ විෂය නිර්දේශ 09ක්, 2වන ශ්‍රේණියට අදාළ ගුරු අත්පොත් 12ක් සහ 3වැනි ශ්‍රේණියේ ගුරු අත්පොත් 12ක් පන්ති කාමරය තුළ අත්හදා බලා වැඩි දියුණු කිරීම.
- ප්‍රාථමික අධ්‍යාපනයේ පළමු ප්‍රධාන අවධියට (Key Stage 1) අදාළ අත්‍යවශ්‍ය ඉගෙනුම් නිපුණතා සඳහා මාර්ගෝපදේශ ග්‍රන්ථයක් සකස් කිරීම සහ අත්‍යවශ්‍ය ඉගෙනුම් නිපුණතා ඇගයීම් කාර්යයෙහි ගුණාත්මක භාවය වැඩි දියුණු කිරීමට පළාත් ප්‍රාථමික අධ්‍යාපන කණ්ඩායම් සාමාජිකයන් 650 දෙනෙකු සඳහා දැනුවත් කිරීමේ වැඩ සටහන් පැවැත්වීම.
- පූර්ව ළමා සංවර්ධන අධ්‍යාපනය සඳහා ප්‍රමිති පාදක කරගත් විෂයමාලා රාමුවක් සකස් කිරීම සහ පූර්ව ළමාවිය සංවර්ධනය පිළිබඳ උපාධි පාඨමාලාවක් ආරම්භ කිරීමට මූලික වැඩ කටයුතු සිදු කිරීම.
- ප්‍රාථමික අධ්‍යාපනයේ අවුරුදු 9ට අයත් සංවර්ධන ප්‍රමිතින් හඳුනා ගැනීමට පර්යේෂණ වාර්තාවක් සකස් කිරීම.
- 1වන ශ්‍රේණියට අදාළ ප්‍රතිපෝෂන යාන්ත්‍රණයක් වැඩි දියුණු කිරීම පිළිබඳ වාර්තාවක් සකස් කිරීම.
- සමාජ ඒකාබද්ධතාව, ව්‍යසන අවධානම අවම කිරීම, කාලගුණය වෙනස් වීම යන තේමා ප්‍රාථමික අධ්‍යාපනය තුළ ශක්තිමත් කිරීම සඳහා කතා පොතක් සකස් කිරීම.

- ද්විතීයික අධ්‍යාපනයේ ඉගෙනුම් ඉගැන්වීම ක්‍රියාවලිය වැඩිදියුණු කිරීම සඳහා 9 ශ්‍රේණියට අදාළ ගුරු අත්පොත් 16ක්, 13වන ශ්‍රේණිය සඳහා ගුරු අත්පොත් 13ක් සහ 12වන ශ්‍රේණිය සඳහා ගුරු අත්පොත් 11ක් සකස් කිරීම.
- 6 ශ්‍රේණියේ සිට 13 ශ්‍රේණිය දක්වා අදාළ අතිරේක විෂයමාලා ද්‍රව්‍ය වල පළමු පිටපත් 42ක් සැකසීම.
- 6 සිට 13 ශ්‍රේණිවලට අදාළ ඉගෙනුම් ඉගැන්වීම් වැඩිදියුණු කිරීමට පරිගණක මෘදුකාංග 38ක් සැකසීම.
- පරිගණක තොරතුරු තාක්ෂණ ශබ්ද මාලාව යාවත්කාලීන කිරීම.
- අ.පො.ස. (සා/පෙළ) ගණිතය විෂය සමත්වීමේ ප්‍රතිශතය වැඩි කිරීමේ අරමුණ පෙරදැරිව ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රියාවලිය ශක්තිමත් කිරීමට 9,10 හා 11 ශ්‍රේණි සඳහා උපකාර වන ප්‍රශ්න පත්‍ර අයිතම බැංකුවක් සහ 9 ශ්‍රේණි සඳහා වැඩ පොතක් සකස් කිරීම.
- විද්‍යා විෂය ක්ෂේත්‍රය යටතේ නිර්මාණය වී ඇති වෘත්තීය අවස්ථා පිළිබඳ නාමාවලියක් සකස් කිරීම.
- විෂය ක්ෂේත්‍ර 6කට අදාළ රැකියා ඉන්වෙන්ට්‍රියක් පාසල් පද්ධතියට ලබා දීම සඳහා සකස් කිරීම.
- ද්විභාෂා අධ්‍යාපනය ප්‍රචලිත කිරීම සඳහා පුහුණුකරුවන්ට අත්පොතක් හා විෂය සන්ධාරය (scoping document) පිළිබඳ ලියවිල්ලක අවසාන පිටපත සකස් කිරීම.
- ජාතික අධ්‍යාපන විද්‍යාපීඨවල ද්විභාෂා අධ්‍යාපනය පිළිබඳ පර්යේෂණ අධ්‍යයනයේ අවසන් වාර්තාව සකස් කිරීම.
- පළාත් නිලධාරින් 290 දෙනෙකු ද්විභාෂා අධ්‍යාපනය පිළිබඳ දැනුවත් කිරීම.
- ගුරුවරුන් 228 දෙනෙකු ද්විභාෂා අධ්‍යාපනය පිළිබඳ පුහුණු කිරීම.

යථාවත් කරන ලද විෂයමාලාව පිළිබඳව විෂය අධ්‍යක්ෂවරුන්, විදුහල්පතිවරුන්, ගුරු උපදේශකවරුන් හා ගුරුවරුන් දැනුවත් කිරීමේ වැඩසටහන 2016

නව විෂය නිර්දේශවලට දිශානුගත කිරීම හා දැනුවත් කිරීමේ වැඩ සටහන් පැවැත්වීමේ දී 1-11 ශ්‍රේණි සඳහා ගුරු උපදේශකවරුන් හා විෂය අධ්‍යක්ෂවරුන්ට ද 12-13 ශ්‍රේණිවල දී සෘජුවම උසස් පෙළ ගුරුවරුන්ට ද ජාතික අධ්‍යාපන ආයතනය විසින් පුහුණු අවස්ථා ලබා දෙයි. අනතුරුව ජාතික අධ්‍යාපන ආයතනයේ පුහුණුව ලබාගන්නා ගුරු උපදේශකවරුන් / විෂය අධ්‍යක්ෂවරුන් විසින් පළාත් මට්ටමින් ගුරු පුහුණු සැසි ක්‍රියාත්මක කෙරේ.

මේ අනුව 2016 වසරේ ගුරු උපදේශකවරුන් හා විෂය අධ්‍යක්ෂවරුන් 7,200 දෙනෙකු සහ උසස් පෙළ ගුරුවරුන් 12,280 දෙනෙකු පුහුණු කර ඇත.

4.0 අධ්‍යාපන නායකත්ව සංවර්ධනය හා වෘත්තීය සංවර්ධන අවස්ථා වැඩිදියුණු කිරීම

අධ්‍යාපන ක්ෂේත්‍රයේ නියැළි පුද්ගලයන්ගේ වෘත්තීය සංවර්ධනය වැඩිදියුණු කිරීම මීපේ පිහිටුවා ඇති අධ්‍යාපන නායකත්ව සංවර්ධන හා කළමනාකරණ පීඨයට පැවරී ඇති ප්‍රධාන කාර්යයයි. යථෝක්ත කාර්යය සාක්ෂාත් කර ගැනීම සඳහා අධ්‍යාපන කළමනාකරණය සහ පාසල් පරිපාලනය යටතේ අධ්‍යාපන විද්‍යාපති කළමනාකරණ පශ්චාත් උපාධි පාඨමාලාවේ සිට අධ්‍යාපන කළමනාකරණ ඩිප්ලෝමා පාඨමාලාව දක්වා පරාසයක පැතිරුණු පාඨමාලා රැසක් ජාතික අධ්‍යාපන ආයතනයේ මීපේ පරිශ්‍රයෙහි දී ක්‍රියාත්මක කරන ලදී.

ඊට අමතරව, පද්ධතියෙහි සිටින අධ්‍යාපන පරිපාලන සේවයට අයත් නිලධාරීන් සඳහා කෙටිකාලීන පුහුණු පාඨමාලා සහ අධ්‍යාපන පරිපාලන සේවයට බඳවාගත් නවක නිලධාරීන් සඳහා විශේෂ වශයෙන් සකස් කළ දිගුකාලීන ප්‍රේරණ පාඨමාලා ක්‍රියාත්මක කිරීම ද ජාතික අධ්‍යාපන ආයතනය විසින් සිදු කරනු ලැබේ.

අධ්‍යාපන කළමනාකරණය හා සම්බන්ධ තෝරාගත් සුවිශේෂි තේමා පාදක ගනිමින් ඒ පිළිබඳ පූර්ණ අවබෝධයක් ලබාදීම සඳහාත්, අධ්‍යාපන කළමනාකරණය සඳහා තොරතුරු තාක්ෂණය යොදාගැනීම පිළිබඳ තේමා පාඨමාලා ක්‍රියාත්මක කිරීමද අධ්‍යාපන නායකත්ව සංවර්ධන පීඨය යටතේ සිදුවන අතර, ඒ හා සම්බන්ධ පාඨමාලා රැසක් 2016 වසර තුළ දී ක්‍රියාත්මක කරන ලදී. ද්විතීයික පාසල් දහසක් සංවර්ධනය කිරීමේ වැඩ සටහන යටතේ එම පාසල්වල විදුහල්පතිරුන් සහ නියෝජ්‍ය විදුහල්පතිවරුන් පුහුණුකිරීමේ වැඩ සටහන ක්‍රියාත්මක කිරීම සඳහා 2016 වසරේ දී ප්‍රමුඛතාව දුන් අතර, පහත සඳහන් වගුව අධ්‍යාපන කළමනාකරණ සංවර්ධන පීඨය 2016 වසරේ දී පවත්වන ලද පාඨමාලා පිළිබඳ තොරතුරු ගෙනහැර දක්වයි.

වගුව 5 : වෘත්තීය සංවර්ධන පාඨමාලා පිළිබඳ විස්තර 2016

පාඨමාලාව	වගකීම දරන දෙපාර්තමේන්තුව	පාඨමාලාව පැවැත්වෙන ස්ථානය	සහභාගී වූ සංඛ්‍යාව
පශ්චාත් උපාධි පාඨමාලා අධ්‍යාපන කළමනාකරණ විද්‍යාපති පශ්චාත් උපාධි පාඨමාලාව	වෘත්තීය සංවර්ධන සහ අධ්‍යාපන කළමනාකරණ	මීපේ	73
පශ්චාත් උපාධි ඩිප්ලෝමා පාඨමාලා පශ්චාත් උපාධි අධ්‍යාපන කළමනාකරණ ඩිප්ලෝමා (පූර්ණකාලීන යන අර්ධකාලීන පාඨමාලාව)	වෘත්තීය සංවර්ධන සහ අධ්‍යාපන කළමනාකරණ	මීපේ	171
ඩිප්ලෝමා පාඨමාලා පාසල් කළමනාකාරණය පිළිබඳ ඩිප්ලෝමා පාඨමාලාව	අධ්‍යාපන කළමනාකරණ	මීපේ	283
කෙටිකාලීන පාඨමාලා අධ්‍යාපන කළමනාකරණය පිළිබඳ කෙටිකාලීන තේමා පාඨමාලාව	වෘත්තීය සංවර්ධන හා අධ්‍යාපන කළමනාකරණ	මීපේ	763
විදුහල්පති පාඨමාලාව	වෘත්තීය සංවර්ධන හා අධ්‍යාපන කළමනාකරණ	මීපේ	275
විදේශිය සිසුන් සඳහා වන පාඨමාලා අධ්‍යාපන කළමනාකරණය පිළිබඳ විද්‍යාපති පශ්චාත් උපාධි පාඨමාලාව	වෘත්තීය සංවර්ධන හා අධ්‍යාපන කළමනාකරණ	මීපේ	33

5.0 ගුරුවරුන් සඳහා වෘත්තීය සංවර්ධන වැඩ සටහන් ක්‍රියාත්මක කිරීම

අධ්‍යාපන පද්ධතියෙහි නියැළි වෘත්තිකයින් සඳහා ඔවුන්ගේ වෘත්තීය සංවර්ධන අවශ්‍යතා පාදක කරගනිමින් විශාල පරිමාණයෙන් විවිධ ගුරු කණ්ඩායම් සඳහා නවීකරණ හා විධි ක්‍රම හඳුන්වාදීමේ දීර්ඝකාලීන අත්දැකීම් රාශියක් ජාතික අධ්‍යාපන ආයතනය ලබා ගෙන ඇත. පද්ධතියට හඳුන්වා දෙනු ලබන විෂයමාලා සංවර්ධන හෝ වෙනත් ඕනෑම සංවර්ධනාත්මක කාර්යයක සාර්ථකත්වය රඳා පවතින්නේ ඒවා ක්‍රියාත්මක කරනු ලබන ගුරුවරුන් සතුව ඒ පිළිබඳව මනා අවබෝධයක් දැනුවත් බවත් ඇත්නම් පමණි. ඔවුන් ඵලදායී ක්‍රියාකාරීන් කිරීම සඳහා ඉවහල් වන අධ්‍යාපන දර්ශනපති පාඨමාලාවේ සිට සහතික පත්‍ර පාඨමාලා දක්වා පැතිරුණ පාඨමාලා රැසක් ගුරු අධ්‍යාපනය හා සම්බන්ධ දෙපාර්තමේන්තු සහ විෂයමාලා සංවර්ධන දෙපාර්තමේන්තු කීපයක් විසින් දිවයින පුරා විහිදුණු ප්‍රාදේශිය මධ්‍යස්ථාන රැසක් ද කේන්ද්‍ර කරගනිමින් ක්‍රියාත්මක කරනු ලබයි.

ජාතික අධ්‍යාපන ආයතනය විසින් ක්‍රියාත්මක කරනු ලබන පාඨමාලා ප්‍රධාන වශයෙන් නාභිගත කොට ඇත්තේ අධ්‍යාපන වෘත්තීකයින්ගේ වෘත්තීය සංවර්ධන අවශ්‍යතා ඉටුකිරීම සහ පහත සඳහන් අරමුණු ඉටුකරගත හැකි ගෞරවණීය ගුරු පිරිසක් බිහි කිරීමේ අපේක්ෂා පෙරදැරි කර ගනිමිනි.

- අධ්‍යාපනයේ නව දිශානතීන් හඳුනාගැනීමට සමත්කම් දක්වන;
- පුළුල් විෂය දැනුම සහ එය පංතිකාමරය තුළ මනා ලෙස භාවිත කිරීමට සමත්;
- ඉගැන්වීමේ සහ පංති කාමර කළමනාකරණ කුසලතා උසස් මට්ටමින් සංවර්ධනය කරගත හැකි;
- සිසුන්ගේ පෞද්ගලික විවිධතාවලට ගැලපෙන අයුරින් ඵලදායී වැඩ සැලසුම් කළ හැකි;
- දෙමව්පියන්ගේ දැනුම හා ශක්‍යතා හා හැකියා ඵලදායී ලෙස ලබාගැනීමට වැඩ සැලසුම් කළ හැකි;
- හොඳ ඉගැන්වීමක් සඳහා අවශ්‍ය පොදු නිපුණතා ගොඩනංවා ගත හැකි;
- කාර්යබද්ධ පුහුණුව සංවර්ධනය කර ගැනීමට ඉවහල්වන කුඩා පරිමාණයේ පර්යේෂණවල නියැළෙන;
- නිපුණතා පාදක කාර්යසාධනය සඳහා පුහුණුව ලබාගන්නා සහ
- ඉගැන්වීම සඳහා ස්වයං නිර්මාණී එළඹුමක් සංවර්ධනය කරගත හැකි;

පහත වගුව ජාතික අධ්‍යාපන ආයතනයේ භාෂා, මානව ශාස්ත්‍ර හා සමාජ විද්‍යා පීඨයේ විවිධ දෙපාර්තමේන්තු විසින් සහ ගුරු අධ්‍යාපන හා විකල්ප අධ්‍යාපන පීඨය විසින් 2016 වසරේ දී පවත්වන ලද පාඨමාලා සහ එහි සහභාගිත්වය පෙන්නුම් කරයි.

වගුව 6 : ගුරු අධ්‍යාපන පාඨමාලා පිළිබඳ තොරතුරු - 2016

පාඨමාලාව	වගකීම දරන දෙපාර්තමේන්තුව	පාඨමාලාව පැවැත්වෙන ස්ථානය	සහභාගී වූ සංඛ්‍යාව
පශ්චාත් උපාධි පාඨමාලා අධ්‍යාපනපති පාඨමාලාව	ගුරු අධ්‍යාපන	ජා.අ.ආ./යාපනය	265
පශ්චාත් උපාධි ඩිප්ලෝමා පාඨමාලා පශ්චාත් උපාධි අධ්‍යාපන ඩිප්ලෝමා පාඨමාලාව	ගුරු අධ්‍යාපන	ජා.අ.ආ /ප්‍රාදේශීය මධ්‍යස්ථාන 24	4160
උපාධි පාඨමාලා			
අධ්‍යාපනවේදී උපාධි පාඨමාලාව	ගුරු අධ්‍යාපන	ජා.අ.ආ/මධ්‍යස්ථාන 24	1140
අධ්‍යාපනවේදී උපාධි පාඨමාලාව (ඉංජිනේරු)	ගුරු අධ්‍යාපන	ජා.අ.ආ	263
ඩිප්ලෝමා පාඨමාලා			
දෙවන බසක් ලෙස ඉංග්‍රීසි භාෂාව ඉගැන්වීම පිළිබඳ ඩිප්ලෝමා පාඨමාලාව	ඉංග්‍රීසි	ජා.අ.ආ	14
පූර්ව ළමාවිය සංවර්ධන හා ප්‍රාථමික අධ්‍යාපන ඩිප්ලෝමා පාඨමාලාව	ප්‍රාථමික අධ්‍යාපනය	ජා.අ.ආ	36
විශේෂ අධ්‍යාපනය පිළිබඳ ඩිප්ලෝමා පාඨමාලාව	අන්තර්කරණ අධ්‍යාපන	ජා.අ.ආ.	61
සංඥා භාෂා ඩිප්ලෝමා පාඨමාලාව	අන්තර්කරණ අධ්‍යාපන	ජා.අ.ආ	20
උපදේශනය හා මාර්ගෝපදේශනය පිළිබඳ ඩිප්ලෝමා පාඨමාලාව	උපදේශන හා මාර්ගෝපදේශන ඒකකය	ජා.අ.ආ.	46
සහතික පත්‍ර පාඨමාලා බ්‍රේල් පාඨමාලාව	අන්තර්කරණ අධ්‍යාපන	ජා.අ.ආ	13

5.1 ජාතික අධ්‍යාපන විද්‍යාපීඨවල හා ගුරු විද්‍යාලවල ගුණාත්මක සංවර්ධනය

ජාතික අධ්‍යාපන විද්‍යාපීඨ හරහා පූර්ව සේවා ගුරු අධ්‍යාපන විෂයමාලා ක්‍රියාත්මක කිරීම මෙන්ම ගුරු මධ්‍යස්ථාන හරහා සේවාස්ථ ගුරු අධ්‍යාපනය සංවර්ධනය කිරීමත් ජාතික අධ්‍යාපන ආයතනයට අයත් වගකීමකි. ඒ අනුව 2016 වසරේ ජනවාරි සිට දෙසැම්බර් දක්වා කාලය තුළ පහත දැක්වෙන කාර්ය පූර්ව සේවා හා සේවාස්ථ ගුරු පුහුණුවට අදාළව ජාතික අධ්‍යාපන ආයතනය විසින් ඉටුකර ඇත.

- විද්‍යාපීඨ සඳහා හඳුන්වාදීමට යෝජිත අධ්‍යාපනවේදී පාඨමාලාව සඳහා විෂය නිර්දේශ 42න් 37ක් සම්පූර්ණ කිරීම.
- ධර්මාචාර්ය ගුරු සහායකයන් ලෙස බඳවා ගත් 386 දෙනෙකු සඳහා දිවයිනපුරා පිහිටි මධ්‍යස්ථාන 11ක් කේන්ද්‍ර කරගනිමින් ගුරු පුහුණු වැඩ සටහනක් ක්‍රියාත්මක කිරීම.
- ගුරු විද්‍යාල වල සාමාන්‍ය විෂයමාලාවේ අභ්‍යන්තර පරීක්ෂණ සඳහා සිංහල දෙමළ මාධ්‍ය වලින් ප්‍රශ්න පත්‍ර 15ක් සකස් කිරීම.

5.2 ජාතික අධ්‍යාපන ආයතනය විසින් ක්‍රියාත්මක කරනු ලබන විවිධ පාඨමාලා සඳහා විභාග පැවැත්වීම.

ජාතික අධ්‍යාපන ආයතනය විසින් පවත්වනු ලබන විවිධ පාඨමාලාවල ඇගයීම් කටයුතු මනාලෙස ඉටුකරගැනිම සඳහා කාර්යක්ෂම හා ඵලදායී විභාග ක්‍රමයක් පවත්වාගෙන යාම විභාග දෙපාර්තමේන්තුවට පැවරී ඇති ප්‍රධාන වගකීමයි. පහත සඳහන් පාඨමාලා හා සම්බන්ධ විභාග පැවැත්වීම, ඇගයීම සහ සහතික නිකුත් කිරීම 2016 වසරේ දී ඉටු කොට ඇත.

- අධ්‍යාපන කළමනාකරනය සඳහා පරිගණක තාක්ෂණය පිළිබඳ ඩිප්ලෝමාව (2014/15)
- පශ්චාත් උපාධි අධ්‍යාපන කළමනාකරණ ඩිප්ලෝමා අර්ධ කාලීන පාඨමාලා - අවසන් විභාගය (2016)
- දෙවන බසක් ලෙස ඉංග්‍රීසි ඉගැන්වීම පිළිබඳ ඩිප්ලෝමා පාඨමාලාව -2016
- පශ්චාත් උපාධි පාසල් උපදේශනය ඩිප්ලෝමා පාඨමාලාව (පුනර් පරීක්ෂණය)
- පාසල් කළමනාකරණ ඩිප්ලෝමා පාඨමාලාව (2014 / 2015)
- උපදේශනය පිළිබඳ ඩිප්ලෝමා පාඨමාලාව (2015/2016) අවසන් විභාගය
- අධ්‍යාපනවේදී (උපාධි පාඨමාලාව -11 කොටස - පුනර් පරීක්ෂණය)
- 6-11 ශ්‍රේණි සඳහා ගණිතය ඉගැන්වීම පිළිබඳ උසස් ඩිප්ලෝමා විභාගය - 2015
- අධ්‍යාපනපති උපාධි පාඨමාලාව (ප්‍රවේශ විභාගය)
- පූර්ව ළමාවිය සංවර්ධනය පිළිබඳ ඩිප්ලෝමා පාඨමාලාව (2015/2016) අවසන් විභාගය
- සංඥා භාෂා ඩිප්ලෝමා (2016) - අවසන් විභාගය

- විශේෂ අධ්‍යාපන ඩිප්ලෝමා (2016) - අවසන් විභාගය
- පශ්චාත් උපාධි අධ්‍යාපන ඩිප්ලෝමා (පුනර් පරීක්ෂණය)
- විදේශ භාෂාවක් ලෙස ජපන් භාෂාව ඉගැන්වීම් පිළිබඳ ඩිප්ලෝමා (2015/2016) - අවසන් විභාගය
- අධ්‍යාපනවේදී උපාධි පාඨමාලාව (2013/2015)- දෙවන කොටස
- පශ්චාත් උපාධි අධ්‍යාපන කළමනාකරණ ඩිප්ලෝමා (පූර්ණ කාලීන) පාඨමාලාව - 2016 (අවසන් විභාගය)
- බ්‍රේල් අධ්‍යාපනය පිළිබඳ කෙටිකාලීන සහතිකපත්‍ර පාඨමාලාව - 2016
- අතිරේක භාෂා සංවර්ධන පාඨමාලාව - 2015 (ලිවීම හා ශ්‍රවණය - පළමු මට්ටම)
- අතිරේක භාෂා සංවර්ධන පාඨමාලාව - 2015 වාචික පරීක්ෂණය)

2016 වර්ෂයේ දී පැවැත් වූ අතිරේක විභාග පහත දක්වේ.

- ශ්‍රී ලංකා විදුහල්පති සේවයේ නිලධාරීන් දිශාභිමුඛ කිරීමේ විභාගය 2016
- පශ්චාත් උපාධි අධ්‍යාපන කළමනාකරණ ඩිප්ලෝමා පාඨමාලාව (ප්‍රවේශ විභාගය)

6.0 විකල්ප අධ්‍යාපනය

විකල්ප අධ්‍යාපන පීඨය යටතේ ක්‍රියාත්මක වන අන්තර්කරණ අධ්‍යාපන, විද්‍යුත් ප්‍රචාරණ දෙපාර්තමේන්තු හා මාර්ගෝපදේශන හා උපදේශන අංශය මගින් 2016 වර්ෂය තුළ ඉටුකළ කාර්ය පහත සඳහන් වෙයි.

6.1 අන්තර්කරණ අධ්‍යාපනය

" සැමට අධ්‍යාපනය" යන සංකල්පය යථාර්ථයක් බවට පත් කර ගැනීමේ දී අන්තර්කරණ අධ්‍යාපන දෙපාර්තමේන්තුවට විශේෂ ස්ථානයක් හිමිවේ. විශේෂ අවශ්‍යතා සහිත දරුවන් සඳහා යෝග්‍ය වන පරිදි විෂයමාලාව සංවර්ධනය කිරීම, විශේෂ අධ්‍යාපන ගුරුවරුන්ට හා ගුරු උපදේශකවරුන් සඳහා අවශ්‍ය පුහුණු කටයුතු සිදුකිරීම හා අතිරේක විෂයමාලා ද්‍රව්‍ය සම්පාදනය වැනි කාර්යවල වගකීම පැවරී ඇත්තේ අන්තර්කරණ අධ්‍යාපන දෙපාර්තමේන්තුවටය. ඊට අමතරව මෙම දෙපාර්තමේන්තුව විසින් පවත්වනු ලබන විශේෂ අධ්‍යාපන ඩිප්ලෝමා, සංඥා භාෂා ඩිප්ලෝමා ආදි පාඨමාලා ඔස්සේ අන්තර්කරණ අධ්‍යාපන ක්ෂේත්‍රයේ නියැළි ගුරුවරුන්හට වෘත්තීය සංවර්ධන අවස්ථා සම්පාදනය කෙරේ. අදාළ කාලපරිච්ඡේදය තුළ උක්ත දෙපාර්තමේන්තුව විසින් ඉටුකරන ලද කාර්ය පහත සඳහන් වෙයි.

- අන්තර්කරණ අධ්‍යාපනයේ ගුණාත්මක තත්ත්වය උසස් කිරීම සඳහා අතිරේක විෂයමාලා ද්‍රව්‍ය 04ක් සම්පාදනය කිරීම: ඔටිසම් තත්ත්වය සහිත දරුවන් සහ විවිධ දුබලතා සහිත දරුවන් සඳහා බේල් ක්‍රමය ඉගැන්වීම සහ සංඥා භාෂාව (බුද්ධාගම) ඉගැන්වීම.

- භූගෝලවිද්‍යා විෂය සඳහා සංඥා භාෂා ශබ්ද කෝෂය ලිවීම ආරම්භ කිරීම.
- විශේෂ අධ්‍යාපන සඟරාව එළිදැක්වීම.
- සංඥා භාෂාව පිළිබඳ උපදේශනාත්මක සංයුක්ත තැටි දෙකක් නිෂ්පාදනය කිරීම.
- අන්තර්කරණ අධ්‍යාපන ක්ෂේත්‍ර හා සම්බන්ධ ගුරු උපදේශවරු හා ගුරුවරුන් 720 දෙනෙකු පුහුණු කිරීම.

6.2 විද්‍යුත් ප්‍රචාරණය

නොවිධිමත් අධ්‍යාපන ක්ෂේත්‍රයේ ඉතා ප්‍රබල මෙන් ම ආකර්ශණීය ඉගෙනුම්- ඉගැන්වීම් මෙවලමක් ලෙස ප්‍රයෝජනයට ගන්නා රූපවාහිනිය, ගුවන්විදුලිය හා සංයුක්ත තැටි බඳු ඉලෙක්ට්‍රොනික ඉගෙනුම් ද්‍රව්‍ය භාවිත කරමින් පාසල් ප්‍රජාව පමණක් නොව, ඊට පරිබාහිර විවිධ සමාජ කණ්ඩායම් ඉගෙනුම් සමාජයක් කරා ගෙන යෑමේ කාර්යභාරය විද්‍යුත් ප්‍රචාරණ දෙපාර්තමේන්තුව ඉටු කරයි. විෂයමාලාවේ දුරවබෝධ සංකල්ප පැහැදිලි කරලීම සඳහාත්, විෂයමාලාවේ කරන වෙනස්කම් පිළිබඳ ව ප්‍රජාව දැනුවත් කිරීම සඳහාත්, ගීතය, සංගීතය, නාට්‍ය වැනි සෞන්දර්යාත්මක මාධ්‍ය යොදා ගනිමින් ජන මනස පුබුදුවාලීම සඳහාත් විවිධ වැඩ සටහන් නිෂ්පාදනය කිරීම විද්‍යුත් ප්‍රචාරණ දෙපාර්තමේන්තුව විසින් ආයතනය ආරම්භයේ සිට ම කර ගෙන එනු ලබයි.

2016 වර්ෂයේ දී මෙම දෙපාර්තමේන්තුවෙන් ඉටු කරන ලද කටයුතුවල ප්‍රගතිය පහත සඳහන් වෙයි.

- ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රමවේද සාරවත් කිරීම සඳහා අධ්‍යාපන සී.වී.ඩී. වැඩසටහන් 10ක් නිෂ්පාදනය කිරීම.
- 2015 වසරේ දී පද්ධතියට හඳුන්වා දුන් යථාර්ථවත් විෂයමාලාව පිළිබඳ ප්‍රජාව දැනුවත් කිරීම සඳහා ඩී.වී.ඩී. වැඩ සටහන් 20ක් නිෂ්පාදනය කිරීම.

6.3 මාර්ගෝපදේශන හා උපදේශන සේවා

පාසල් පද්ධතිය හා සම්බන්ධ ප්‍රජාවගේ මානසික ව්‍යාකූලතාව නැති කිරීම සඳහා මනෝ සමාජයීය මැදිහත් වීමක් ලබාදීමේ අරමුණ ඇතිව 2006 වසරේ ජූනි මස උපදේශන හා මාර්ගෝපදේශන ඒකකය ජාතික අධ්‍යාපන ආයතනයෙහි ස්ථාපිත කරන ලදි. ශිෂ්‍ය ප්‍රජාව සඳහා වෘත්තීය මාර්ගෝපදේශන හා උපදේශන සේවා සැපයීම මෙම ඒකකයට පැවරී ඇති වගකීමයි. 2016 වර්ෂය අවසාන වන විට මෙම ඒකකය විසින් සම්පූර්ණ කරන ලද කාර්ය පහත සඳහන් වෙයි.

- පාසල් සිසුන් හා දෙමාපියන් 64 දෙනෙකු සඳහා අභ්‍යන්තරික ව උපදේශන සැසි පැවැත්වීම.
- සබරගමුව, මධ්‍යම, උතුරු නැගෙනහිර හා උතුරු මැද පළාත්වල ගුරුවරුන් 239ක් සඳහා උපදේශනය සම්බන්ධව පුහුණු කිරීම
- රැකියා ක්ෂේත්‍ර 7කට අදාළ වෘත්තීය මාර්ගෝපදේශන නාමාවලියක් (Job Inventory) සැකසීම. (රථවාහන, ගොඩනැගිලි ඉදිකිරීම, රෙදිපිළි කර්මාන්තය, හෝටල් හා සංචාරක, බැංකු සහ කළමනාකරණය සහ තොරතුරු තාක්ෂණය)

6.4 විවෘත ඉගෙනුම

විවිධ හේතු නිසා පාසල් අධ්‍යාපනය අහිමි වූ පුද්ගලයන්ට අධ්‍යාපනයේ මංපෙත් විවෘත කර දීම සඳහා දුරස්ථ පාඨමාලා පැවැත්වීම අරමුණු කරගෙන විවෘත පාසල් දෙපාර්තමේන්තුව පිහිටුවා තිබේ. විවෘත පාසල දුරස්ථ හා විවෘත ඉගෙනුම් ක්‍රම උපයෝගී කර ගනිමින් අධ්‍යාපනය ඉගෙනුම් ලාභියා වෙතට ගෙන යන ක්‍රියාවලියකි. අධ්‍යාපන සුදුසුකම්, රැකියාවක යෙදී සිටීම හෝ සමාජ ආර්ථික පසුබිම ආදී කිසිවක් නොසලකා සියලු දෙනාට ම අධ්‍යාපනය ලබාදීමේ අවස්ථා පුළුල් කිරීමක් එමගින් අපේක්ෂා කෙරේ. ඉගෙනුම් ලාභියාගේ අභිමතය පරිදි ඉගෙනුම ආරම්භ කර තමා කැමති මාධ්‍යයක් උපයෝගි කරගනිමින් උචිත පියවරක සිට ඉගෙනීම සඳහා විවෘත පාසල පහසුකම් සපයයි.

විවෘත පාසල් ඒකකය විසින් විවෘත ඉගෙනුම සම්බන්ධව 2016 වර්ෂයේ දී ඉටුකළ කාර්ය පහත සඳහන් වෙයි.

- විවෘත ද්විතීයික පාඨමාලාවට අදාළ අතිරේක විෂයමාලා පොත් 02ක් සකස් කිරීම. (ගණිතය සහ විද්‍යාව)
- ඉගෙනුම්ලාභින් 678 දෙනෙකු විවෘත ප්‍රාථමික පාඨමාලාව සහ ඉගෙනුම්ලාභින් 1417 දෙනෙකු විවෘත ද්විතීයික පාඨමාලාව සම්පූර්ණ කිරීම.

7.0 පර්යේෂණ, සැලසුම් හා සංවර්ධනය

අධ්‍යාපනයේ ගුණාත්මක සංවර්ධනය උදෙසා විෂයමාලා සංවර්ධනය, වෘත්තීය සංවර්ධනය සහ අධ්‍යාපන ප්‍රතිපත්ති සම්පාදනය සඳහා ඉවහල් වන විවිධ පර්යේෂණ කිරීම ජාතික අධ්‍යාපන ආයතනය මගින් ඉටු කරන අතර, යථෝක්ත කාර්ය යථාර්ථයක් බවට පත්කිරීම සඳහා අවශ්‍ය කටයුතු පර්යේෂණ දෙපාර්තමේන්තුව යටතේත් ආයතනයේ කාර්ය ඉටුකිරීම සඳහා අවශ්‍ය මූල්‍ය සම්පත් ලබා දීම සඳහා අවශ්‍ය සම්බන්ධීකරණය සහ නියාමනය සැලසුම් හා ඇගයීම් දෙපාර්තමේන්තුව යටතේත් ක්‍රියාත්මක වෙයි.

7.1 පර්යේෂණ හා සංවර්ධන දෙපාර්තමේන්තුව

අධ්‍යාපන පර්යේෂණ ආරම්භ කිරීම, ප්‍රවර්ධනය කිරීම සහ පවත්වා ගෙන යාම සහ නියාමනය අධ්‍යාපනයේ විවාදාත්මක අංශ සම්බන්ධ ව අදහස් හා මත සංවාදය සඳහා සාකච්ඡා මණ්ඩප සැලසුම් කිරීම, අධ්‍යාපනයේ නියැළි පිරිස් තුළ පර්යේෂණ කුසලතා ප්‍රවර්ධනය සඳහා අවස්ථා සම්පාදනය, පුද්ගලයන්ට සහ ආයතනවලට පර්යේෂණ ප්‍රදාන ලබාදීම තුළින් පර්යේෂණ හැකියා සංවර්ධනයට අවස්ථා සැලසීම සහ පර්යේෂණ තොරතුරු ප්‍රචලිත කිරීම පර්යේෂණ හා සංවර්ධන දෙපාර්තමේන්තුවේ කාර්යභාරය වෙයි. මෙම දෙපාර්තමේන්තුව විසින් 2016 දී නිම කරන ලද කාර්ය පහත සඳහන් වෙයි.

- අ.පො.ස. උසස් පෙළ 13 වසර සිසුන්ගේ පාසල් නොපැමිණීම පිළිබඳ අධ්‍යයනයේ අන්තර්කාලීන වාර්තාව සැකසීම.
- පූර්ව සේවා ගුරු අධ්‍යාපනයේ ගුණාත්මකභාවය පිළිබඳ අධ්‍යයනයේ අන්තර්කාලීන වාර්තාව සැකසීම.
- පර්යේෂණ සම්මන්ත්‍රණයක් 165 දෙනෙකු සහභාගිත්වයෙන් පැවැත්වීම.
- "කන්නන්ගර යුගයෙන් ඔබ්බට 21 වන සියවස සඳහා අධ්‍යාපන ප්‍රතිසංස්කරණ" යන මාතෘකාව යටතේ ශ්‍රී ලංකා ජාත්‍යන්තර බෞද්ධ අධ්‍යාපන මණ්ඩලයේ පීඨාධිපති ආචාර්ය උපාලි සේදර මහතා විසින් පැවැත්විම.

7.2 සැලසුම් හා ඇගයීම් දෙපාර්තමේන්තුව

ආයතනය සතු භෞතික, මූල්‍ය හා මානව සම්පත් කාර්යක්ෂමව හා ඵලදායී ලෙස උපයෝගී කර ගනිමින්, ආයතනයේ අරමුණු හා ඉලක්ක, ජාතික අරමුණු හා ඒකාබද්ධ කිරීමේ අභිලාෂය ඇති ව කටයුතු කිරීම සැලසුම් හා ඇගයීම් දෙපාර්තමේන්තුවේ කාර්යභාරයයි.
2016 වසරේ සැලසුම් හා ඇගයීම් දෙපාර්තමේන්තුව ඉටුකළ ප්‍රමුඛ කාර්ය පහත සඳහන් වෙයි.

- 2016 වර්ෂයේ වාර්ෂික ප්‍රගති වාර්තාව සහ 2016 වර්ෂයේ කාර්තුමය ප්‍රගති වාර්තා, සහ කාර්ය සාධන වාර්තා සකස් කිරීම.
- 2017 වර්ෂයට අදාළ අයවැය ඇස්තමේන්තුව සහ 2017 අයවැය වාර්තාව, 2018 - 2020 මධ්‍යකාලීන පස් අවුරුදු සැලැස්ම සහ වාර්ෂික ක්‍රියාත්මක කිරීමේ සැලැස්ම සකස් කිරීම.
- මහ බැංකුව, අධ්‍යාපන අමාත්‍යාංශය, විශ්ව විද්‍යාල ප්‍රතිපාදන කොමිසම් සභාව, මුදල් අමාත්‍යාංශය ආදි ආයතනවල ඉල්ලීම පරිදි ප්‍රගති වාර්තා සකස් කිරීම.
- දේශිය සහ විදේශිය අරමුදල් යටතේ ක්‍රියාත්මකවන ව්‍යාපෘතිවල කාර්තුමය ප්‍රගති වාර්තා සකස් කිරීම.

8.0 පරිපාලන, මූල්‍ය හා සහාය සේවා

ආයතනයේ විෂයමාලා සංවර්ධන, අධ්‍යාපන නායකත්ව සංවර්ධන හා ගුරු අධ්‍යාපන, සැමට අධ්‍යාපන, පර්යේෂණ සැලසුම් හා සංවර්ධන පීඨ මගින් කරනු ලබන සියලු ම කාර්ය සඳහා මූල්‍ය, භෞතික සම්පත් හා කළමනාකරණ සේවා සම්පාදනය සහ සහාය සේවා සැපයීම, පරිපාලන, මූල්‍ය හා සහායක සේවා අංශයේ ප්‍රධාන කාර්යභාරයයි. පරිපාලන මූල්‍ය හා සහාය සේවා අංශය යටතේ ක්‍රියාත්මක වන ඒ ඒ දෙපාර්තමේන්තු විසින් 2016 වසරේ දී ඉටුකරන ලද කාර්ය පහත සඳහන් වෙයි.

8.1 පරිපාලන දෙපාර්තමේන්තුව

ආයතනයේ එදිනෙදා පරිපාලන කාර්ය හා සම්බන්ධ සියලු ම කටයුතු හා කාර්ය මණ්ඩල පුහුණු අවශ්‍යතා හඳුනාගෙන ඔවුන්ට අදාළ පුහුණු අවස්ථා ලබා දීමේ කටයුතු මානව සම්පත් සංවර්ධන හා පාලන දෙපාර්තමේන්තුව මගින් සිදු කරයි.

එදිනෙදා ඉටුකරනු ලබන සාමාන්‍ය පරිපාලන රාජකාරි කටයුතු වලට අමතරව, 2016 ජනවාරි - දෙසැම්බර් කාලසීමාව ඇතුළත පරිපාලන දෙපාර්තමේන්තුව විසින් පහත දැක්වෙන බඳවා ගැනීම් සිදු කර ඇත.

- අධ්‍යක්ෂවරුන් දෙදෙනකු ආයතනයට බඳවා ගැනීම.
- ඊට අමතර ව ආයතනයේ අධ්‍යයන හා අනධ්‍යයන කාර්ය මණ්ඩලයේ නිලධාරීන් 33 දෙනෙකුගේ පාඨමාලා සම්බන්ධ ඉල්ලීම් සඳහා මූල්‍ය ප්‍රතිපාදන මෙන් ම අධ්‍යයන නිවාඩු ලබා දීමත්;
- කාර්ය මණ්ඩල පුරප්පාඩු 89න් 79ක් සඳහා බඳවා ගැනීමට අනුමැතිය ලබා ගැනීම.

8.2 මුදල් දෙපාර්තමේන්තුව

ආයතනයේ සියලු ම කාර්ය සඳහා මූල්‍ය සම්පත් ලබා දීම, ආදායම් හා පිරිවැය වාර්තා මූල්‍ය නීතිරීති අනුව පවත්වාගෙන යෑමේ කටයුතු මුදල් දොපර්තමේන්තුව මගින් සිදු කරයි. ඒ යටතේ එම දෙපාර්තමේන්තුව ඉටු කළ ප්‍රධාන වැඩසටහන් පහත සඳහන් වෙයි.

- ස්ථාවර වත්කම් ලේඛනය හා ඇගයීම් පටිපාටි සකස් කොට අවසන් කිරීම.
- 2016 වර්ෂයේ භාණ්ඩ සමීක්ෂණය අවසන් කිරීම.
- 2016 වර්ෂයේ මූල්‍ය ප්‍රකාශය පිළිබඳ අවසන් වාර්තාව සකස් කිරීම.

8.3 ඉංජිනේරු සේවා දෙපාර්තමේන්තුව

ආයතනයේ ගොඩනැගිලි ඉදිකිරීම, නඩත්තු කටයුතු, විදුලි සහ දුරකථන සේවා පවත්වා ගෙන යාම, යටිතල පහසුකම් සැපයීම, පවිත්‍රතා සහ ආරක්ෂක සේවා සම්බන්ධීකරණය හා ආයතනයේ භෞතික පරිසරය අධ්‍යාපනික කාර්යවලට සමීප වන අයුරින් පවත්වාගෙන යාම ඉංජිනේරු සේවා දෙපාර්තමේන්තුව මගින් ඉටුකරනු ලැබේ. ඉංජිනේරු සේවා දෙපාර්තමේන්තුව මගින් 2016 වර්ෂයේ දෙසැම්බර් වන විට ඉටුකර ඇති කාර්ය පහත දැක්වේ.

- මහරගම සහ මීපේ පරිශ්‍රයෙහි ලොකු කුඩා ප්‍රතිසංස්කරණ හා අලුත්වැඩියා කටයුතු 31ක් සම්පූර්ණ කිරීම.
- විදුලිය සම්බන්ධ වැඩි දියුණු කාර්යයන් 40ක් සම්පූර්ණ කිරීම.
- ආයතනයේ ගොඩනැගිලි නඩත්තු කටයුතු 13ක් සම්පූර්ණ කිරීම
- ආයතනයේ ප්‍රධාන පිවිසුම් මාර්ගය සහ අතුරු මාර්ග සංවර්ධනය කිරීම.

8.4 පුස්තකාල සේවා

ජාතික අධ්‍යාපන ආයතනයේ පුස්තකාලය ආයතනයේ අභ්‍යන්තර කාර්ය මණ්ඩලයට අමතරව, අධ්‍යාපන විෂය ක්ෂේත්‍රය හා සම්බන්ධ විශ්වවිද්‍යාල කථිකාචාර්යවරුන්, ගුරුවරුන් හා සිසුන් මෙන්ම අධ්‍යාපන විද්‍යාපීඨ හා ගුරු විදුහල් කථිකාචාර්යවරුන් සහ වෙනත් ආයතනවල අධ්‍යාපනඥයින්ගේ නිරන්තර පරිහරණයට බඳුන් වේ. එම පුස්තකාලයට 2016 වසරේ දී අලුතින් එකතු කරගන්නා ලද පොත් පත් හා සංයුක්ත තැටි ප්‍රමාණය පහත දැක්වේ.

පොත්	2440
පොත් (පරිත්‍යාග)	89
විෂයමාලා ද්‍රව්‍ය	72
අධ්‍යාපනික වාර්තා	83
දේශීය වාර සඟරා (පරිත්‍යාග)	10
දේශීය වාර සඟරා	06
විදේශීය වාර සඟරා (පරිත්‍යාග)	10
ජා.අ.ආ එකතුව	190
පුවත් සඟරා	10
DVD / CD	22

8.5 මුද්‍රණ හා ප්‍රකාශන

මුද්‍රණ හා ප්‍රකාශන දෙපාර්තමේන්තුව විසින් අදාළ කාලසීමාව තුළ මුද්‍රණය කරන ලද ප්‍රකාශන වර්ගය හා ප්‍රමාණය පහත දැක්වේ.

- ගුරු මාර්ගෝපදේශ සංග්‍රහ - 13
- අතිරේක විෂයමාලා ද්‍රව්‍ය - 111
- සහතික - 21
- විෂය නිර්දේශ - 50
- අමතර ප්‍රකාශන - 110
- ආරාධනා පත්‍ර - 04
- ගුරු පුහුණු අත් පොත් - 18

ඉහත සඳහන් මුද්‍රණ සහ ප්‍රකාශන කාර්යයන්ට අමතරව, පොත් ප්‍රදර්ශන අවස්ථා හතකට සහභාගි වීමට අවස්ථා ලබා ගැනීමට 2016 වසරේ දී අවස්ථාව ලබා ගෙන ඇත.

විගණකාධිපති දෙපාර්තමේන්තුව
கணக்காய்வாளர் தலைமை அதிபதி திணைக்களம்
AUDITOR GENERAL'S DEPARTMENT

මගේ අංකය / எனது இல. / My No. : ඊඩ්යූ/සී/එන්අයිඊ/1/16

ඔබේ අංකය / உமது இல. / Your No. :

දිනය / திகதி / Date : 2017 සැප්තැම්බර් 30 දින

අධ්‍යක්ෂ ජනරාල්

ජාතික අධ්‍යාපන ආයතනය

ජාතික අධ්‍යාපන ආයතනයේ 2016 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව 1971 අංක 38 දරන මුදල් පනතේ 14(2)(සී) වගන්තිය ප්‍රකාර විගණකාධිපති වාර්තාව

ජාතික අධ්‍යාපන ආයතනයේ 2016 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශනය, හිමිකම් වෙනස්වීමේ ප්‍රකාශනය සහ මුදල් ප්‍රවාහ ප්‍රකාශනය හා වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්ති සහ අනෙකුත් පැහැදිලි කිරීමේ තොරතුරුවල සාරාංශයකින් සමන්විත 2016 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 1971 අංක 38 දරන මුදල් පනතේ 13 (1) වගන්තිය සහ 1985 අංක 28 දරන ජාතික අධ්‍යාපන ආයතන පනතේ 19 වන වගන්තිය සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. මුදල් පනතේ 14(2) (සී) වගන්තිය ප්‍රකාර ආයතනයේ වාර්ෂික වාර්තාව සමඟ ප්‍රකාශයට පත් කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ. මුදල් පනතේ 13(7)(ඒ) වගන්තිය ප්‍රකාර විස්තරාත්මක වාර්තාවක් ආයතනයේ අධ්‍යක්ෂ ජනරාල් වෙත 2017 සැප්තැම්බර් 19 දින නිකුත් කරන ලදී.

1.2. මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ වගකීම

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර වූ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

අංක 306/72, පොල්දූව පාර, බත්තරමුල්ල, ශ්‍රී ලංකාව, - இல. 306/72, பொல்தூவ வீதி, பத்தரமுல்லை, இலங்கை. - No. 306/72, Polduwa Road, Battaramulla, Sri Lanka
+94-11-2887028-34 +94-11-2887223 oaggov@sltnet.lk www.auditorgeneral.gov.lk

1.3 විගණකගේ වගකීම

මාගේ විගණන මත පදනම්ව මෙම මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීම මාගේ වගකීම වේ. මා විසින් උත්තරීතර විගණන ආයතනයන්ගේ ජාත්‍යන්තර විගණන ප්‍රමිතිවලට (ISSAI 1000-1810) අනුරූප ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට අනුකූලව මාගේ විගණනය සිදු කරන ලදී. ආචාර ධර්මවල අවශ්‍යතාවන්ට මම අනුකූලවන බවට සහ මූල්‍ය ප්‍රකාශන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරවන්නේද යන්න පිළිබඳ සාධාරණ තහවුරුවක් ලබා ගැනීම පිණිස විගණනය සැලසුම්කර ක්‍රියාත්මක කරන බවට මෙම ප්‍රමිති අපේක්ෂා කරයි.

මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන අගයන් සහ හෙළිදරව් කිරීම්වලට අදාලවන විගණන සාක්ෂි ලබා ගැනීම පිණිස පරිපාටි ක්‍රියාත්මක කිරීම විගණනයට ඇතුළත් වේ. තෝරාගත් පරිපාටීන්, වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් අවදානම් තක්සේරු කිරීම් ද ඇතුලත් විගණකගේ විනිශ්චය මත පදනම් වේ. එම අවදානම් තක්සේරු කිරීම්වලදී, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස ආයතනයේ මූල්‍ය ප්‍රකාශන පිළියෙළ කිරීමට සහ සාධාරණ ලෙස ඉදිරිපත් කිරීමට අදාල වන්නා වූ අභ්‍යන්තර පාලනය විගණක සැලකිල්ලට ගන්නා නමුත් ආයතනයේ අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමට අදහස් නොකරයි. කළමනාකරණය විසින් අනුගමනය කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය හා යොදා ගන්නා ලද ගිණුම්කරණ ඇස්තුමේන්තුවල සාධාරණත්වය ඇගයීම මෙන්ම මූල්‍ය ප්‍රකාශනවල සමස්ත ඉදිරිපත් කිරීම පිළිබඳ ඇගයීමද විගණනයට ඇතුළත් වේ. විගණනයේ විෂය පථය හා ප්‍රමාණය තීරණය කිරීම සඳහා 1971 අංක 38 දරන මුදල් පනතේ (3) හා (4) උප වගන්තිවලින් විගණකාධිපති වෙත අභිමතානුසාරී බලතල පැවරේ.

මාගේ විගණන මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

1.4. තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම

මෙම වාර්තාවේ 2.2 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මාගේ මතය තත්ත්වාගණනය කරනු ලැබේ.

2. මූල්‍ය ප්‍රකාශන

2.1. තත්ත්වාගණනය කළ මතය

මෙම වාර්තාවේ 2.2 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශනවලින් 2016 දෙසැම්බර් 31 දිනට ජාතික අධ්‍යාපන ආයතනයේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය හා මුදල් ප්‍රවාහ ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

2.2. මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම

2.2.1. ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිති

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත 06

දකුණු ආසියානු ගුරු පුහුණු මධ්‍යස්ථානයේ ඉදිකිරීම් සඳහා ගෙවිය යුතු අවසන් බිල්පත, වෙනුවෙන් රු.8,908,928 ක් 2015 වර්ෂයේදී ගොඩනැගිලි යටතේ ප්‍රාග්ධනීත කර තිබුණද 2017 ජනවාරි මාසයේදී සත්‍ය වශයෙන් රු.5,142,899 ක් පමණක් ගෙවීම නිසා 2015 සහ 2016 වර්ෂවලදී ගොඩනැගිලි වටිනාකම රු.3,766,029 කින් හා ක්ෂය රු.376,603 කින් වැඩියෙන් දක්වා තිබුණි.

(ආ) ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත 07

ප්‍රමිතයේ 47 වගන්තිය පරිදි වත්කමක සාධාරණ අගය එහි ධාරණ අගයෙන් ප්‍රමාණාත්මක ලෙස වෙනස් වන විට ප්‍රත්‍යාගණනයක් සිදුකළ යුතු වුවද ආයතනයේ වත්කම් 2008 වර්ෂයෙන් පසුව ප්‍රත්‍යාගණනයක් සිදුකර නොතිබුණි.

(ඇ) ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත 09

ආයතනයේ ගිණුම් ප්‍රතිපත්ති වලට අනුව පිරිවැය හා ශුද්ධ උපලබ්ධි අගයයන් යන දෙකෙන් අඩු අගයට තොග අගය කළ යුතු වුවද සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට විකිණීම සඳහා වූ පොත් තොගය රු.22,843,838 ක් ලෙස විකුණුම් මිලට මූල්‍ය ප්‍රකාශනවල දක්වා තිබුණි.

2.2.2 ගිණුම්කරණ ප්‍රතිපත්ති

ස්ථාවර වත්කම් විකිණීමෙන් ලද ලාභය හෝ අලාභය වර්ෂයේ ලාභයට ගැලපිය යුතු වුවද ආයතනය විසින් ඉකුත් වර්ෂවල ස්ථාවර වත්කම් අපහරණය තුලින් ඇති වූ ලාභ අලාභ අපහරණ ලාභ අරමුදල නම් අරමුදලක් මඟින් ගැලපීම් කර තිබූ අතර සමාලෝචිත වර්ෂය අවසානයට එහි ශේෂය රු. 3,640,844 ක් වී තිබුණි.

2.2.3 ගිණුම්කරණ අඩුපාඩු

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) මූල්‍ය ප්‍රකාශන සමඟ ඉදිරිපත්කරන ලද මුදල් ප්‍රවාහ ප්‍රකාශයේ පහත සඳහන් අඩුපාඩු පැවතීම හේතුවෙන් එහි නිරවද්‍යතාවය සම්බන්ධයෙන් විගණනයේදී ප්‍රශ්නකාරී විය.

(i) මුදල් ප්‍රවාහ ප්‍රකාශනයේ කාරක ප්‍රාග්ධන වෙනස්වීම් තුළ ගෙවිය යුතු වියදම් රු.7,151,969 ක් අඩුවෙන් දක්වා තිබුණි.

(ii) ජංගම නොවන වත්කම් මිලදීගැනීම් වෙනුවෙන් ගෙවිය යුතු රු.7,786,795 ක් මුදලින් ගෙවීම් ලෙස මුදල් ප්‍රවාහ ප්‍රකාශයේ දක්වා තිබුණි.

(iii) මාර්ගස්ථ තොගවල සටහන් කර තිබූ රු.46,991,171 ක ජංගම නොවන වත්කම් කාරක ප්‍රාග්ධන වෙනස්වීම්වල දක්වා තිබුණි.

(iv) සමාලෝචිත වර්ෂයට අදාල මුදලින් ගෙවූ පාරිතෝෂික ප්‍රමාණය රු.5,353,157ක් පමණක් වුවත් මුදල් ප්‍රවාහ ප්‍රකාශයෙහි එය රු.5,697,314 ක් ලෙස දැක්වීම නිසා රු.344,157 ක් වැඩිපුර දක්වා තිබුණි.

(ආ) මූල්‍ය ප්‍රකාශන සමඟ ඉදිරිපත් කර තිබුණු දේපල පිරියත උපකරණ යටතේ සමාලෝචිත වර්ෂයේ කාර්යාල ලී බඩු උපකරණ එකතු කිරීම් ලෙස සටහන් කර ක්ෂය කිරීමද සිදුකරන ලද රු.1,614,600 ක් නැවතත් ජංගම වත්කම් යටතේ මාර්ගස්ථ තොග හා ගෙවිය යුතු වියදම් යටතේ ඇතුලත්කර තිබුණි.

(ඇ) 2009 වර්ෂයට පෙර මුද්‍රණය කර තිබූ භාවිතයෙන් ඉවත් කරන ලද පැරණි විෂය නිර්දේශ ඇතුළත් රු.10,369,094 ක් වටිනා ගුරු මාර්ගෝපදේශ අවසන් තොගයට ඇතුලත් කර තිබීම නිසා අවසන් තොගය එම ප්‍රමාණයෙන් වැඩියෙන් දක්වා තිබුණි.

(ඈ) සමාලෝචිත වර්ෂයේදී මීපේ නව ගොඩනැගිල්ල ඉදිකිරීම වෙනුවෙන් කොන්ත්‍රාත් හා උපදේශක ගාස්තු ගෙවිය යුතු ලෙස දෙවරක් බිල් කිරීම හේතුවෙන් රු.6,172,195 ක් ගොඩනැගිලි ගිණුමේ හා උපචිත වියදම් ගිණුමේ වැඩියෙන් දක්වා තිබූ අතර සමාලෝචිත වර්ෂයේ ක්ෂය රු.240,605 ක් වැඩිපුර දක්වා තිබුණි.

(ඉ) සමාලෝචිත වර්ෂයේදී බැංකු ගිණුම් දෙකක් අතර මුදල් හුවමාරු කිරීමේදි ඇති වූ දෝෂයක් හේතුවෙන් රු.8,843,090 කින් ගෙවිය යුතු වියදම් ගිණුම හා ලැබිය යුතු ගිණුම අඩුවෙන් දක්වා තිබුණි.

(ඊ) ආයතනයෙන් ඉවත් වූ නිලධාරීන් 05 දෙනෙකු වෙනුවෙන් පාරිතෝෂික රු.164,140 ක් වැඩිපුර වෙන්කිරීම් සිදුකර තිබුණි.

(උ) වර්ෂය තුල ආපදා ණය පොලී වශයෙන් ලැබී තිබුණු රු.2,386,738 ක්, ආදායමට නොගෙන ණය අරමුදල නමින් අරමුදලකට බැර කර තිබුණි.

2.2.4. පැහැදිලි නොකල වෙනස්කම්

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) ආයතනය විසින් විගණනය වෙත ලබාදුන් වැඩමුළු අත්තිකාරම් උපලේඛනය හා වැඩමුළු අත්තිකාරම් ගිණුමෙහි ශේෂය අතර රු.423,706 ක වෙනසක් නිරීක්ෂණය විය.

(ආ) ගුරු විද්‍යාල අංශයේ තොරතුරු අනුව ඉදිරියට ගෙවූ පාඨමාලා ගාස්තු රු.22,692,418 ක් වුවද මූල්‍ය ප්‍රකාශනවල එය රු.34,577,626 ක් වීමෙන් රු.11,885,208 ක වෙනසක් නිරීක්ෂණය විය.

2.3 ලැබිය යුතු හා ගෙවිය යුතු ගිණුම්

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) පාසැල් පදනම් කරගත් ඇගයීම් ප්‍රශ්න පත්‍ර මුද්‍රණය වෙනුවෙන් 2008 වර්ෂයේ සිට අධ්‍යාපන අමාත්‍යාංශයෙන් ලැබිය යුතු රු. 3,237,800 ක මුදලක් හා රු.595,122 ක වර්ෂ 05 ක් ඉක්මවූ ලැබිය යුතු ශේෂ අයකරගැනීමට කටයුතු නොකර ලැබිය යුතු ශේෂයන් ලෙස ගිණුම්වල දක්වා තිබුණි.

(ආ) එකතුව රු.5,260,853 ක් වූ ගෙවිය යුතු වියදම් තුල වර්ෂ පහක කාලයක් ඉක්මවූ රු.372,295 ක් නිරවුල් කිරීමට සමලෝචිත වර්ෂය අවසන් වන විටත් කටයුතු කර නොතිබුණි.

2.4 නීති රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවීම

පහත සඳහන් අනුකූල නොවීම් නිරීක්ෂණය විය.

නීති රීති හා රෙගුලාසිවලට යොමුව		අනුකූල නොවීම්
(අ)	ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආයතන සංග්‍රහයේ II වැනි පරිච්ඡේදයේ 13.1.2 වගන්තිය	වැඩබැලීමේ පත්වීම සඳහා නිර්දේශ කරනු ලබන නිලධාරියා සැම අතින්ම සුදුසුකම් තිබෙන පුද්ගලයෙකු විය යුතු වුවත්, විවිධ අවස්ථාවලදී අවවාද කිරීම්වලට ලක්ව තිබියදී හා 2007 සැප්තැම්බර් 15 දිනට පසුව වැටුප් වර්ධක කිසිවක් උපයාගෙන නොතිබුණු නිලධාරියෙකු 2016 ජනවාරි 05 දින සිට නියෝජ්‍ය අධ්‍යක්ෂ ජනරාල් - විකල්ප අධ්‍යාපන හා ගුරු අධ්‍යාපන වැඩබලන තනතුරට පත්කර තිබුණි.
(ආ)	2006 රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 8.9.1 (ආ) ඡේදය	භාණ්ඩ හෝ සේවා මිලදී ගැනීමේ කොන්ත්‍රාත්තුවක් පිරිනැමීමේදී රු. 500,000 ක් ඉක්මවන විට විධිමත් ගිවිසුමක් ලියා අත්සන් කළයුතු වුවද ආයතනයේ මුද්‍රණාලය සඳහා සමාලෝචිත වර්ෂයේදී රු.19,813,500 ක් පිරිවැය වූ යන්ත්‍ර 02 ක් මිලදීගැනීමේදී සැපයුම්කරු සමඟ විධිමත් ගිවිසුමකට එළඹ නොතිබුණි.

3. මූල්‍ය සමාලෝචනය

3.1 මූල්‍ය ප්‍රතිඵල

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව 2016 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා ආයතනයේ මෙහෙයුම් කටයුතුවලින් රු.37,792,759 ක අතිරික්තයක් වූ අතර, ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ රු.157,631,149 ක අතිරික්තයක් වූයෙන් ඉකුත් වර්ෂයට සාපේක්ෂව සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රතිඵලයෙහි රු.119,838,390 ක පිරිහීමක් නිරීක්ෂණය විය. රජයේ හා විදේශ ප්‍රදාන රු.28,497,342 කින් අඩුවීම හා මෙහෙයුම් වියදම් රු.105,003,558 කින් වැඩිවීම ඉහත පිරිහීම සඳහා ප්‍රධාන වශයෙන් බලපා තිබුණි.

සමාලෝචිත වර්ෂය හා ඉකුත් වර්ෂ 04 ක මූල්‍ය ප්‍රතිඵල විග්‍රහ කිරීමේදී 2012 වර්ෂයේ සිට 2015 වර්ෂය දක්වා අඛණ්ඩව මූල්‍ය ප්‍රතිඵලය වර්ධනය වී තිබුණි. කෙසේ වුවද මූල්‍ය ප්‍රතිඵලයට සේවක පාරිශ්‍රමික හා ජංගම නොවන වත්කම් සඳහා වූ ක්ෂයවීම් නැවත ගැලපීමෙන් පසු ආයතනයේ දායකත්වය 2013 වර්ෂයේ සිට 2016 වර්ෂය දක්වා පිළිවෙලින් රු.256,417,465 ක්, රු.297,593,788 ක් හා රු.453,446,003 ක් වී තිබුණු අතර 2015 වර්ෂයට සාපේක්ෂව 2016 වර්ෂයේ දායකත්වය සියයට 21 කින් අඩුවී තිබුණි.

3.2 කාරක ප්‍රාග්ධන කළමනාකරණය

ආයතනයේ කාරක ප්‍රාග්ධන කළමනාකරණය පිළිබඳ සැලකීමේදී ඉකුත් වර්ෂයේ 5.4:1 ට පැවති ජංගම අනුපාතය සමාලෝචිත වර්ෂයේ 4.7:1 ක් වූ අතර ක්ෂණික වත්කම් අනුපාතය ඉකුත් වර්ෂයේ 5.2:1 ක් හා සමාලෝචිත වර්ෂයේ 4.3:1 ක් ව පැවතුණි. ජංගම වත්කම් තුල සියයට 82 ක් නියෝජනය කරනුයේ භාණ්ඩාගාර බැදුම්කර හා බැංකු ජංගම ගිණුම් ශේෂ වන අතර ආයතනයේ විශාල වත්කම් ප්‍රමාණයක් ද්‍රවශීල වත්කම් තුල රඳවා තිබුණි. ආයතනය සතුව ඇති බැංකු ගිණුම් 05 න් 02 ක 2016 දෙසැම්බර් 31 දිනට රු.මිලියන 97 ක් හා රු.මිලියන 92 ක ශේෂයක් පැවති අතර, අවශ්‍යතා ඉක්මවා මුදල් ශේෂ පවත්වා ගැනීමත්, කෙටිකාලීන ආයෝජන සිදුකිරීමත්, තොග ශේෂය තුල රු. මිලියන 10 ක යල් පැනගිය තොග හා රු. මිලියන 46 ක ජංගම නොවන වත්කම් පැවතීමත් හේතුවෙන් ජංගම හා ක්ෂණික වත්කම් අනුපාත වැඩිවී තිබුණි.

3.3 ආයතනය විසින් ආරම්භ කර ඇති නෛතික සිද්ධි

අධ්‍යයන කටයුතු සඳහා විදේශ ගත වී ඇති ගිවිසුම් කඩ කළ ආචාර්යවරුන් 04 දෙනෙකුට එරෙහිව ආයතනය විසින් එකතුව රු.8,538,064 ක වන්දි ඉල්ලා අධිකරණවල නඩු 04 ක් ගොනුකර තිබුණි.

4. මෙහෙයුම් සමාලෝචනය

4.1 කාර්යසාධනය

1985 අංක 28 දරන ජාතික අධ්‍යාපන ආයතන පනතට අනුව ශ්‍රී ලංකාවේ අධ්‍යාපනය සංවර්ධනය සඳහා සැලසුම්ගත වැඩසටහන් සකස් කිරීම, අධ්‍යාපන ක්‍රමයෙහි කාර්යසාධනය, අරමුණු ව්‍යුහ හා විෂය ප්‍රමාණය ඇතුළු අධ්‍යාපන ක්‍රමය පිළිබඳව හා අධ්‍යාපන සමාජීය, ආර්ථික හා වෙනත් අංශ පිළිබඳව අධ්‍යයන පවත්වා ගෙන යාම, අධ්‍යාපන ක්‍රමයෙහි නියැලී සිටින කාර්ය මණ්ඩලයේ වෘත්තීය හා කළමනාකරණ නිපුණත්වය වැඩිදියුණු කිරීම, පශ්චාත් උපාධි අධ්‍යාපනය සැලසීම ආදිය ආයතනයේ ප්‍රධාන අරමුණු වේ.

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) සමාලෝචිත වර්ෂය වෙනුවෙන් ක්‍රියාකාරී සැලැස්මක් සකස් කර තිබුණද එම සැලසුම් නිසියාකාරව ක්‍රියාත්මක නොවීම සමස්ථ ශ්‍රී ලාංකික සිසු දරුවන්ගේ ඉගෙනුම් ක්‍රියාවලිය කෙරෙහි සෘජුවම බලපාන බව නිරීක්ෂණය විය. විස්තර පහත දැක්වේ.

(i) සිංහල, ආගම හා සාරධර්ම විද්‍යා හා ගණිත යන දෙපාර්තමේන්තු හරහා වැඩසටහන් 04 ක් මඟින් ගුරුවරුන් හා ගුරු උපදේශකවරුන් 1200 ක් පුහුණු කිරීමට 2016 වර්ෂය තුල සැලසුම් කර තිබූ නමුත් එම වැඩසටහන් ක්‍රියාත්මක කිරීමට කටයුතු කර නොතිබුණි.

(ii) දෙපාර්තමේන්තු 06 ක් මඟින් ක්‍රියාත්මක කළ වැඩසටහන් 17 කින් ගුරුවරුන් 9,000 ක් පුහුණු කිරීමට සැලසුම් කර තිබූ නමුත් පුහුණු කර තිබුණේ 5,390 දෙනෙක්ද වූ අතර සැලසුම් කළ සංඛ්‍යාවෙන් සියයට 40 ක් පුහුණු කර නොතිබීම හේතුවෙන් අපේක්ෂිත ඉලක්කයන් කරා ළඟා වී නොතිබුණි.

(iii) දෙමළ, සමාජ විද්‍යාව, ගණිතය, වාණිජ්‍ය, ශාස්ත්‍රීය හා විදේශ භාෂා හා ද්වි භාෂා දෙපාර්තමේන්තු 05 ක් මඟින් විෂයයන් 18 කට අදාලව ගුරු අත්පොත් වල පළමු කෙටුම්පත පමණක් නිමකර තිබූ අතර සෞන්දර්ය, ආගම හා සාරධර්ම, සමාජ විද්‍යා, ශාස්ත්‍රීය හා විදේශ භාෂා දෙපාර්තමේන්තු 04 ක් මඟින් විෂයන් 12 කට අදාලව ගුරු අත්පොත් අවසන් කෙටුම්පත් පමණක් සකස් කර තිබුණි. කෙසේ වුවද මෙම අත්පොත් අනුමත කර මුද්‍රණය සඳහා අධ්‍යාපන ප්‍රකාශන දෙපාර්තමේන්තුව වෙත යවා නොතිබුණි.

(iv) සිංහල දෙපාර්තමේන්තුව මඟින් 12-13 ශ්‍රේණි සඳහා මාධ්‍ය අධ්‍යයනය ගුරු අත්පොත් සහ තොරතුරු තාක්ෂණ දෙපාර්තමේන්තුව මඟින් 6-8 ශ්‍රේණි සඳහා තොරතුරු තාක්ෂණය ගුරු අත්පොත් සකස් කිරීම සමාලෝචිත වර්ෂය තුල සැලසුම් කර තිබුණද ඒ සඳහා ප්‍රවේශ වී හෝ නොතිබුණි.

(ආ) සමාලෝචිත වර්ෂය තුල සිංහල දෙපාර්තමේන්තුව විසින් රු.12,738,410 ක් වැයකර වැඩමුළු 60 ක් හා තාක්ෂණික දෙපාර්තමේන්තුව විසින් රු.18,453,549 ක් වැයකර වැඩමුළු 183 ක් පවත්වා තිබුණි. එම වැඩමුළුවලින්, විගණන පරීක්ෂණය සඳහා නියැදියක් වශයෙන් තෝරාගත් මාධ්‍ය සමාජ පිහිටුවීමේ හා සංවර්ධනය කිරීමේ අරමුණින් ගුරුවරුන් 100 දෙනෙකු පුහුණු කිරීමේ වැඩමුළුව තුන්වන හා හතරවන කාර්තු මුල පැවැත්වීමට සැලසුම් කර තිබුණු අතර මෙම වැඩමුළු 2016 දෙසැම්බර් 06 හා 07 යන දෙදින තුල පවත්වා තිබුණි. මේ සම්බන්ධයෙන් පහත කරුණු නිරීක්ෂණය විය.

(i) මෙම වැඩමුළු සඳහා ගුරුවරුන් 100 දෙනෙකු සහභාගී කර ගැනීමට අපේක්ෂා කළ ද ගුරුවරුන් 19 දෙනෙකු පමණක් සහභාගී වී තිබුණි.

(ii) ගුරු පුහුණු වැඩසටහන් සඳහා ගුරුවරුන් සහභාගී කරගැනීම කලාප අධ්‍යාපන කාර්යාල හරහා විධිමත් ක්‍රමවේදයකට සිදුකළ යුතු වුවද එසේ සිදුකර නොතිබුණි.

4.2 කළමනාකරණ ක්‍රියාකාරකම්

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) ජීවන කුසලතාවයක් වශයෙන් ඉංග්‍රීසි දැනුම දියුණු කිරීම සඳහා වූ ව්‍යාපෘතිය (English as a Life Skill)

8 හා 9 ශ්‍රේණිවල ජීවන කුසලතාවයක් වශයෙන් ඉංග්‍රීසි දැනුම දියුණු කිරීම සඳහා 2014 වර්ෂයේදී ආරම්භ කර තිබූ මෙම ව්‍යාපෘතිය යටතේ ඩීවීඩී වැඩසටහන් 50 ක් නිෂ්පාදනය කිරීම සඳහා අධ්‍යාපන අමාත්‍යාංශය විසින් රු.4,500,000 ක මුදලක් ආයතනය වෙත ලබාදී තිබුණි. මේ සම්බන්ධයෙන් පහත නිරීක්ෂණ කරනු ලැබේ.

(i) ආයතනය විසින් රු.1,333,441 ක් වැයකර 8 හා 9 ශ්‍රේණි සඳහා පිළිවෙලින් වැඩසටහන් 15 ක් හා 9 ක් නිෂ්පාදනය කර තිබූ අතර එයින් 8 ශ්‍රේණියේ වැඩසටහන් 6 ක පමණක් අවසන් සංස්කරණ කටයුතු සිදුකර තිබුණි. 9 ශ්‍රේණියේ කිසිදු වැඩසටහනක අවසන් සංස්කරණ කටයුතු සිදුකර නොමැති බව ප්‍රගති වාර්තා අනුව නිරීක්ෂණය විය.

(ii) 2016 වර්ෂය අවසන් වන විටත් ඉහත සඳහන් ප්‍රගතිය හැරුණු විට ව්‍යාපෘතියෙන් ආයතනය හෝ අමාත්‍යාංශය බලාපොරොත්තු වූ අරමුණු කරා ළඟාවීමට නොහැකි වී තිබූ අතර රු.3,166,559 ක් වූ ඉතිරි මුදල නැවත අධ්‍යාපන අමාත්‍යාංශය වෙත 2014 දෙසැම්බර් 31 දින යවා තිබුණි.

(ආ) නැණස අධ්‍යාපනික වැඩසටහන

2008 ජනවාරි 17 දිනැති අංක අමප/08/0002/316/001 දරන අමාත්‍ය මණ්ඩල තීරණයට අනුව චන්ද්‍රිකා තාක්ෂණය හරහා අධ්‍යාපන නාලිකාවක් ආරම්භ කිරීමට අනුමැතිය ලබා දී තිබුණු අතර 2008 වර්ෂයේ සිට පෞද්ගලික සමාගමේ මූල්‍ය අනුග්‍රාහකත්වය මත අධ්‍යාපන අමාත්‍යාංශයේ සම්බන්ධීකරණයෙන් යුතුව මෙම වැඩසටහන සඳහා පාඩම් නිර්මාණය කිරීම ආයතනය වෙත පවරා තිබුණි. 2008 වර්ෂයේ සිට වර්ෂ 03 ක කාලයකට සහ 2011 වර්ෂයේ සිට වර්ෂ 03 ක කාලයකට ඉහත කී ආයතන ත්‍රිත්වය අවබෝධතා ගිවිසුම් අත්සන් කර තිබුණු අතර මේ සම්බන්ධයෙන් නිරීක්ෂණය වූ කරුණු පහත දැක්වේ.

(i) 2008 වර්ෂයේ සිට 2014 වර්ෂය දක්වා පාඩම් නිර්මාණය කිරීම ආයතනය විසින් සිදුකරන ලද අතර 2013 වර්ෂයේදී විෂය නිර්දේශ පදනම් කරගනිමින් විෂයයන්ට අදාල වැඩසටහන් 990 ක් ද සිංහල මාධ්‍ය පොදු හා කෙටි වැඩසටහන් ඇතුළුව සම්පූර්ණ වැඩසටහන් 2,115 ක් ද නිෂ්පාදනයට සැලසුම් කර තිබුණි. සමාගම විසින් රු.6,318,782 ක මුදලක් ලබා දී තිබුණ ද ආයතනය විසින් වැඩසටහන් 104 ක් පමණක් නිෂ්පාදනය කර තිබීම හේතුවෙන් අධ්‍යාපන අමාත්‍යාංශය විසින් මෙම කටයුත්ත ධර්මවාහිනී පදනම වෙත භාරදී තිබුණි.

(ii) වැඩසටහන ක්‍රියාත්මක කිරීම සඳහා සමාගම විසින් රු.1,489,338 ක් වටිනා සංස්කරණ යන්ත්‍රයක් 2013 ජනවාරි 17 දින ආයතනයට ලබාදී තිබුණු අතර මෙම වැඩසටහන අතරමඟ නවතා දමා තිබීම හේතුවෙන් මෙම යන්ත්‍රය මඟින් අපේක්ෂිත අරමුණු ඉටුකරගෙන නොමැති බව නිරීක්ෂණය විය.

(iii) 2015 වර්ෂයේ විකාශනය ආරම්භ කිරීමට නියමිතව තිබූ අ.පො.ස. (උසස් පෙළ) ඉංජිනේරු හා ජෛව තාක්ෂණවේදය විෂයට අදාල වැඩසටහන් නිෂ්පාදනය කිරීමටත් තාක්ෂණවේදය පාඩම් තිර පිටපත් ලියා 2015 ජූනි මාසයේදී අවසන් කිරීමටත් ආයතනය සැලසුම් කර තිබුණි. මේ සඳහා සමාගම ලබාදුන් තොරතුරුවලට අනුව සමාගම විසින් රු.1,058,800 ක මුදලක් ආයතනය වෙත ලබාදී තිබුණද තාක්ෂණවේදය විෂය ධාරාව විකාශනය කිරීමට අදාල පාඩම් සකස් කර ලබාදී විකාශනය ආරම්භ කිරීමට ආයතනය අසමත් වී තිබුණි.

(ඇ) 2012 ජූනි 02 දිනැති අමාත්‍ය මණ්ඩල තීරණයට අනුව රු.85,794,089 ක් වැයකර ආයතනය විසින් දකුණු ආසියාවේ ගුරුවරුන් පුහුණු කිරීමේ අරමුණින් මීපේ ප්‍රදේශයේ දකුණු ආසියානු ගුරුපුහුණු මධ්‍යස්ථානයක් ඉදිකර තිබුණි. අධ්‍යාපන අමාත්‍යාංශය හා එක්සත් ජාතීන්ගේ අධ්‍යාපන, විද්‍යාත්මක සහ සංස්කෘතික සංවිධානය (යුනෙස්කෝ) හා ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජය 2012 සැප්තැම්බර් මාසයේ එළඹ තිබුණු ගිවිසුමට අනුව අධ්‍යාපන අමාත්‍යාංශය හා ජාතික අධ්‍යාපන ආයතනය ක්‍රියා කළයුතු ආයතන වූ අතර ගිවිසුමේ 8 වන වගන්තිය අනුව යුනෙස්කෝ ආයතනය තාක්ෂණ සහාය ලබාදීමට එකඟ වී තිබුණි. 15 වන වගන්තිය අනුව ගිවිසුමේ කාලය වර්ෂ 06 ක් වන අතර මේ වනවිට වර්ෂ 04 කට අධික කාලයක් ඉක්ම ගොස් තිබුණ ද යුනෙස්කෝ තාක්ෂණ ආධාර ලබාගැනීමට සමාලෝචිත වර්ෂය

දක්වාම ආයතනය අපොහොසත්ව තිබුණි. මේ හේතුවෙන් මධ්‍යස්ථානය ඉදිකිරීමේ අපේක්ෂිත අරමුණු ඉටුවී නොතිබුණි.

(ඇ) වටිනාකම රු.78,600,000 ක්වූ හෙක්ටයාර් 7.0958 ක තැන්නකැලේවත්ත ඉඩම හා රු.65,000,000 ක් වටිනා බදුවත්ත (කහටහේන) ඉඩම ආයතනය වෙත පවරා ගැනීමට කටයුතු කර නොතිබුණි.

(ඉ) 2015 ජනවාරි 13 සිට 2016 සැප්තැම්බර් 21 දින දක්වා කාලය තුල ජාතික අධ්‍යාපන ආයතනයේ අලෙවි සැල තුල අලෙවිය සඳහා තිබුණු අලෙවි වටිනාකම රු.2,511,000 ක් වූ ප්‍රකාශන පිටපත් 10,872 ක විකුණුම් මිල ගණන් වල නිවැරදිතාවය පිළිබඳ විගණනයේදී ප්‍රශ්නකාරී විය.

(ඊ) මිනින්දෝරු දෙපාර්තමේන්තුව හා ජාතික අධ්‍යාපන ආයතනය එක්ව දිවයිනේ පාසල් 4,722 ක සිසුන් අතර බෙදාහැරීම සඳහා ජාතික සිතියම් සංග්‍රහය පිටපත් 10,000 ක මුද්‍රණ ඇණවුමක් රජයේ මුද්‍රණාලය වෙත 2015 සැප්තැම්බර් 29 දින භාරදී රු.2,442,000 ක මුදලක් 2015 නොවැම්බර් 09 දින ඒ වෙනුවෙන් ගෙවා තිබුණද පිටපත් 170 ක් 2016 දෙසැම්බර් 31 දින දක්වාම ලැබී නොතිබුණි. කෙසේ වුවද පිටපත් 4,775 ක් ලැබී මාස 09 ක් ඉක්ම ගොස් තිබුණද ඒවා පාසල් අතර බෙදා හැරීමකින් තොරව 2016 දෙසැම්බර් 31 දිනට ගබඩාවේ පැවතුණි.

(උ) ද්විතීය පදනම මත වසරක කාලයකට ජාතික අධ්‍යාපන ආයතනයේ නියෝජ්‍ය අධ්‍යක්ෂ ජනරාල් (පාලන හා මුදල්) තනතුරට පත්කර තිබුණු නිලධාරියාට 2016 පෙබරවාරි 16 දින සිට 2017 අගෝස්තු 15 දින දක්වා සහකාර අධ්‍යක්ෂවරයාගේ අනුමැතිය මත ආයතනයේ විදේශීය නේවාසිකාගාරයේ නේවාසික පහසුකම් සලසා දී තිබුණි. අංක 429 හා 2015 අප්‍රේල් 15 දිනැති අභ්‍යන්තර පාලන චක්‍රලේඛයට අනුව විදේශීය නේවාසිකාගාරයේ කාමරයක දිනක නේවාසික ගාස්තුව ලෙස රු.1,500 ක් අයකළ යුතු වුවද මාසයකට රු.1,500 ක් බැගින් රු.26,922 ක නේවාසිකාගාර ගාස්තුවක් පමණක් සමාලෝචිත වර්ෂය අවසානය වන විට අයකරගෙන තිබුණි. තවද ජල හා විදුලිය ගාස්තු වෙනුවෙන්ද කිසිදු මුදලක් ඔහුගෙන් අයකර නොතිබුණි.

(ඌ) ආයතන පරිශ්‍රයේ හා මීපේ ගුරු මධ්‍යස්ථාන පරිශ්‍රයේ පිහිටි නිල නිවාස 12 සඳහා වෙන්වෙන් වශයෙන් ජල මීටර සවිකර නොතිබීම නිසා එහි පදිංචි කිසිදු නිලධාරියෙකුගෙන් ජලය සඳහා ගාස්තු අයකර නොතිබුණි. එම නිල නිවාස ඇතුළුව සමස්ථ ආයතනය වෙනුවෙන් 2015 වර්ෂය සඳහා රු.2,210,384 ක් හා 2016 ජනවාරි

සිට දෙසැම්බර් මාසය දක්වා රු.3,036,711 ක් වශයෙන් එකතුව රු.4,405,128 ක ජල බිල්පත් ආයතනය විසින් ගෙවා තිබුණි.

(එ) අවශ්‍යතාවය හඳුනාගෙන මිලදී ගැනීම් සිදු නොකිරීම හේතුවෙන් 2016 වර්ෂයේ දී වටිනාකම රු.2,430,180 ක් වූ දේශන ශාලා පුටු 90 ක් හා මේස 90 ක් මිලදීගෙන එම මේස හා පුටු ස්ථානගත කිරීම සඳහා හොඳ තත්ත්වයේ පැවති දේශන ශාලා පුටු 213 ක් හා මේස 228 ක් එක් එක් අංශ වෙතින් විමසීම් සිදුකර අංශ 12 ක් වෙත බෙදාහැර තිබුණි.

(ඒ) ආයතනයේ පවතින ණයගැතියන්ගෙන් මුදල් අයකර ගැනීමේ අවිනිශ්චිතතාවයක් ඇති විට ණයගැති කාලවිශ්ලේෂණය හා ණය අයවීම් සමාලෝචනය කර බොල් ණය සඳහා ප්‍රතිපාදන ප්‍රමාණය තීරණය කළ යුතු වුවද, ඒ අනුව කටයුතු නොකර 2011 වර්ෂයේ සිට 2016 වර්ෂය දක්වාම රු.22,169 ක් ලෙස එකම වටිනාකමක් බොල්ණය ලෙස ප්‍රතිපාදනය කර තිබුණි.

4.3. අරමුදල් උපයෝජනය

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) අ.පො.ස. (උසස් පෙළ) තෝරාගත් විෂය සඳහා සම්පත් මූලාශ්‍ර ග්‍රන්ථ 06 ක් සකස් කිරීමට හා මුද්‍රණය කිරීමට 2014 වර්ෂයේදී ඕස්ට්‍රේලියානු රජයේ විදේශ කටයුතු හා වෙළඳ කටයුතු දෙපාර්තමේන්තු ආධාර (DFAT / (AUSAID) මඟින් රු.15,400,000 ක අරමුදලක්, ප්‍රතිපාදනය කර තිබුණි. එසේ ප්‍රතිපාදනය කර වර්ෂ 03 ක කාලයක් අවසන් වී තිබුණද, එම ග්‍රන්ථ මුද්‍රණ කටයුතු අවසන් නොකිරීම හේතුවෙන් සමාලෝචිත වර්ෂය අවසානය දක්වාම එම අරමුදල් ඌන උපයෝජිතව පැවතුණි.

(ආ) 2016 දෙසැම්බර් 31 දිනට ශේෂය රු.67,734,282 ක් වූ ණය අරමුදල නමින් අරමුදලක් පවත්වාගෙන යන අතර එහි අරමුණ විගණනයට පැහැදිලි නොවීය. කෙසේ වුවද එම අරමුදල ණය ලබාදීමට හෝ වෙනත් කාර්යයකට නොයොදවා ආපදා ණය පොලී බැර කරමින් දිගින් දිගටම පවත්වාගෙන යන බව නිරීක්ෂණය විය.

(ඇ) පර්යේෂණ හා සංවර්ධන කටයුතු වෙනුවෙන් 2011 වර්ෂයේදී රු.8,750,000 ක් වෙන්කර තිබුණද 2016 දෙසැම්බර් 31 දින වන තෙක්ම මෙම අරමුදල ප්‍රයෝජනයට ගෙන නොතිබුණි.

(ඈ) අරමුණුගත කාර්යයන්හි යොදවා ගැනීමකින් තොරව ආයතනයේ ජංගම ගිණුම් 03 ක සමාලෝචිත වර්ෂයේ රු.41,086,056 සිට සිට රු.90,418,980 ක දක්වා වූ පරාසයන්හි අවශ්‍යතාවය ඉක්මවා මුදල් ශේෂ පැවති බව නිරීක්ෂණය විය.

*

4.4 නිෂ්ක්‍රීය හා ඌන උපයෝජිත වත්කම්

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) විද්‍යුත් ප්‍රචාරණ අංශය විසින් විවිධ මාතෘකා යටතේ 2013, 2014 හා 2015 වර්ෂයන්හිදී වීඩියෝ වැඩසටහන් නිෂ්පාදන 90 ක් ද 2016 වර්ෂයේදී වීඩියෝ වැඩසටහන් 31 ක්ද නිෂ්පාදනය කර තිබුණද එම නිෂ්පාදනවල ගුණාත්මක තත්ත්වය පරීක්ෂා කර එම නිෂ්පාදනවලින් අධ්‍යාපන ක්ෂේත්‍රයට ඵලදායී ප්‍රයෝජනයක් ලබාගැනීමට කටයුතු කර නොමැති බව විගණනයට නිරීක්ෂණය විය.

(ආ) 2011 සහ 2012 වර්ෂවල නිෂ්පාදනය කරන ලද රු.775,375 ක් වටිනා කැසට් පටි 6,203 ක් ද සෞන්දර්ය හා අනෙකුත් දෙපාර්තමේන්තු විසින් විවිධ මාතෘකා යටතේ නිෂ්පාදනය කරන ලද රු.786,000 ක් වටිනා සංයුක්ත තැටි 4,798 ක් ද 2016 දෙසැම්බර් 31 දිනට අලෙවි නොවී ඉතිරිවී තිබුණු අතර වර්ෂ 05 ක පමණ කාලයක් තිස්සේ ඒවා අලෙවි සැලේ ගබඩා කර තිබුණි.

4.5 ප්‍රමාද වූ ව්‍යාපෘති

2008 වර්ෂයේදී ආයතනයේ තෙමහල් නේවාසිකාගාරයේ ඇස්තමේන්තු පිරිවැය රු.27,848,100 ක් වූ වැසිකිලි පද්ධතියක් ඉදිකිරීම වෙනුවෙන් සැලසුම් හා ඇස්තමේන්තු සකස් කිරීම සඳහා උපදේශක ගාස්තු ලෙස කොන්ත්‍රාත් වටිනාකමින් සියයට 05 ක් එනම් රු.1,200,949 ක් ගෙවා වසර 09 ක් ගතවී තිබුණු නමුත්, එහි ඉදිකිරීම් කටයුතු 2016 දෙසැම්බර් 31 දින වනවිටත් ආරම්භ කර නොතිබුණි.

4.6 කාර්ය මණ්ඩල පරිපාලනය

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) 2011 දෙසැම්බර් 22 දිනැති අංක DMS/B1/37/3/Vol III දරන කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුවේ ලිපියට අනුව ආයතනයේ අනුමත කාර්ය මණ්ඩලය 652 ක් වූ අතර තත්‍ය කාර්ය මණ්ඩලය 439 ක් විය. 2016 දෙසැම්බර් 31 දිනට තනතුරු 213 ක් පුරප්පාඩු වී පැවති අතර එම පුරප්පාඩු පිරවීම සඳහා සමාලෝචිත වර්ෂයේදී කටයුතු කර නොතිබුණි. ආයතනයේ පුරප්පාඩු වී තිබුණු තනතුරු වලින් 124 ක් ඉහළ කළමනාකරණයට අයත් තනතුරු වූ නිසාත් එම තනතුරු වලින් 104 ක ප්‍රමාණයක්

කථිකාචාර්යවරුන් වීම හේතුවෙන් දැයේ දරුවන්ට ගුණාත්මක අධ්‍යාපනයක් ලබාදීම සඳහා වන කාර්යභාරයේදී විෂයමාලා සංවර්ධනය, ගුරු අත්පොත් සකස්කිරීම ආදී කටයුතු සඳහා ජාතික අධ්‍යාපන ආයතනය වෙත පැවරී ඇති වගකීම් නිසිලෙස ඉටුකිරීමට ඇති හැකියාව නිසි අයුරු ඉටුවන්නේද යන්න විගණනයේදී ගැටළු සහගත විය.

(ආ) කළමනාකරණ සහකාරවරුන් 18 දෙනෙකුගේ තනතුරුවල පුරප්පාඩු පිරවීමටත් 2016 මාර්තු හා සැප්තැම්බර් මාසවල අතිරේක අධ්‍යක්ෂක ජනරාල් තනතුරක පුරප්පාඩුව හා අතිරේක නියෝජ්‍ය අධ්‍යක්ෂ ජනරාල්, අධ්‍යක්ෂ, ජ්‍යෙෂ්ඨ හා සහකාර කථිකාචාර්ය තනතුරු වල පුරප්පාඩු පිරවීම සඳහාත් කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුව විසින් 2015 මාර්තු මාසයේදී අනුමැතිය ලබා දී තිබුණි. ඒ සඳහා රු.399,599 ක් වැයකර ආයතනය විසින් 2015, 2016 වර්ෂවල පුවත්පත් දැන්වීම් පලකර තිබුණද එම පුරප්පාඩු පිරවීමට සමාලෝචිත වර්ෂය අවසන් වන විටත් ආයතනයට නොහැකිව තිබුණි.

(ඇ) ආයතනයේ පුරප්පාඩුව පැවතුන නියෝජ්‍ය අධ්‍යක්ෂ ජනරාල් තනතුරු 04 ක් හා අධ්‍යක්ෂ තනතුරු 14 ක් සඳහා ද්විතියන් පදනම සහ අනුයුක්ත පදනම මත තාවකාලික නිලධාරීන් පත්කර තිබුණු අතර ද්විතියන පදනම මත පත්කර තිබූ නිලධාරීන් සඳහා රු.1,061,558 ක දීමනා ගෙවා තිබුණි.

(ඈ) ආයතනයේ නියෝජ්‍ය අධ්‍යක්ෂ ජනරාල් සහ අධ්‍යක්ෂ තනතුරු 09 ක් සඳහා ස්ථිර නිලධාරීන් බඳවාගැනීම වෙනුවට 2015 හා 2016 වර්ෂවලදී වැඩබැලීමේ පත්වීම් ලබාදී වැඩබැලීමේ දීමනා ලෙස සමාලෝචිත වර්ෂයේදී රු.1,181,972 ක් ගෙවීම් කර තිබුණි.

(ඉ) සමාලෝචිත වර්ෂයේ අවසානය වනවිටත් සහකාර කථිකාචාර්ය තනතුරු 41 ක පුරප්පාඩු පැවති අතර එම පුරප්පාඩු පිරවීමට කටයුතු නොකර අනියම් හා කොන්ත්‍රාත් පදනම මත බඳවාගත් සහකාර කථිකාචාර්යවරුන් දෙදෙනෙකුට 2011 වර්ෂයේ සිට සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දක්වා රු.4,048,175 ක් දීමනා වශයෙන් ගෙවා තිබුණි.

(ඊ) 1993 මාර්තු 01 දින ව්‍යාපෘති නිලධාරියෙකු වශයෙන් සේවයට බැදී ඇති වැඩබලන නියෝජ්‍ය අධ්‍යක්ෂ ජනරාල් (විකල්ප අධ්‍යාපන) අවස්ථා ගණනකදී සේවයට වාර්තා කිරීම සහ වැටුප් රහිත නිවාඩු ලබාගැනීම සම්බන්ධයෙන් විවිධ අවවාද කිරීම් වලට

ලක්වී තිබුණි. මෙම නිලධාරියාගේ පෞද්ගලික ලිපිගොනුව අනුව 2010 වර්ෂයේදී හා 2012 සිට 2015 දක්වා වර්ෂයන්හි දින 168 ක් වැටුප් රහිත නිවාඩු ලබාගෙන ඇති අතර සමාලෝචිත වර්ෂය අවසාන වනවිටත් අතර එම වැටුප් රහිත නිවාඩු දින වෙනුවෙන් අයකර ගැනීම් සිදුකර නොතිබුණි.

(උ) 1985 අංක 28 දරන ජාතික අධ්‍යාපන ආයතන පනතේ 14 වගන්තියට අනුව ආයතන ශාඛාවේ ඉල්ලීම පිට රාජ්‍ය සේවයේ නියුක්ත යම් නිලධාරියෙකු රාජ්‍ය පරිපාලන අමාත්‍යාංශයේ ලේකම්ගේ එකඟත්වය සමඟ අදාල අමාත්‍යාංශයේ ලේකම්ගේ කැමැත්ත ඇතිව යම් කාලසීමාවකට හෝ ස්ථිරව හෝ නිලධාරියෙකු ආයතනය වෙත පත්කරනු ලැබිය හැකි වුවද ද්විතීයන පදනම මත බඳවාගෙන තිබුණු නිලධාරින් දෙදෙනෙකු සම්බන්ධයෙන් එලෙස අනුමැතියක් ලබාගෙන නොතිබුණි.

5. ගිණුම් කටයුතුභාවය හා යහපාලනය

5.1 ප්‍රසම්පාදන සැලැස්ම

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) ආයතනය වාර්ෂික ප්‍රසම්පාදන සැලැස්මට අනුව රු.47,135,565 ක වටිනාකමකට අයිතම 2,311 ක් මිලදීගැනීමට සැලසුම් කර තිබුණද එම ප්‍රමාණයෙන් භාණ්ඩ අයිතම 1,278 ක් එනම් මුළු ප්‍රමාණයෙන් සියයට 55 ක් රු.41,283,407 ක් වැයකර මිලදීගෙන තිබුණි.

(ආ) ආයතනය විසින් 2016 වර්ෂය සඳහා සකස්කරන ලද ප්‍රසම්පාදන සැලසුම ක්‍රියාත්මක කිරීමේදී සැලසුම් කළ අයිතම 753 ක් වෙනුවෙන් අයිතම 845 ක් මිලදීගෙන තිබුණි. එහිදී සැලසුම් කළ ප්‍රමාණයට වඩා භාණ්ඩ 136 ක් අඩුවෙන් ද භාණ්ඩ 228 ක් වැඩියෙන් ද මිලදීගෙන තිබුණු අතර ප්‍රසම්පාදන සැලසුම නිවැරදි කළමනාකරණ පාලන කාරක ලෙස භාවිතාකර නොතිබූ බව විගණනයේදී නිරීක්ෂණය විය.

5.2 අයවැය ලේඛනමය පාලනය

2016 වර්ෂයේ ඇස්තමේන්තුගත පුනරාවර්තන ආදායම් හා වියදම් තත්‍ය වටිනාකම් සමඟ සැසඳීමේදී සියයට 15 සිට 76 දක්වා පරාසයක විචලනයන් නිරීක්ෂණය වූයෙන් අයවැය ලේඛනය ඵලදායී කළමනාකරණ පාලන කාරකයක් ලෙස උපයෝගී කරගෙන නොතිබුණු බව නිරීක්ෂණය විය.

5.3 නොවිසඳී ඇති විගණන ඡේද

2009 ජූනි 01 දිනැති අංක 30 දරන කළමනාකරණ සේවා චක්‍රලේඛ (I) හා (II) ප්‍රකාරව ආයතනයේ මාණ්ඩලික ශ්‍රේණි හැර අනෙකුත් නිලධාරීන්ගේ වැටුප් පරිවර්තනය කිරීමේදී නිලධාරීන් 29 දෙනෙකු සඳහා 2009 ජනවාරි 01 සිට 2014 අප්‍රේල් 30 දක්වා රු. 1,209,220 ක වැටුපක් වැඩිපුර ගෙවා තිබූ අතර ඒ මත රු. 156,684 ක සේවක අර්ථ සාධක මුදල් ප්‍රේෂණය කර තිබූ බව ඉකුත් වර්ෂයේ වාර්තාවෙන් පෙන්වාදී තිබුණද සමාලෝචිත වර්ෂය අවසන් වනවිටත් ඒ සඳහා සුදුසු ක්‍රියාමාර්ගයක් ගෙන නොතිබුණි.

6. පද්ධති හා පාලනයන්

විගණනයේදී නිරීක්ෂණය වූ පද්ධති හා පාලන අඩුපාඩු වරින්වර අධ්‍යක්ෂ ජනරාල්වරයාට වරින්වර දැනුම්දෙන ලදී. පහත සඳහන් ක්ෂේත්‍ර කෙරෙහි විශේෂ අවධානය යොමු කළ යුතුය.

පද්ධති හා පාලන ක්ෂේත්‍ර	නිරීක්ෂණ
(අ) ගිණුම්කරණය	(i) ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුගත නොවීම. (ii) ගැණුම් ඇණවුම් නිකුත් කරන අවස්ථාවේදීම භාණ්ඩ ලැබීම ස්ථාවර වත්කම් ලෙස හඳුනාගෙන තිබීම. (iii) වත්කම් හා වගකීම් විෂයයන් නිවැරදිව හඳුනාගෙන ගිණුම්ගත නොකිරීම.

(iv) ගෙවිය යුතු වියදම් සඳහා නිවැරදි ඇස්තමේන්තු පිළියෙල නොකිරීම.

(ආ)	අයවැය පාලනය	තාත්විකව ඇස්තමේන්තුවල පිළියෙල නොකිරීම සහ වියදම් දැරීම අයවැය පාලනයෙන් තොරව සිදුකිරීම.
(ඇ)	තොග පාලනය	යල් පැනගිය, අක්‍රිය, තොග සම්බන්ධයෙන් අවශ්‍ය ක්‍රියාමාර්ග නොගැනීම හා පොත්පත් යාවත්කාලීන නොකිරීම.
(ඈ)	ප්‍රසම්පාදන ක්‍රියාවලිය	ප්‍රසම්පාදන මාර්ගෝපදේශවලට අනුකූලව කටයුතු නොකිරීම.
(ඉ)	වත්කම් කළමනාකරණය	ආයතනයට අයත් ඉඩම්, වාහන නිසි පරිදි පවරා නොගැනීම හා වත්කම් ඌන උපයෝජිතව පැවතීම සහ ඵලදායී ලෙස යොදා නොගැනීම.
(ඊ)	කාර්ය මණ්ඩල පරිපාලනය	පුරප්පාඩු නොපිරවීම, දීර්ඝ කාලයක් තනතුරුවල වැඩ බැලීමට නිලධාරීන් පත්කිරීම සහ ද්විතීයන පදනම මත හා අනුයුක්ත පදනම මත තාවකාලික නිලධාරීන් පත්කිරීම.
(උ)	රූපවාහිනී අධ්‍යාපනික වැඩසටහන් ක්‍රියාත්මක කිරීම	ඥානස අධ්‍යාපනික වැඩසටහන් සකස්කර විකාශන කටයුතු සිදුනොකිරීම.
(ඌ)	නේවාසිකාගාර පරිපාලනය	ඌන උපයෝජිත නේවාසිකගාර ඵලදායී ලෙස යොදානොගැනීම, නිසි පරිදි නඩත්තු නොකිරීම හා නේවාසිකාගාර කමිටු රැස්වීම් නොපැවැත්වීම

එච්.එම්.ගාමිණී විජේසිංහ

විගණකාධිපති

ජාතික අධ්‍යාපන ආයතනයේ 2016 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව 1971 අංක 38 දරණ මුදල් පනතේ 14(2))(සී) වගන්තිය ප්‍රකාර විගණකාධිපති වාර්තාව

පැහැදිලි කිරීම් :

2.2 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම

2.2.1 ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිති

(අ) ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත 06

2017 වර්ෂයේ අවසන් ගිණුම්වල මෙය නිවැරදි කිරීමට මුදල් අංශයට උපදෙස් ලබා දී ඇත

(ආ) ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත 07

මුදල් අමාත්‍යාංශයේ වත්කම් කළමනාකරණ චක්‍රලේඛ අංක 1/2017 චක්‍රලේඛය මගින් ඉල්ලා ඇති තොරතුරු ලබා දීම සඳහා ස්ථාවර වත්කම්වලට අදාළව තොරතුරු යාවත්කාලීන කරමින් පවතින අතර, එම තොරතුරු මත පදනම් ව ස්ථාවර වත්කම් ලේඛනය යාවත්කාලීන කෙරේ. මේ සඳහා ගබඩා තොරතුරු ලබා ගැනීමට කටයුතු කර ඇති අතර දැනට වාහන වෙනුවෙන් අවශ්‍ය තොරතුරු ලේඛන සකසා ඇත. යන්ත්‍ර උපකරණවල අවශ්‍ය තොරතුරු සකස් කිරීම ආරම්භ කර ඇත. මෙම තොරතුරු ලේඛන සම්පූර්ණ කිරීමත් සමග 2018 සැප්තැම්බර් 30 දින වන විට වත්කම් ප්‍රත්‍යාගණනය කර අවසන් කිරීමට කටයුතු කරනු ලැබේ.

(ඇ) ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත 09

2017 ගිණුම් වර්ෂයේ පොත් ගබඩාවේ තොගය පිරිවැයට ගණනය කර මූල්‍ය ප්‍රකාශනවල දැක්වීමට කටයුතු කරනු ලැබේ.

2.2.2 ගිණුම්කරණ ප්‍රතිපත්ති

2017 වර්ෂයේ ගිණුම්වල මෙය නිවැරදි කරනු ලැබේ.

2.2.3 ගිණුම්කරණ අඩුපාඩු

(අ) (i), (ii), (iii), (iv)

විගණන වාර්තාවේ දක්වා ඇති අඩුපාඩු 2017 මූල්‍ය ප්‍රකාශවල සැසඳීම් (Comparative Figures)යටතේ දැක්වීමට කටයුතු කරනු ලැබේ.

(ආ) 2017 වර්ෂයේ ගිණුම්වල මෙය නිවැරදි කිරීමට කටයුතු කරනු ලැබේ.

(ඇ) රු. 10,369,094/- ක් වටිනා ගුරු මාර්ගෝපදේශ ඉවත් කිරීම සඳහා ආයතන සභාවේ අනුමැතිය 2017 පෙබරවාරි මස ලැබී ඇති අතර ඒ සඳහා අපහරණ කමිටු පත් කර කාර්යය අවසන් කිරීමට නියෝජ්‍ය අධ්‍යක්ෂ ජනරාල් (පාලන මුදල් හා සහාය සේවා) වෙත උපදෙස් ලබා දී ඇත. මේ වනවිට අපහරණ කමිටු පත්කර කාර්යය ආරම්භ කර ඇත.

(ඈ) 2017 වර්ෂයේ ගිණුම්වල මෙය නිවැරදි කිරීමට කටයුතු කරනු ලැබේ.

(ඉ) ඉදිරියේ දී මෙවැනි අතපසුවීම් සිදු නොකරන ලෙස පොත් තබන්නාට උපදෙස් ලබා දී ඇත. 2017 වර්ෂයේ ගිණුම්වල මෙය නිවැරදි කරනු ලැබේ.

(ඊ) අදාළ සේවකයන්ගේ සේවයෙන් ඉවත්වීමේ ලිපි පරිපාලන දෙපාර්තමේන්තුව වෙතින් මුදල් අංශය වෙත නොලැබී තිබීම හේතුවෙන් මෙම පුද්ගලයින් සඳහා පාරිතෝෂික වෙන් කිරීම් සිදු වී ඇත. මේ පිළිබඳ අදාළ තොරතුරු මුදල් අංශය වෙත ලබා දීමට පරිපාලන දෙපාර්තමේන්තුව වෙත උපදෙස් දී ඇත. ඒ අනුව 2017 වර්ෂයේ අවසන් ගිණුම්වල අවශ්‍ය ගැලපීම් සිදු කිරීමට මුදල් අංශය වෙත උපදෙස් ලබා දී ඇත.

(උ) ආපදා ණය ගෙවීම කරනු ලබන්නේ මෙම අරමුදල මගිනි. එබැවින් පොළිය ද එම අරමුදලට වෙන් කර ඇත. 2017 ගිණුම් වර්ෂයේ දී මෙය ආදායමට ගැලපුම් කිරීමට කටයුතු කරනු ලැබේ.

2.2.4 පැහැදිලි නොකළ වෙනස්කම්

(අ) අත්තිකාරම් ගිණුම් සැසඳුම් කිරීමේ දී අතපසු වීමකින් උපලේඛනවල සටහන් නොවූ එහෙත් අවසන් ගිණුමේ සටහන් ව තිබූ ශේෂ නිවැරදි කිරීම 2017 වර්ෂයේදී සිදු කර ඇත (ඇමුණුම 01)

(ආ) පාඨමාලා ගාස්තු ලෙස ලැබූ මුදලින් ප්‍රතිශතයක් ලෙස ඉදිරියට ගෙවූ පාඨමාලා ගාස්තු ලෙස ගිණුම්වල සඳහන් කර ඇති අතර ගුරු අධ්‍යාපන දෙපාර්තමේන්තුවෙන් මුදල් අංශය වෙත ලැබී ඇති ප්‍රමාණය සමග සැසඳීමක් නොකළ බැවින් මෙය සිදු වී ඇත. ඉදිරියේ දී මෙම අඩුපාඩුව මගහරවා ගැනීමට කටයුතු කරනු ලැබේ.

2.3 ලැබිය යුතු හා ගෙවිය යුතු ගිණුම්

(අ) අධ්‍යාපන අමාත්‍යාංශයෙන් ලැබිය යුතු රු. 3,237,800/- ක මුදල පිළිබඳ ව 2016.12.27 දින අධ්‍යාපන අමාත්‍යාංශයේ දී පැවති විගණන හා කළමනාකරණ කමිටු රැස්වීමේ දී මේ සම්බන්ධ ව නැවතත් කරුණු සාකච්ඡා කරන ලදී. එහි දී මෙම කාර්යයට අදාළ ව ලබා දුන් ඇණවුම ඉදිරිපත් කරන ලෙස අමාත්‍යාංශයේ ප්‍රධාන මූල්‍ය නිලධාරි විසින් ජාතික අධ්‍යාපන ආයතනයට දැනුම් දී ඇත. එවැනි ඇණවුමක් නොමැති බැවින් මෙම මුදල කපා හැරීමට එකගතාව නැවත වරක් අධ්‍යාපන අමාත්‍යාංශය වෙත පළ කර ඇත. අධ්‍යාපන අමාත්‍යාංශයේ විවිධ ගිණුම් අංශය වෙත තොරතුරු ඉදිරිපත් කර ඇත. 2017.12.21 දින රැස්වූ ආයතන සභාව විසින් මෙය කපා හැරීමට නැවත තීරණය කරන ලදී.

රු. 595,122/= මුදල පහත පරිදි සැකසී ඇත.

පොදු අත්තිකාරම්	රු. 88,733.00
ණයගැතියෝ	රු. 506,389.00
එකතුව	රු. 595,122.00

ණයගැති ශේෂය පහත පරිදි වේ.

බී.ආර්.එම්. දයානන්ද	රු. 112,889/-
ජාතික කඩදාසි සංස්ථාව	රු. 318,500/-
මරණාධාර සමිතිය (ජා.අ.ආ)	රු. 75,000/-
එකතුව	රු. 506,389/-

ජාතික කඩදාසි සංස්ථාවෙන් අයවිය යුතු රු. 318,500/- ක මුදලින් රු. 10,560/- ක් ජාතික අධ්‍යාපන ආයතනය වෙත ලැබී ඇත. ජාතික කඩදාසි සංස්ථාවෙන් අයවිය යුතු ඉතිරි මුදල වන රු. 307,940/- අය කර ගැනීමට සිහි කැඳවීම් ලිපියක් යොමු කර ඇත.

බී.ආර්.එම්. දයානන්ද මහතාගෙන් වාරික වශයෙන් අයකිරීම් සිදු කරන අතර තවදුරටත් රු. 88,889/70 ක මුදලක් අය කර ගැනීමට නියමිතය.

(ආ)විගණන විමසුම අනුව මෙම මුදල පහත පරිදි සැකසී ඇත.

	මුලු වටිනාකම	වර්ෂ 05 ඉක්මවූ ශේෂ ප්‍රමාණය
ටෙන්ඩර් තැන්පතු	රු. 444,425.00	98,850.00
රඳවා ගත් තැන්පතු	රු 3,413,320.00	25,963.00
ආපසු ගෙවිය යුතු	රු. 170,825.00	18,025.00
පුරස්කාර	රු. 148,458.00	148,227.00
ප්‍රසම්පාදන බැඳුම්කර	රු. 1,083,955.00	77,230.00
එකතුව	රු.5,260,983.00	368,295.00

මෙම ගෙවිය යුතු වියදම් සඳහා අදාළ පුද්ගලයින්ගේ ඉල්ලීම් ලැබී නොමැති බැවින් ශේෂයක් පවතී. 2017 ගිණුම් වර්ෂයේ මෙය නිරවුල් කිරීමට පියවර ගනු ලැබේ.

2.4 නීති රීති රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවීම

(අ) ආයතන සංග්‍රහයේ II වැනි පරිච්ඡේදයේ 13.1.2 වගන්තිය

නියෝජ්‍ය අධ්‍යක්ෂ ජනරාල් (විකල්ප අධ්‍යාපන හා ගුරු අධ්‍යාපන) තනතුර සඳහා නිලධාරියකු බඳවා ගැනීමට 2017.06.12 දින පුවත්පත් දැන්වීමක් පළ කර ඇත.

ඒ අනුව අයදුම්පත් 11ක් ලැබී ඇති අතර සුදුසුකම් පරීක්ෂා කර සම්මුඛ පරීක්ෂණය සඳහා කැඳවීම් කරනු ලැබේ.

(ආ) 2006 රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 8.9.1 (ආ) ඡේදය

රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශය අනුව විධිමත් ගිවිසුම්වලට එළඹීමටත් සැපයුම් ප්‍රමාදය වලක්වාලීම සඳහා සැපයුම්කරුවන් දැනුවත් කිරීමටත් මුදල් අංශයේ නිලධාරීන් දැනුවත් කර, එසේ කිරීමට නියෝජ්‍ය අධ්‍යක්ෂ ජනරාල් (පාලන, මුදල් හා සහාය සේවා) වෙත උපදෙස් ලබා දී ඇත. මේ වන විට අදාළ පරිදි විධිමත් ගිවිසුම්වලට එළඹීම සිදු වේ.

3. මූල්‍ය සමාලෝචනය

3.1 මූල්‍ය ප්‍රතිඵල

පිළිගනිමි.

3.2 කාරක ප්‍රාග්ධන කළමනාකරණය

පිළිගනිමි.

3.3 ආයතනය විසින් ආරම්භ කර ඇති නෛතික සිද්ධි

(අ) එස්.ඒ.එම්.එස්.එන්. සෙනෙවිරත්න මිය

මෙම නිලධාරිනියට එරෙහි ව ගල්කිස්ස දිසා අධිකරණය යටතේ අංක 4801/05/M නඩුව පවරා ඇත.

මෙම නඩුවේ වික්තිකරුවන් සියරට හැර ගොස් ඇති බැවින් සිතාසි භාර දීමට නොහැකි වී ඇත. එම නිසා නඩුව බහා තබා ඇත.

ඒ.පී.එස්.එස්. පතිරණ මිය 7018/M නඩුව ගල්කිස්ස දිසා අධිකරණය

මෙම නඩුව 2017.08.11 දින අවසන් වී ඇත. නඩුවේ තීන්දුව ප්‍රකාශයට පත් කිරීමට පෙර විත්තිකාරිය විසින් ආයතනයට ගෙවිය යුතුව තිබූ රු 4,056,527/63 මුදල පිළිවෙලින් රු. 4,000,000/- ක් චෙක්පත් අංක 002668 මඟින් ද රු 56,527/-ක මුදලක් චෙක්පත් අංක 002670 දරන චෙක්පත් මඟින් ජාතික අධ්‍යාපන ආයතනයේ ගිණුමට බැර කර ඇත (ඇමුණුම 02).

කේ.ඩබ්.පී.ඒ. වීරවර්ධන මිය - 2320/16/M නඩුව - නුගේගොඩ දිසා අධිකරණය

මෙම නඩුව විභාග වෙමින් පවතී. මීළඟ නඩු දිනය 2018.01.30 දින වේ.

බී. කේ. විජේගුණවර්ධන මෙනවිය

නුගේගොඩ දිසා අධිකරණයේ මෙම නඩුව පවරා ඇත. නඩු අංකය 2706/17/M. නඩුව සඳහා මේ වන විටත් කැඳවීම් කර නැත.

4. මෙහෙයුම් සමාලෝචනය

4.1 කාර්ය සාධනය

(අ) (i) (ii) 2016 වසරේ සැලසුම් කරන ලද(i) හා (ii) යටතේ වූ කාර්යයන් ඉටු කර ඇති අතර පුහුණු වැඩසටහන්වලට කැඳවීම් කරනුයේ පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තු මඟින් බැවින් පුහුණුවන්නන්ගේ පැමිණීමේ අඩුකම ජාතික අධ්‍යාපන ආයතනයට පාලනය කළ නොහැක.

(iii) පළමු කෙටුම්පතට සකස් කර තිබූ දෙපාර්තමේන්තු 05ට අදාළ වර්තමාන තත්ත්වය

- **දෙමළ භාෂා දෙපාර්තමේන්තුව**

  13 ශ්‍රේණිය ගුරු මාර්ගෝපදේශය සකස් කිරීම

  13 ශ්‍රේණිය ගුරු මාර්ගෝපදේශය ශාස්ත්‍රීය කටයුතු මණ්ඩලයට ඉදිරිපත් කර අනුමැතිය ලබා අධ්‍යාපන ප්‍රකාශන දෙපාර්තමේන්තුවට 2017.12.13 දින යවා ඇත.

- **සමාජ විද්‍යා දෙපාර්තමේන්තුව**

  භූගෝල විද්‍යාව - 9 ශ්‍රේණිය

  සිංහල, දෙමළ, සහ ඉංග්‍රීසි මාධ්‍ය සඳහා ආයතන සභා අනුමැතිය ලැබී ඇත. මුද්‍රණය සඳහා අධ්‍යාපන ප්‍රකාශන දෙපාර්තමේන්තුවට යවා ඇත.

  භූගෝල විද්‍යාව - 13 ශ්‍රේණිය

  සිංහල සහ දෙමළ මාධ්‍ය ගුරු මාර්ගෝපදේශ සඳහා ශාස්ත්‍රීය කටයුතු මණ්ඩලයේ අනුමැතිය ලැබී ඇත. 2017 දෙසැම්බර් ආයතන සභාවට ඉදිරිපත් කර ඇත. සිංහල මාධ්‍යය ගුරු මාර්ගෝපදේශය 2017.12.29 දින ද, දෙමළ මාධ්‍ය ගුරු මාර්ගෝපදේශය 2018.01.05 දින අධ්‍යාපන ප්‍රකාශන දෙපාර්තමේන්තුවට භාර දී ඇත. ඉංග්‍රීසි මාධ්‍ය ගුරු මාර්ගෝපදේශයට 2018.01.09 දින පැවති ශාස්ත්‍රීය කටයුතු මණ්ඩලයේ අනුමැතිය ලැබී ඇත.

  9 හා 13 ශ්‍රේණිවල ඉතිහාසය ගුරු මාර්ගෝපදේශය සකස් කිරීම

  9 ශ්‍රේණිය ඉතිහාසය සිංහල, දෙමළ මාධ්‍යය ගුරු මාර්ගෝපදේශ ශාස්ත්‍රීය කටයුතු මණ්ඩලයට ඉදිරිපත් කර නිර්දේශය ලබා මුද්‍රණය සඳහා භාර දී ඇත. 13 ශ්‍රේණිය ඉතිහාසය සිංහල මාධ්‍යය සහ දෙමළ මාධ්‍යය 2018.01.09 දින පැවති ශාස්ත්‍රීය කටයුතු මණ්ඩලයට ඉදිරිපත් කරන ලදී. එහි දී සංශෝධන කීපයක් කිරීමට උපදෙස් ලැබී ඇත.

  පුරවැසි අධ්‍යාපනය 9 ශ්‍රේණිය

  සිංහල, දෙමළ සහ ඉංග්‍රීසි භාෂා තුනෙන්ම ගුරු මාර්ගෝපදේශ අධ්‍යාපන ප්‍රකාශන දෙපාර්තමේන්තුවට භාර දී ඇති අතර මුද්‍රණය අවසන් කර ඇත.

  දේශපාලන විද්‍යාව 12 ශ්‍රේණිය

  සිංහල හා දෙමළ මාධ්‍යය පිටපත් ශාස්ත්‍රීය කටයුතු මණ්ඩලයේ අනුමැතිය සහ ආයතන සභාවේ අනුමැතිය ලබා ඇත. මුද්‍රණය කිරීම සඳහා අධ්‍යාපන ප්‍රකාශන දෙපාර්තමේන්තුවට භාර දී ඇත.

තර්ක ශාස්ත්‍රය හා විද්‍යාත්මක ක්‍රමය 13 ශ්‍රේණිය

සිංහල, දෙමළ, සහ ඉංග්‍රීසි මාධ්‍ය සඳහා ශාස්ත්‍රීය කටයුතු මණ්ඩල අනුමැතිය ලැබී ඇති අතර ආයතන සභා අනුමැතිය ලැබී ඇත.

තර්ක ශාස්ත්‍රය හා විද්‍යාත්මක ක්‍රම 12 ශ්‍රේණිය

සිංහල, දෙමළ සහඉංග්‍රීසි මාධ්‍ය අධ්‍යාපන ප්‍රකාශන දෙපාර්තමේන්තුවට 2017.06.12 දින යවා ඇත.

- **ගණිත දෙපාර්තමේන්තුව**

13 ශ්‍රේණිය සංයුක්ත ගණිතය ගුරු මාර්ගෝපදේශය සකස් කිරීම

ශාස්ත්‍රීය කටයුතු මණ්ඩලය තීරණය කරන ලද පරිදි සංයුක්ත ගණිතය 12/13 විෂය නිර්දේශය නැවත දස පුද්ගල කමිටුවකට ඉදිරිපත් කිරීමට සිදු විය. දස පුද්ගල කමිටු තීරණය සහිත ව නැවත ශාස්ත්‍රීය කටයුතු මණ්ඩලයට ඉදිරිපත් කර නිර්දේශ ලබා ගෙන ආයතන සභාවට ඉදිරිපත් කර අනුමැතිය ලබා ගැනීම ප්‍රමාද විය.

13 ශ්‍රේණිය සංයුක්ත ගණිතය ඉංග්‍රීසි මාධ්‍යය ගුරු මාර්ගෝපදේශය සඳහා 2018.01.09 දින ශාස්ත්‍රිය කටයුතු මණ්ඩලයේ අනුමැතිය ලැබී ඇත.

- **වාණිජ්‍යය දෙපාර්තමේන්තුව**

13 ශ්‍රේණිය ගිණුම්කරණ විෂයය සඳහා ගුරු මාර්ගෝපදේශය සකස් කිරීම

ශාස්ත්‍රීය කටයුතු මණ්ඩලය තීරණය කරන ලද පරිදි ගිණුම්කරණය 12/13 විෂය නිර්දේශ නැවත දස පුද්ගල කමිටුවකට ඉදිරිපත් කිරීමට සිදු විය. දස පුද්ගල කමිටු තීරණය සහිතව නැවත ශාස්ත්‍රීය කටයුතු මණ්ඩලයට ඉදිරිපත් කර නිර්දේශ ලබා ගෙන ආයතන සභාවට ඉදිරිපත් කර අනුමැතිය ලබා ගැනීම ප්‍රමාද විය.

මේ වන විට ගිණුම්කරණය 13 ශ්‍රේණිය ගුරු මාර්ගෝපදේශය කෙටුම්පත් කර අවසන් කර ඇති අතර දස පුද්ගල කමිටුවට ඉදිරිපත් කර ඇත. නිර්දේශ ලද වහාම ශාස්ත්‍රිය කටයුතු මණ්ඩලයට ඉදිරිපත් කෙරේ.

13 ශ්‍රේණිය ව්‍යාපාර සංඛ්‍යානය විෂය සඳහා ගුරු මාර්ගෝපදේශය සකස් කිරීම

13 ශ්‍රේණිය ව්‍යාපාර අධ්‍යයනය විෂය සඳහා ගුරු මාර්ගෝපදේශය සකස් කිරීම

13 ශ්‍රේණිය ආර්ථික විද්‍යාව ගුරු මාර්ගෝපදේශය සකස් කිරීම

ශාස්ත්‍රිය කටයුතු මණ්ඩලය තීරණය කරන ලද පරිදි ඉහත විෂයයන් තුනට අදාළ 12/13 විෂය නිර්දේශ නැවත දස පුද්ගල කමිටුවකට ඉදිරිපත් කිරීමට සිදු විය. දස පුද්ගල කමිටු තීරණය සහිත ව නැවත ශාස්ත්‍රීය කටයුතු මණ්ඩලයට ඉදිරිපත් කර නිර්දේශ ලබා ගෙන ආයතන සභාවට ඉදිරිපත් කර අනුමැතිය ලබා ගැනීම ප්‍රමාද විය.

මේ වන විටඉහත විෂයය නිර්දේශ 13 ශ්‍රේණිය ගුරු මාර්ගෝපදේශය කෙටුම්පත් කර අවසන් කර ඇති අතර දස පුද්ගල කමිටුවට ඉදිරිපත් කර ඇත. නිර්දේශ ලද වහාම ශාස්ත්‍රිය කටයුතු මණ්ඩලයට ඉදිරිපත් කෙරේ.

- **සම්භාව්‍ය භාෂා, විදේශභාෂා හා ද්විභාෂා අධ්‍යාපන දෙපාර්තමේන්තුව**

12 ශ්‍රේණිය ජපන් භාෂාව සඳහා ගුරු මාර්ගෝපදේශය සකස් කිරීම

මෙම විෂය සඳහා සිටින සම්පත් දායකයන්ගේ ප්‍රමාණය සීමිත බැවින් ප්‍රමාදයක් සිදු වී ඇත. ගුරු මාර්ගෝපදේශය සකස් කර අදාළ අනුමැතීන් ලබා මේ වන විට මෙම පොත මුද්‍රණයට භාර දී ඇත.

13 ශ්‍රේණිය ජපන්, චීන, රුසියානු භාෂා සඳහා ගුරු මාර්ගෝපදේශය සකස් කිරීම

12 13 ශ්‍රේණිවලට අදාළ ඉහත විෂයයන්ගේ විෂය නිර්දේශ දස පුද්ගල කමිටුවකට ඉදිරිපත් කිරීමට තීරණය වූ බැවින් ශාස්ත්‍රීය කටයුතු මණ්ඩලයෙන් නිර්දේශය සහ ආයතන සභාවෙන් අනුමැතිය ලබා ගැනීමට ප්‍රමාද විය.

විෂය නිර්දේශ අනුමත වන තුරු ගුරු මාර්ගෝපදේශ ලිවීම ආරම්භ කළ නොහැකි වූ අතර ජපන්, චීන, රුසියන් භාෂා පොත් සඳහා ආයතන සභාවේ අනුමැතිය ලැබී ඇත. අධ්‍යාපන ප්‍රකාශන දෙපාර්තමේන්තුවට යවා ඇත.

අවසන් කෙටුම්පත සකස් කර තිබූ දෙපාර්තමේන්තු 04ට අදාළ වර්තමාන තත්ත්වය,

- **සෞන්දර්යය දෙපාර්තමේන්තුව**

කර්නාටක සංගීතය , චිත්‍ර , පෙරදිග සංගීතය , නාට්‍ය හා රංග කලාව ,නර්තනය

9 ශ්‍රේණිය ගුරු මාර්ගෝපදේශය මුද්‍රණය කර ඇත.
13 ශ්‍රේණිය ගුරු මාර්ගෝපදේශය මුද්‍රණයට යොමු කර ඇත.

භරත නාට්‍යය
9 හා 13 ශ්‍රේණිය ගුරු මාර්ගෝපදේශ මුද්‍රණයට යොමු කර ඇත.

බටහිර සංගීත
9 ශ්‍රේණිය ගුරු මාර්ගෝපදේශය මුද්‍රණයට යොමු කර ඇත.

- **ආගම් හා සාරධර්ම දෙපාර්තමේන්තුව**

13 ශ්‍රේණිය ඉස්ලාම් හා ඉස්ලාම් ශිෂ්ඨාචාරය සඳහා ගුරු මාර්ගෝපදේශ සකස් කිරීම

මෙම ගුරු මාර්ගෝපදේශ ශාස්ත්‍රීය කටයුතු මණ්ඩලයේ නිර්දේශය සඳහා ඉදිරිපත් කර ඇත. නිර්දේශය ලබා අධ්‍යාපන ප්‍රකාශන දෙපාර්තමේන්තුවට යවා ඇත.

13 ශ්‍රේණිය අරාබි විෂය සඳහා ගුරු මාර්ගෝපදේශය සකස් කිරීම

මෙම ගුරු මාර්ගෝපදේශය ශාස්ත්‍රීය කටයුතු මණ්ඩලයේ නිර්දේශය සඳහා ඉදිරිපත් කර ඇත. නිර්දේශය ලබා අධ්‍යාපන ප්‍රකාශන දෙපාර්තමේන්තුවට යවා ඇත.

- **සමාජ විද්‍යා දෙපාර්තමේන්තුව**

භූගෝල විද්‍යාව - 12 ශ්‍රේණිය

සිංහල මාධ්‍ය 2017.06.28 දින ද දෙමළ මාධ්‍යය 2017.07.06 දින ද ඉංග්‍රීසි මාධ්‍ය 2017.12.06 දින ද අධ්‍යාපන ප්‍රකාශන දෙපාර්තමේන්තුවට යවා ඇත.

ඉතිහාසය - 12 ශ්‍රේණිය

සිංහල මාධ්‍ය 2017.07.20 දින ද දෙමළමාධ්‍ය 2017.11.23 දින ද අධ්‍යාපන ප්‍රකාශන දෙපාර්තමේන්තුවට යවා ඇත.ඉතිහාසය විෂයය ඉංග්‍රීසි මාධ්‍යයෙන් සකස් නොකෙරේ.

දේශපාලන විද්‍යාව - 13 ශ්‍රේණිය

සිංහල සහ දෙමළ මාධ්‍ය නොවැම්බර් මස ශාස්ත්‍රීය කටයුතු මණ්ඩලයේ අනුමැතිය ලබා ඇත. ආයතන සභාවේ අනුමැතියට ඉදිරිපත් කර ඇත.

- **සම්භාව්‍ය භාෂා, විදේශභාෂා හා ද්විභාෂා අධ්‍යාපන දෙපාර්තමේන්තුව**

13 ශ්‍රේණිය ජර්මන් හා හින්දී, පාලි හා සංස්කෘත භාෂා සඳහා ගුරු මාර්ගෝපදේශය සකස් කිරීම

12 13 ශ්‍රේණිවලට අදාළ ඉහත විෂයයන්ගේ විෂය නිර්දේශ දස පුද්ගල කමිටුවකට ඉදිරිපත් කිරීමට තීරණය වූ බැවින් ශාස්ත්‍රීය කටයුතු මණ්ඩලයෙන් නිර්දේශය සහ ආයතන සභාවෙන් අනුමැතිය ලබා ගැනීමට ප්‍රමාද විය.

විෂය නිර්දේශ අනුමත වන තුරු ගුරු මාර්ගෝපදේශ ලිවීම ආරම්භ කළ නොහැකි වූ අතර මේ වන විට පාලි හා සංස්කෘත භාෂාවලට අදාළ ගුරු මාර්ගෝපදේශ මුද්‍රණයට භාර දී ඇත. ජර්මන් හා හින්දී භාෂා පොත් සඳහා ආයතන සභාවේ අනුමැතිය ලැබී ඇත. අධ්‍යාපන ප්‍රකාශන දෙපාර්තමේන්තුවට යවා ඇත.

(iv) **සිංහල භාෂා දෙපාර්තමේන්තුව**

සන්නිවේදන හා මාධ්‍ය අධ්‍යයනය 12 සහ 13 ශ්‍රේණි

සිංහල භාෂා දෙපාර්තමේන්තුව මගින් 12 සහ 13 ශ්‍රේණි සඳහා මෙම විෂය නිර්දේශ සකස් කර 12 ශ්‍රේණිය ගුරු මාර්ගෝපදේශය ශාස්ත්‍රීය කටයුතු මණ්ඩලයට ඉදිරිපත් කොට අනුමැතිය ලබා ඇතත් 2017.11.29 දින ජාතික අධ්‍යාපන ආයතනයේ 420 වන ආයතන සභා රැස්වීමේ දී මෙම විෂය නිර්දේශ හෝ ගුරු මාර්ගෝපදේශ ක්‍රියාත්මක කිරීම වසරකින් කල් දැමීමට තීරණය කර ඇත. ඒ අනුව 2008 වර්ෂයේ 12 - 13 ශ්‍රේණිවලට හඳුන්වා දී තිබූ අදාළ විෂය නිර්දේශයම 2019 වසර අ.පො.ස. (උ/පෙළ) සඳහා පෙනී සිටින සිසුන් සඳහා යොදා ගැනේ.

69 ශ්‍රේණිය ගුරු මාර්ගෝපදේශ සකස් කිරීම

6-9 ශ්‍රේණි සඳහා තොරතුරු තාක්ෂණ විෂය පාසලේ ක්‍රියාත්මක වන්නේ නැත. එය අලුතින් සකස් කරන විෂය නිර්දේශයකි. අදාළ විෂය නිර්දේශ සකස් කර ශාස්ත්‍රීය කටයුතු මණ්ඩලයට ඉදිරිපත් කළ විට සංශෝධන යෝජනා විය. ඇතුළත් කරන ලද සංශෝධන තවදුරටත් සකස් කිරීමට ශාස්ත්‍රීය කටයුතු මණ්ඩලයේ උපදෙස් ලැබුණි. ඒ අනුව 6,7,8,9 ශ්‍රේණි සඳහා විෂය නිර්දේශ ශාස්ත්‍රීය කටයුතු මණ්ඩලයට හා ආයතන සභාවට ඉදිරිපත් කර අනුමැතිය ලබා අධ්‍යාපන ප්‍රකාශන දෙපාර්තමේන්තුවට මුද්‍රණයට භාර දී ඇත.

(ආ) (i) නියමිත පරිදි පුහුණුවීම් සිදු කෙරෙමින් පවතී.

(ii) ගුරු පුහුණු වැඩ සටහන් සඳහා ගුරුවරුන් සහභාගි කර ගැනීම පළාත් අධ්‍යාපන කාර්යාල හරහා විධිමත් ක්‍රමවේදයකට සිදු කළ යුතු වුව ද, වාර්ෂික සැලැස්මට අනුව කළයුතු කටයුතු පමා වීම නිසා කෙටි කාලයක් තුළ පළාත් අධ්‍යාපන අධ්‍යක්ෂවරුන්ගේ වාචික අවසරය පමණක් ලබා ගෙන වැඩමුළුව පවත්වා ඇත. මේ පිළිබඳව අදාළ නිලධාරීන්ට අවවාද කර ඇත.

4.2 කළමනාකරණ ක්‍රියාකාරකම්

(අ) ජීවන කුසලතාවක් වශයෙන් ඉංග්‍රීසි දැනුම දියුණු කිරීම සඳහා වූ ව්‍යාපෘතිය(English as a life skill)

(i) මෙම ව්‍යාපෘතියේ පළමු අදියර ලෙස වැඩසටහන් 50ක් සාර්ථක ලෙස නිම කර අධ්‍යාපන අමාත්‍යාංශය වෙත භාර දී ඇත. අධ්‍යාපන අමාත්‍යාංශය විසින් එම වැඩසටහන් පිටපත් කර සියලු ම පළාත් කාර්යාල මගින් පාසල් පද්ධතියට ලබා දීමට කටයුතු කර ඇත. එම වැඩ සටහන් ජාතික රූපවාහිනිය මගින් විකාශය කිරීමට ද කටයුතු කර ඇත.

දෙවන පියවර ලෙස වැඩ සටහන් 24ක් සකස් කරන ලෙස අමාත්‍යාංශය ඉල්ලීමක් කරන ලද අතර, පසුව ව්‍යාපෘතිය අවසන් වූ බැවින්, කාර්යය අතරමග නතර වී ඇත.

(ii) ව්‍යාපෘතිය අවසන් වූ බැවින් දෙවන පියවරේ කටයුතු ද නවතා දැමීමට සිදු වූ අතර, ඒ අනුව ඉතිරි මුදල අධ්‍යාපන අමාත්‍යාංශය වෙත භාර දී ඇත.

කරන ලද පටිගත කිරීම් පුස්තකාල දර්ශන ලෙස තබා ගෙන අදාළ කාර්යයන්හිදී යොදා ගනු ලැබේ.

(ආ) නැණස අධ්‍යාපන වැඩසටහන

(i) අවබෝධතා ගිවිසුම ප්‍රකාර දිනකට පැය 12ක විකාශ කාලයක් ඩයලොග් ආසියාටා සමාගම මගින් ලබා දුන් නමුත් දිනපතා පැය 12 ක කාල සීමාවක් තුළ විකාශය සඳහා අලුත් වැඩසටහන් නිෂ්පාදනය කළ නොහැකි බව ජාතික අධ්‍යාපන ආයතනය ඩයලොග් ආසියාටා සමාගමට හා අධ්‍යාපන අමාත්‍යාංශයට පෙන්වා දී ඇත. ඒ අනුව දිනකට පැය 4 ක කාලයකට විකාශය කිරීම සඳහා වැඩසටහන් නිර්මාණය කළ ද වැඩසටහන් 2115 ක ප්‍රමාණයක් අවශ්‍ය බව අධ්‍යාපන අමාත්‍යාංශය විසින් පෙන්වා දී ඇත. එනමුදු එපමණ ප්‍රමාණයක් වසරක් තුළ නිෂ්පාදනයට අවශ්‍ය ධාරිතාව ජාතික අධ්‍යාපන ආයතනය සතු ව නොමැති බව එවකට සිටි අධ්‍යක්ෂ ජනරාල් විසින් පෙන්වා දී ඇත. මෙහි දී අධ්‍යක්ෂ ජනරාල්වරයා විසින් වසරකට වැඩසටහන් 100 ක් පමණක් නිෂ්පාදනය කර දීමට එකඟ වී ඇති අතර, ඒ සඳහා ඩයලොග් ආසියාටා ආයතනයෙන් මුදල් ලබා දෙන ලෙස ඉල්ලා ඇත. ඩයලොග් ආයතනය විද්‍යුත් ප්‍රචාරණ දෙපාර්තමේන්තුවට ලබා දී ඇත්තේ රු. මිලියන 2.7 ක චෙක්පතක් පමණි. එය අධ්‍යක්ෂ ජනරාල් නමින් යුත් ආයතන ගිණුමට බැර කර ඇත. වැඩ සටහන් නිෂ්පාදනය ධර්මවාහිනී පදනමට භාර දුන්න ද වර්තමානයේ දී ද ජාතික අධ්‍යාපන ආයතනය විසින් සකසන ලද වැඩසටහන් නැවත විකාශය වෙමින් පවතී.

(ii) සංස්කරණය සඳහා ලබා දී ඇති පරිගණකය යොදා ගනිමින් ජාතික අධ්‍යාපන ආයතනය වැඩසටහන් සංස්කරණ ක්‍රියාවලිය අඛණ්ඩව සිදු කරනු ලැබේ.

(iii) 2015 වර්ෂයේ දී විකාශය කිරීමට යෝජිත ව තිබූ උසස් පෙළ ඉංජිනේරු හා ජෛව තාක්ෂණවේදය විෂයට අදාළ ව වැඩසටහන් නිෂ්පාදනය සඳහා තිර පිටපත් රචනයට මුදල් ප්‍රතිපාදන ලබා දී එම කාර්යය ඉටු කළ ද වැඩසටහන් නිෂ්පාදනය සඳහා ප්‍රතිපාදන ලබා දී නොමැති බැවින් නිෂ්පාදන කාර්යය සිදු වී නොමැත.

(ඇ)2012 ජූනි 02 අමාත්‍ය මණ්ඩල තීරණයකට අනුව ඉදිකරන ලද දකුණු ආසියානු ගුරු සංවර්ධන මධ්‍යස්ථානය එක්සත් ජාතින්ගේ අධ්‍යාපන, විද්‍යාත්මක හා සංස්කෘතික සංවිධානය (UNESCO) II වන ගණයට අයත් ආයතනයක් ලෙස ස්ථාපිත කරන ලද අතර එහි කටයුතු සක්‍රීය කිරීමට ප්‍රමාද වූයේ කළමනාකරණ මණ්ඩලය සඳහා යුනෙස්කෝ සංවිධානයේ නියෝජිතයින් නම් කිරීම ප්‍රමාද වූ බැවිනි. මේ වන විට සියලුම කළමනාකරණ මණ්ඩල සාමාජිකයන් පත් කොට ඇති බැවින් මූලික පරිපාලන කාර්යයන් ක්‍රියාත්මක වෙමින් පවතී.

(i) කළමනාකරණ මණ්ඩලය 2017.03.31 දින රැස්වූ අතර, වාර්ෂික ක්‍රියාකාරී සැලැස්මක් සකස් කොට අවශ්‍යතාවන්හා අධ්‍යයන කටයුතු ක්‍රමවත් කිරීම සඳහා රාමුවක් සකස් කොට ඇත.

(ii) අධ්‍යාපන ලේකම් විසින් කාර්ය මණ්ඩලය මූල්‍ය ප්‍රතිපාදන හා සංවිධාන ව්‍යුහය සකස් කිරීම සඳහා විශේෂ කමිටුවක් පත් කොට රැස්වීම් වාර දෙකක් පවත්වා ඇත.

(iii) උක්ත කමිටුවේ යෝජනා හා නිර්දේශ කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුවට යොමු කිරීමට විශේෂඥ උපදෙස් සඳහා යොමු කොට ඇත.

(iv) යුනෙස්කෝ තාක්ෂණික ආධාර වශයෙන් උපදේශකවරුන්ගේ සහාය ලබා ගැනීමට කටයුතු කර ඇති අතර පහත සඳහන් උපදේශකවරුන්ගේ තාක්ෂණික යෝජනා ලබා ගැනීමට කටයුතු කර ඇත.

- Mr. Shigeru Aoyagi, Director, Unesco, South Asia
- Sri A. Shanthah Mathew. Secretary, NCTE, India
- Mr. Muhammed Rafique Tahire, Educational Adviser, Ministry of Fedral Eduction, Pakistan
- Mr. Muhmudul Islam, Joint Secretary, Ministry of Education, Bangaladesh

(v) මෙම මධ්‍යස්ථානය සඳහා ගොඩනැගිලි ඉදිකිරීමෙන් අනතුරු ව එම ගොඩනැගිල්ල අධ්‍යාපන නායකත්ව සංවර්ධන හා කළමනාකරණ පීඨය විසින් සංවිධානය කරනු ලබන දේශීය / විදේශීය පාඨමාලා, සම්මේලන, වැඩමුලු සහ දේශන සඳහා භාවිත කරනු ලබන බැවින් ගොඩනැගිල්ල අධ්‍යාපනික කටයුතු සඳහා උපරිම අයුරින් යොදා ගැනීමට කටයුතු කොට ඇත.

වැඩසටහන් කිරීම සඳහා අදාළ යාන්ත්‍රණය අධ්‍යාපන අමාත්‍යාංශය විසින් සකස් කර ලබා දීමට නියමිතය.

(ඈ) මහරගම ජාතික අධ්‍යාපන ආයතනයේ අක්කර 17. 53 ක බිම් ප්‍රමාණයෙන් යුත් තැන්නකැලේ වත්ත ඉඩම පවරා දීම සම්බන්ධයෙන් මහරගම ප්‍රාදේශීය ලේකම් විසින් ලබා දී ඇති උපදෙස් අනුව මෙම ඉඩම සම්බන්ධයෙන් අධ්‍යාපන අමාත්‍යාංශය මඟින් කැබිනට් පත්‍රිකාවක් ඉදිරිපත් කිරීම සඳහා මෙම ඉඩම පිළිබඳ අවශ්‍ය විස්තර ලබා ගැනීමට ඉඩම් අමාත්‍යාංශයේ ලේකම් වෙත දන්වා ඇත.

ජාතික අධ්‍යාපන ආයතනයට අයත් මීපේ පිහිටි අක්කර 16. 1625 ක බදුවත්ත නොහොත් කහටහේන වත්ත පවරා ගැනීමට අදාළ විස්තර පාදුක්ක ප්‍රාදේශීය ලේකම්ගේ විමසීමට අනුව ඉඩම් කොමසාරිස් ජනරාල් දෙපාර්තමේන්තුව වෙතින් විස්තර විමසීම් කර ඇත.

2017.10.24 දින අධ්‍යාපන අමාත්‍යංශයේ පැවති විගණන කළමනාකරණ කමිටු රැස්වීමේදී කැබිනට් පත්‍රිකාවක් ඉදිරිපත් කර ජාතික අධ්‍යාපන ආයතනයට නීත්‍යානුකූල ව පවරා ගත යුතු බවට තීරණය විය.

(ඉ) විගණන වාර්තාව මගින් පෙන්වා දී ඇති කරුණු අනුව මුද්‍රණ වියදම විධිමත් පරිදි ගණනය කිරීමේ ක්‍රමවේදය සකස් කිරීම සඳහා අවශ්‍ය පියවර ගන්නා ලෙස නියෝජ්‍ය අධ්‍යක්ෂ ජනරාල් (විද්‍යා හා තාක්ෂණ) වෙත උපදෙස් ලබා දී ඇත.

(ඊ) මිනින්දෝරු දෙපාර්තමේන්තුව වෙතින් ජාතික අධ්‍යාපන ආයතනය වෙත ලැබිය යුතු ව තිබූ හිඟ සිතියම් පොත් 170 ජාතික අධ්‍යාපන ආයතනයට ලැබී ඇත. ඒ අනුව සිතියම්පොත් 10,000 සම්පූර්ණයෙන් ම ලැබී ඇත.

2017.12.31 වන විට සියලුම පොත් බෙදා හැරීමට කටයුතු සිදු කළ අතර, පළාත් තුනක් පමණක් පොත් රැගෙන යාමට පැමිණ නැත (ඌව, සබරගමුව, නැගෙනහිර).

සබරගමුව පළාතට අදාළ පොත් 2018.01.10 දින රැගෙන ගොස් ඇත.

(උ) 2016 පෙබරවාරි 16 වන විට එවකට සිටි අධ්‍යක්ෂ ජනරාල්ගේ වාචික නියෝගය පරිදි විදේශ නේවාසිකාගාරයේ කාමර 01ක් නේවාසිකවීම සඳහා නියෝජ්‍ය අධ්‍යක්ෂ ජනරාල් (පාලන, මුදල් හා සහාය සේවා) වෙත ලබා දී ඇත. එම නිලධාරි මහතාගෙන් නේවාසික ගාස්තු අය කර ගැනීමට කටයුතු කර ඇත.

මේ පිළිබඳ ව ආයතනයේ පාලක මණ්ඩලය විසින් පහත තීරණය ගනු ලැබූ අතර ඒ අනුව අදාළ නිලධාරියාට විදේශ නේවාසිකාගාරයෙන් ඉවත් වන ලෙස ලිඛිත ව දන්වන ලදී. නියෝජ්‍ය අධ්‍යක්ෂ ජනරාල් 2017.08.15 දින විදේශ නේවාසිකාගාරයෙන් ඉවත් වී ඇති අතර දැනට එම මහතා ආයතනයේ සේවයේ නොයෙදේ.

(ඌ) ජාතික අධ්‍යාපන ආයතනයේ මහරගම හා මීපේ පරිශ්‍රයන්හි පිහිටි නිල නිවාසවල පදිංචි ව සිටින කාර්යය මණ්ඩලයෙන් ජල ගාස්තු අය කර නොමැති බව පිළිගනිමි.

විගණන විමසුම මගින් පෙන්වා දී ඇති කරුණු අනුව මෙම නිල නිවාස සඳහා ජල ගාස්තු අයකර ගැනීමටකටයුතු කරනු ලැබේ.

(එ) ආයතනයේ පැවති දේශනශාලා වායුසමීකරණ යන්ත්‍ර, බහුමාධ්‍ය ප්‍රක්ෂේපණ යන්ත්‍ර ආදිය සවි කර නවීකරණය කිරීමේ දී එම දේශනශාලාවල පැවති පුටු සහ මේස ඉවත් කිරීමට සිදු වී ඇත.ඒවායින් තවදුරටත් භාවිතයට ගත හැකි පුටු සහ මේස ඒවා අවශ්‍ය වන දෙපාර්තමේන්තුවලින් විමසා ලබා දී ඇත.

(ඒ) 2010 වර්ෂයේ පවතින ශේෂය ඉදිරියට ගෙනවිත් ඇති බැවින් ගිණුම්වල සඳහන් වේ. 2017 වර්ෂයේ ගිණුම්වල එය නිවැරදි කිරීමට පියවර ගනු ලැබේ. රාජ්‍ය ආයතනයක් වශයෙන් අයවිය යුතු කිසිදු මුදලක් මහා භාණ්ඩාගාරයේ අනුමැතියකින් තොර ව බොල් ණය ලෙස හඳුනා ගත නොහැකි ය. එබැවින් අනුමැතිය ලැබෙන පරිදි බොල්ණය ප්‍රතිපාදන කරනු ලැබේ.

4.3 අරමුදල් උපයෝජනය

(අ) ඕස්ට්‍රේලියානු රජය මගින් පිරිනමනු ලබන අරමුදලක් (Aus Aid) ප්‍රතිපාදනය යටතේ අ.පො.ස. (උසස් පෙළ)තෝරා ගත් විෂය කිහිපයක් සඳහා විෂයමාලා ද්‍රව්‍ය සැකසීමආරම්භ කළ අතර 2014 වර්ෂයේ දී පහත සඳහන් පොත් සකස් කිරීමට නියමිත ව තිබුණි. මේ පිළිබඳ ව වර්තමාන තත්ත්වය පහතින් දක්වා ඇත.

දෙපාර්තමේන්තුව	විෂයය	සම්පත් පොත	ප්‍රශ්නෝත්තර සංග්‍රහය
සිංහල	සිංහල	අදාළ නොවේ.	ශාස්ත්‍රීය කටයුතු මණ්ඩලයේ හා ආයතන සභාවේ අනුමැතිය ලබා ගෙන ඇත. 2017.10.26 දින මුද්‍රණයට භාර දී ඇත.
දෙමළ	දෙමළ	අදාළ නොවේ.	අවසන් කර වෙබ් අඩවියට නිකුත් කර ඇති අතර, මුද්‍රණයට භාර දී ඇත.
සමාජ විද්‍යා	භූගෝල විද්‍යාව	අදාළ නොවේ.	ශාස්ත්‍රීය කටයුතු මණ්ඩලයේ අනුමැතිය ලබා ඇත. (සිංහල/දෙමළ/ඉංග්‍රීසි) සිංහල,දෙමළ,ඉංග්‍රීසි මාධ්‍යය පොත් සඳහා ආයතන සභාවේ අනුමැතිය ලැබී ඇත. 2017.10.24 දින සිංහල මාධ්‍ය පොත මුද්‍රණයට භාර දී ඇත. 2017 දෙසැම්බර් 13 දින දෙමළ මාධ්‍ය පොතද 2017.12.14 දින ඉංග්‍රීසි මාධ්‍ය පොතද මුද්‍රණයට භාර දී ඇත
විද්‍යා	ජීව විද්‍යාව	2017 හඳුන්වාදෙන නව විෂය නිර්දේශයට ගැලපෙන පරිදි සංස්කරණය කරමින් පවති.	2017 හඳුන්වා දෙන නව විෂය නිර්දේශයට ගැලපෙන පරිදි සංස්කරණය කරමින් පවති.
	රසායන විද්‍යාව	2017 හඳුන්වාදෙන නව විෂය නිර්දේශයට ගැලපෙන පරිදි සංස්කරණය කරමින් පවති.	2017 හඳුන්වා දෙන නව විෂය නිර්දේශයට ගැලපෙන පරිදි සංස්කරණය කරමින් පවතී.
	භෞතික විද්‍යාව	2017 හඳුන්වාදෙන නව විෂය නිර්දේශයට ගැලපෙන පරිදි සංස්කරණය කරමින් පවති.	2017 හඳුන්වා දෙන නව විෂය නිර්දේශයට ගැලපෙන පරිදි සංස්කරණය කරමින් පවතී.
ගණිත	සංයුක්ත ගණිතය	ඉංග්‍රීසි මාධ්‍යය I හා II කොටස් 2017.09.08 දින පැවති ශාස්ත්‍රීය කටයුතු මණ්ඩලයට ඉදිරිපත් කර අනුමැතිය ලබා ඇත. සිංහල හා දෙමළ මාධ්‍යය සඳහා ඊළඟ ශාස්ත්‍රීය කටයුතු මණ්ඩලයට ඉදිරිපත් කිරීමට නියමිත ය.	ඉංග්‍රීසි මාධ්‍යය සඳහා ශාස්ත්‍රීය කටයුතු මණ්ඩල අනුමැතිය ලැබී ඇත. සිංහල හා දෙමළ මාධ්‍යය අනුමැතිය සඳහා ඊළඟ ශාස්ත්‍රීය කටයුතු මණ්ඩලයට ඉදිරිපත් කිරීමට නියමිත ය.
තාක්ෂණ අධ්‍යාපන	කෘෂි විද්‍යාව	අදාළ නොවේ.	ශාස්ත්‍රීය කටයුතු මණ්ඩලය සහ ආයතන සභාව විසින් අනුමත කර ඇත. 2016.07.07 දින මුද්‍රණයට භාර දී ඇත (සිංහල/දෙමළ/ඉංග්‍රීසි මාධ්‍යය)
	ජෛව පද්ධති තාක්ෂණ වේදය	අදාළ නොවේ.	සිංහල හා දෙමළ මාධ්‍යය පිටපත් ශාස්ත්‍රීය කටයුතු මණ්ඩලය සහ ආයතන සභාව විසින් අනුමත කර ඇත. 2017 සිට නව විෂය නිර්දේශය හඳුන්වා දීම නිසා මෙම ග්‍රන්ථය මුද්‍රණයට බාර දී නොමැති අතර, 2017.07.20 දින අන්තර්ජාලයට පමණක් එකතු කර ඇත.

තාක්ෂණ අධ්‍යාපන	තාක්ෂණවේදය සඳහා විද්‍යාව	අදාළ නොවේ.	ශාස්ත්‍රීය කටයුතු මණ්ඩලය සහ ආයතන සභාව විසින් අනුමත කර ඇත. (සිංහල සහ දෙමළ මාධ්‍යය) 2016 වර්ෂයේ දී මුද්‍රණයට භාර දී ඇත. සිංහල මාධ්‍යය පිටපත මුද්‍රණය කර අලෙවියට තබා ඇත.
ව්‍යාපාර අධ්‍යයනය	ගිණුම්කරණය	2015 වර්ෂයේ දී ශාස්ත්‍රීය කටයුතු මණ්ඩලයට ඉදිරිපත් කර අනුමැතිය ලබා ගෙන ඇත. ආයතන සභාවේ අනුමැතිය ලබා ගැනීමට නියමිතව තිබුණි. නැවත වරක් 2018.01.09 දින පැවති ශාස්ත්‍රීය කටයුතු මණ්ඩලයට ඉදිරිපත් කර අනුමැතිය ලැබී ඇත.	සිංහල මාධ්‍යය ප්‍රශ්නෝත්තර සංග්‍රහය 2018.01.09 දින පැවති ශාස්ත්‍රීය කටයුතු මණ්ඩලයට ඉදිරිපත් කර අනුමැතිය ලැබී ඇත.
	ආර්ථික විද්‍යාව	2015 වර්ෂයේ දී ශාස්ත්‍රීය කටයුතු මණ්ඩලයට ඉදිරිපත් කළ අතර එය නැවත සකස් කර ඉදිරිපත් කරන ලෙස උපදෙස් ලබා දුන් අතර 2017 හඳුන්වා දෙන නව විෂය නිර්දේශයට ගැලපෙන පරිදි සකස් කර දස පුද්ගල කමිටුවට ඉදිරිපත් කර ඇත. එම නිර්දේශ අනුව සකසා ඇත. 2018.01.09 දින පැවති ශාස්ත්‍රීය කටයුතු මණ්ඩලයේ අනුමැතිය ලැබී ඇත.	සිංහල මාධ්‍යය ප්‍රශ්නෝත්තර සංග්‍රහය 2018.01.09 දින පැවති ශාස්ත්‍රීය කටයුතු මණ්ඩලයට ඉදිරිපත් කර අනුමැතිය ලැබී ඇත.

ඉහත සඳහන් පොත් පිළිබඳ ව අවශ්‍ය ඉදිරි කටයුතු සිදු කිරීම සඳහා නියෝජ්‍ය අධ්‍යක්ෂ ජනරාල් (භාෂා මානව ශාස්ත්‍ර හා සමාජ විද්‍යා) හා වැ.බ. නියෝජ්‍ය අධ්‍යක්ෂ ජනරාල් (විද්‍යා හා තාක්ෂණ) වෙත උපදෙස් ලබා දී ඇත.

(ආ) සේවක ණය අරමුදල සැකසී ඇත්තේ ආයතනයේ සේවකයන්ට ණය ලබාදීමෙන් ලැබූ පොළිය සහ ආයතනයේ ආදායමෙන් මාරු කරන ලද මුදල්වලිනි. ආයතනයේ සේවකයන්ට ණය ලබා දෙනු ලබන්නේ මෙම අරමුදල මගිනි. එම අරමුදලට අදාළ බැංකු ගිණුමේ පවතින මුදල්වලින් ණය මුදල් ලබා දෙනු ලැබේ. ඒ සඳහා ඒකාබද්ධ අරමුදලින් මුදල් නොලැබේ.

2017 වර්ෂයේ අවසන් ගිණුම් සකස් කිරීමේ දී සමුච්චිත අරමුදලට ගැලපීමට කටයුතු කරනු ලැබේ.

(ඇ) 2017.09.27 දින පැවති 58 වන විගණන සහ කළමනාකරණ කමිටු රැස්වීමේ දි මේ පිළිබඳ ප්‍රගතිය සාකච්ඡා කරන ලදී.

බාහිර පර්යේෂකයන් විසින් යොමු කරන යෝජනා අනුව පර්යේෂණ ප්‍රදාන සඳහා මෙම අරමුදල ප්‍රයෝජනයට ගැනේ. 2017 වසර තුළ පර්යේෂණ ප්‍රදාන 04ක් සඳහා නිර්ණායක සූදානම් කර, ආයතන සභාවේ අනුමැතිය ලබා ගෙන ඇත. බාහිර පර්යේෂකයන්ගෙන් පර්යේෂණ යෝජනා ලබා ගැනීමට අවශ්‍ය පුවත්පත් දැන්වීම් 2017.06.14 වන දින දිනමිණ, තිනකරන් හා Daily Newsයන පුවත්පත් තුනේ පළ කර ඇත.

පුවත්පත් දැන්වීමට අනුව පර්යේෂණ ප්‍රදාන සඳහා ඉල්ලුම් පත්‍ර අටක් ලැබී ඇත. එම ඉල්ලුම්පත්‍ර සමාලෝචනයට භාජනය කර පර්යේෂණ 03 ක් තෝරා ගෙන ඒ සඳහා ප්‍රදාන ලබා දී ඇත.

පර්යේෂණ අරමුදල ඉදිරි වර්ෂ සඳහා ද අඛණ්ඩ අරමුලක් ලෙස පවත්වා ගෙන යනු ලබන අතර 2018 වසරේදී ද ප්‍රදාන සඳහා යොදා ගනු ලැබේ.

(ඇ) ආයතනයේ ජංගම ගිණුම්වල ඉතිරිව තිබූ මුදලින් රු.මි. 70 ක් 2017.10.04 දින ස්ථාවර තැන්පතුවල ආයෝජනය කර ඇත.

4.4 නිෂ්ක්‍රීය හා ඌණ උපයෝජිත වත්කම්

(අ) 2013, 2014, 2015 යන වර්ෂයන්හිදි වීඩියෝ වැඩසටහන් නිෂ්පාදනය ජාතික අධ්‍යාපන ආයතනය විසින් අඛණ්ඩ ව සිදු කර ඇත. මේ අනුව නැණස නාලිකාවේ විකාශය සඳහා කරන ලද ඉල්ලීම්වලට අනුකූල ව අවම පිරිවැයකින් උපරිම ගුණාත්මක තත්ත්වයක වැඩසටහන් නිෂ්පාදනය කර ඇත. නැණස නාලිකාවේ විකාශන කාල සීමාවේ දී එම වැඩසටහන් ඒ සඳහා භාවිත කර ඇත. වර්තමානයේ දී ද එම වැඩ සටහන් නැණස නාලිකාවේ නැවත විකාශනය කෙරේ. එසේ ම ආයතනයේ දෙපාර්තමේන්තුවල ඉල්ලීම්වලට අනුව ඉටු කරන ලද වැඩ සටහන් පිටපත් සකසා එම දෙපාර්තමේන්තුවල පුහුණු කාර්යය සඳහා භාවිතයට යොමු කර ඇත. විශේෂ ඉල්ලුමක් පවතින වැඩසටහන් විද්‍යා හා තොරතුරු තාක්ෂණ දෙපාර්තමේන්තුව මගින් පිටපත් සකසා විකිණීමට කටයුතු කර ඇත.

(ආ) 2011 සහ 2012 වර්ෂවල නිෂ්පාදිත සංයුක්ත තැටි මේ වන විටත් අලෙවි වන අතර කැසට් යන්ත්‍ර භාවිතය අවම වී ඇති බැවින් කැසට් පට අලෙවිය නතර වී ඇත.

2017.09.27 දින පැවති 58 වන විගණන සහ කළමනාකරණ කමිටු රැස්වීමේ දී මේ පිළිබඳ සාකච්ඡා කරන ලදී.

- ඉතිරිව ඇති සංයුක්ත තැටි අධ්‍යාපන අමාත්‍යාංශයේ බටහිර සංගීතය ඒකකය සමග සාකච්ඡා කර පාසල්වලට බඳවා ගත් නව ගුරුවරුන් මගින් සිසුන් වෙත ලබා දීම සුදුසු බවට යෝජනා විය.

4.5 ප්‍රමාද වූ ව්‍යාපෘති

2008 වර්ෂයේදී ආයතනය මඟින් ලබා දුන් ප්‍රමාණ පත්‍රිකා වලට අනුව මුළු වියදම රු.මිලියන 28ක් වූ අතර 2017 වර්ෂයේදී නැවත ලබා ගත් ප්‍රමාණ පත්‍රිකා අනුව වියදම රු. මිලියන 63ක් බව උපදේශක ආයතනය ඇස්තමේන්තු කර තිබුණි.

අධ්‍යාපන අමාත්‍යංශයේ 2017.07.21 දින පැවති විගණන කළමනාකරණ කමිටු දෙවන කාර්තු රැස්වීමේ දී අධ්‍යක්ෂ (පාසල් ගොඩනැගිලි) හා සම්බන්ධ වී මෙහි වගකීම පිළිබඳ අධ්‍යයනයක් සිදු කර වාර්තාවක් ඉදිරිපත් කරන ලෙස ජාතික අධ්‍යාපන ආයතනයේ අධ්‍යක්ෂ (ඉංජිනේරු සේවා) වෙත අධ්‍යාපන ලේකම් තුමා උපදෙස් ලබා දී ඇත.

ඒ අනුව අධ්‍යාපන අමාත්‍යාංශයේ අතිරේක අධ්‍යක්ෂ (පාසල් ගොඩනැගිලි), සිවිල් ඉංජිනේරු (පාසල් ගොඩනැගිලි) සහ ජාතික අධ්‍යාපන ආයතනයේ අධ්‍යක්ෂ (ඉංජිනේරු සේවා) විසින් අදාළ ගොඩනැගිල්ල පරික්ෂා කර වාර්තාවක් සකස් කර ඇත.

එම වාර්තාවේ සඳහන් නිර්දේශ හා යෝජනා අනුව උපදේශක සේවා ආයතනය විසින් ලබා දුන් ඇස්තමේන්තුව දැනටමත් සංශෝධනය කිරීමට අවශ්‍ය කටයුතු සිදු කර ඇත. ඒ සඳහා අධ්‍යාපන අමාත්‍යංශයේ පාසල් ගොඩනැගිලි අංශයේ කාර්මික නිලධාරීන්ගේ සහයද ලබා දී ඇත.

උපදේශක විසින් ලබා දී ඇති වාර්තාව භාවිතා කර එහි ඇති යෝජනා අනුව ඉදිරි කටයුතු සිදු කිරීමටත් ඒ අනුව ප්‍රසම්පාදන කටයුතු කිරීමටත් 2017.10.24 දින අධ්‍යාපන අමාත්‍යංශයේ පැවති විගණන හා කළමනාකරණ කමිටු රැස්වීමේ දී තීරණය විය.

මෙම කාර්යය 2018 වර්ෂයේදී ඉටු කර ගැනීම සඳහා 2018 වාර්ෂික සැලසුමට ඇතුළත් කර ප්‍රතිපාදන වෙන් කර ගැනීමට කටයුතු කර ඇත.

4.6 කාර්ය මණ්ඩල පරිපාලනය

(අ) (ආ) DMS/B1/37/3/Vol III අංක හා 2011.12.22 දිනැති කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුවේ ලිපියෙහි 08 වගන්තිය අනුව පුරප්පාඩු පිරවීම සඳහා එම දෙපාර්තමේන්තුවේ අනුමැතිය ලබාගත යුතු වේ. එහි දී,

1. ජාඅආ/පාමු/පිසේ/121/27/2015/2016උප/ 2015.12.01 දිනැති ලිපියෙන් තනතුරු 108ක් සඳහා අනුමැතිය ලබා ගැනීමට යොමු කර තිබුණි.
2. 2016.02.29 දිනැති ව නැවත තනතුරු 201ක් සඳහා අනුමැතිය ලබා ගැනීමට යොමු කර තිබුණි.
3. 2016.09.09 දිනැති ව තනතුරු 190ක් සඳහා අනුමැතිය ලබා ගැනීමට යොමු කර තිබුණි.

4. අංක DMS/1501 හා 2016.09.30 දිනැති ලිපිය මගින් තනතුරු 79ක් පිරවීම සඳහා පමණක් අනුමැතිය ලැබුණි.

අනුමැතිය ලද තනතුරුවලින් ඉල්ලුම් පත්‍ර කැඳවා සම්මුඛ පරීක්ෂණ පවත්වා අධ්‍යක්ෂ තනතුරු 04ක් සඳහා පත්වීම් කර ඇත. ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය තනතුරු සඳහා අයදුම්පත් කැඳවා සම්මුඛ පරීක්ෂණ පවත්වා 22 කට අභ්‍යන්තර උසස්වීම් ලෙස පත්වීම් ලබා දී ඇත. කථිකාචාර්ය තනතුරු සඳහා සම්මුඛ පරීක්ෂණ පවත්වා 08 දෙනෙකුට අභ්‍යන්තර උසස්වීම් ලෙස පත්වීම් ලබා දී ඇත. සහකාර කථිකාචාර්ය තනතුරු සඳහා සම්මුඛ පරීක්ෂණ පවත්වා 25 දෙනෙකුට පත්වීම් ප්‍රදාන කර ඇත. පොත් තබන්නා තනතුර පත්කර ඇත.

කළමනාකරණ සහකාර සම්මුඛ පරීක්ෂණ පවත්වා ඇත. රියදුරු සම්මුඛ පරීක්ෂණය 2017.11.13 දින පවත්වා ඇත.

නියෝජ්‍ය අධ්‍යක්ෂ ජනරාල් (පාලන මුදල් හා සහාය සේවා) අයදුම්පත් කැඳවා සම්මුඛ පරීක්ෂණ පවත්වා පත්වීම් සිදු කර ඇත. ඉතිරි තනතුරු සඳහාපුවත්පත් දැන්වීම් පළ කර ඇති අතර සම්මුඛ පරීක්ෂණ පවත්වා පත්වීම් සිදු කිරීමට කටයුතු සංවිධානය කර ඇත.

(ඇ) පුරප්පාඩු පැවැති අධ්‍යක්ෂ තනතුරු සඳහා පත් කිරීම් සිදු කිරීමට කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුවේ අනුමැතිය ලබා දීම ප්‍රමාද වූ නිසා එවකට සිටි අධ්‍යක්ෂ ජනරාල්වරයා විසින් වැඩ බැලීමේ පදනම මත තාවකාලික පත් කිරීම් සිදු කර ඇත.

විගණන වාර්තාවේ සඳහන් කර ඇති රු. 1,061,558/- ක දීමනා ගෙවා ඇති ද්විතීයන පදනම මත පත් කර ඇති අධ්‍යාපන පරිපාලන සේවයේ නිලධාරින් සඳහා පත්වීම් ලබා දී ඇත්තේ ආයතන සභාවේ සභාපති වන අධ්‍යාපන ලේකම් විසිනි.

(ඈ) මෙම පත් කිරීම් සිදු කර ඇත්තේ හිටපු අධ්‍යක්ෂ ජනරාල් විසිනි. සේවා අවශ්‍යතාව සලකා කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුවේ අනුමැතිය ලැබී පුරප්පාඩු පුරවන තෙක් පමණක් මෙම පත්වීම් ලබා දී ඇත.

2016.09.30 දින කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුවේ අනුමැතිය ලද වහාම අධ්‍යක්ෂ තනතුරු සඳහා සම්මුඛ පරීක්ෂණ පවත්වා පත්වීම් ලබා දීම ආරම්භ කර ඇත.

- 2016.12.19 දින පැවති සම්මුඛ පරීක්ෂණ ප්‍රතිඵල මත ආයතන සභා අනුමැතිය ලබා ගෙන වැටුප් අංක 870 එම්. ඒ. ජී. ඩබ්ලිව්. කුලරත්න මහතා ද , වැටුප් අංක 980 එම්. ආර්. ඩබ්ලිව්. මද්දුම මහතාද අධ්‍යක්ෂ තනතුරුවලට පත් කර ඇත.
- අධ්‍යක්ෂ (මුදල්) තනතුර සඳහා නිලධාරිනියක් 2016.12.01 දින පත් කර ඇති බැවින් වැටුප් අංක 0080 බී. සී. කේ. ගුණවර්ධන මහතා 2016.12.01 දින සිට අධ්‍යක්ෂ (මුදල්) තනතුරේ වැඩ බැලීමේ කටයුතු සිදු නොකරයි.
- වැටුප් අංක 0597 ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය ඩබ්. එම්. ඒ. බී. විජේසූරිය මහතා 2016.11.11 දින විශ්‍රාම ලබා ඇත.
- වැටුප් අංක 1307 ජී. එච්. අශෝකා මිය සම්බන්ධ විමර්ශණ කාර්යයන් පවතින බැවින් එය අවසන් වන තුරු පත්වීම පිළිබඳ ව ආයතන සභා තීරණය ලබා දී නොමැත.

(ඉ) වැටුප් අංක 1443 සහිත කොන්ත්‍රාත් පදනමෙහි සේවය කළ නිලධාරි 2016.11.30 දින සේවයෙන් ඉල්ලා අස් වී ඇත. වැටුප් අංක 1373 සහිත නිලධාරිනිය 2017.04.30 දින සේවය අවසන් කර ඇත. අනුමැතිය ලද සහකාර කථිකාචාර්ය තනතුරු 25 සඳහා සම්මුඛ පරීක්ෂණ පවත්වා පත්වීම් ලබා දී ඇත.

(ඊ) පිළිගනිමි.

අයවිය යුතු ව ඇති මුදල් අයකර ගැනීම සඳහා මුදල් අංශය වෙත නැවත තොරතුරු ලබා දෙන ලෙස අධ්‍යක්ෂ (පරිපාලන හා මානව සම්පත්) වෙත උපදෙස් ලබා දී ඇත.

(උ) ද්විතීයන පදනම මත බඳවා ගෙන ඇති වැටුප් අංක : 1307, 0870 යන නිලධාරින්ගේ අදාළ මුදාහැරීම් සඳහා ලිපි යවා ඇත. පසුව විධිමත් ව ස්ථිර ව බඳවා ගෙන ඇත.

5. ගිණුම් කටයුතුභාවය හා යහපාලනය

5.1 ප්‍රසම්පාදන සැලැස්ම

(අ) ප්‍රසම්පාදන සැලැස්මේ සඳහන් කාර්යාලයීය උපකරණ සහ ලී බඩු මිල දී ගැනීම සඳහා ප්‍රධාන වශයෙන් ප්‍රතිපාදන වෙන් කර තිබුනේ TSEP හා DFAT යටතේ වුව ද එම ප්‍රතිපාදන ලැබීම ප්‍රමාද වීම නිසා ප්‍රාග්ධන භාණ්ඩ මිල දී ගැනීම සඳහා වන මූලික කටයුතු ආරම්භ කිරීමට ප්‍රමාද විය.

රජයේ ප්‍රමුඛ වැඩ සටහනක් ලෙස ක්‍රියාත්මක කිරීමට නියමිත 13 වසරක අඛණ්ඩ අධ්‍යාපන වැඩ සටහන හා සම්බන්ධ කටයුතු ආරම්භ කිරීමට අවශ්‍ය උපකරණ (කාර්යාලයීය ලී බඩු, ඡායා පිටපත් යන්ත්‍ර, පරිගණක, පරිගණක මුද්‍රණ යන්ත්‍ර, RISO යන්ත්‍ර, තාක්ෂණ උපකරණ වැනි) මිල දී ගැනීමට ප්‍රමුඛතාව ලබා දී කටයුතු කිරීමට සිදු වීම නිසා එම භාණ්ඩවලට ප්‍රමුඛතාව අවසන් මොහොතේ ලබා දීමට සිදු විය.

(ආ) ආයතනයේ කාර්යාලයීය අවශ්‍යතා අනුව මිල දී ගැනීම් සිදු කිරීමේ දී මෙම තත්ත්වය ඇති වී ඇත. කෙසේ නමුත් ඉදිරියේ දී ප්‍රසම්පාදන සැලැස්ම අනුව මිල දී ගැනීම් සිදු කිරීමට කටයුතු කරනු ලැබේ.

5.2 අයවැය ලේඛනමය පාලනය

මෙබඳු විචලනයක් පෙන්නුම් කරන්නේ ආයතනයේ මූල්‍ය ප්‍රකාශනවල සමහර වියදම් වර්ග කරන ආකාරය අයවැය ලේඛනයේ අයිතම වලට වඩා වෙනස් වන බැවිනි. එම නිසා 2017 වර්ෂයේ සිට මූල්‍ය ප්‍රකාශන සකස් කිරීමේදී අයවැය ලේඛණයේ වියදම් අයිතමවලට සමගාමීව මූල්‍ය ප්‍රකාශනවල අයිතම යොදා ගැනීමට උපදෙස් ලබා දෙනු ලැබේ.

<u>**ආදායම**</u>

ආයතනයේ ආදායම

අය වැය ලේඛනයෙහි සඳහන් වන්නේ ආයතනය විසින් පවත්වනු ලබන විවිධ පාඨමාලාවලින් ලැබෙන ආදායමින් අදාළ වසර තුළ වියදම් දැරීමට අපේක්ෂා කරන මුදලයි. මෙහි තත්‍ය වටිනාකම ලෙස සඳහන් කර ඇත්තේ එම වසර තුළ ආදායම් ලෙස ලැබී ඇති මුදල් ප්‍රමාණයයි.

<u>**පුද්ගල පඩිනඩි දීමනා**</u>

වැටුප් හා වේතන :

මෙහි තත්‍ය වටිනාකම ලෙස දක්වා ඇත්තේ වැටුප් හා වේතන (0103) මුදල පමණි. එම මුදලට විශ්‍රාම වැටුප් සඳහා දායකත්වය (0116) සේවක අර්ථසාධක අරමුදල සඳහා ආයතනයේ දායකත්වය (0112) සේවක භාරකාර අරමුදල සඳහා වන 3% දායකත්වය (0113) වශයෙන් වුරු. 28,777,357ක් එකතු විය යුතු ය. එවිට තත්‍ය වියදම විය යුත්තේ රු. 295,497,078කි. ඒ අනුව විචලනය 0.2% කි.

අතිකාල හා නිවාඩු දින වැටුප්

2016 වර්ෂයේ අවසන් කාර්තුවේ දී රජයේ ප්‍රමුඛ වැඩ සටහනක් ලෙස 13 වසරක අඛණ්ඩ අධ්‍යාපන වැඩ සටහන හා සම්බන්ධ විෂයමාලා සංවර්ධන කටයුතු ආයතනයට පැවරීම සහ කාර්ය මණ්ඩල හිඟය නිසා අතිකාල සඳහා අපේක්ෂා කළ ප්‍රමාණයට වඩා වියදමක් දැරීමට සිදු වීම මෙම විචලනයට හේතුවයි.

<u>**ගමන් වියදම්**</u>

විදේශීය :

විදේශ ගමන් වියදම් සඳහා වූ වියදම ලෝක බැංකු ප්‍රතිපාදන යටතේ සැලසුම්කර තිබුණ ද එම ප්‍රතිපාදන ලැබීම ප්‍රමාදවීම නිසා සැලසුම් කළ කෙටිකාලීන වැඩසටහන් කීපයක් ක්‍රියාත්මක කිරීමට ප්‍රමාණවත් කාලයක් නොතිබීම මෙම විචලනයට හේතුවයි.

දේශීය ඃ

විෂයමාලා සංවර්ධන කටයුතු ඉටුකරන්නේ ලෝක බැංකු ව්‍යාපෘතියක් වන TSEP +DFAT ප්‍රතිපාදන යටතේ වුව ද එම ප්‍රතිපාදන ලැබීම ප්‍රමාද වීම නිසා සැලසුම් කළ ක්ෂේත්‍ර නිරීක්ෂණ වැඩසටහන් ක්‍රියාත්මක නොකිරිම ඉහත විචලනය සඳහා හේතු වී ඇත.

<u>සැපයුම් හා පාරිභෝගික ද්‍රව්‍ය ඃ</u>

ලිපිද්‍රව්‍ය හා අනෙකුත් කාර්යාලයීය ද්‍රව්‍ය

2016 වර්ෂය තුළ ESDPප්‍රතිපාදන යටතේ අවසන් කිරීමට සැලසුම් කර තිබූ අතිරේක විෂයමාලා ද්‍රව්‍ය කීපයක් නියමිත පරිදි අවසන් කර ශාස්ත්‍රීය කටයුතු මණ්ඩලයේ අනුමැතිය ලබා ගැනීමට ප්‍රමාද වීම නිසා එම අදාළ ග්‍රන්ථ මුද්‍රණය කිරීමට ප්‍රමාද වීම මේ සඳහා හේතු විය.

නමුත් එම මුද්‍රණ කටයුතු 2017 වර්ෂයේ දී අවසන් කිරීමට කටයුතු සැලසුම් කර ඇති නිසා ඊට අදාළ මුදල 2017 වර්ෂයේ දී භාවිත කිරීමට රඳවා ගෙන ඇත.

නඩත්තු

	වාහන වියදම් (රු.)	කාර්යාලයීය උපකරණ (රු.)
අයවැයගත වටිනාකම ඃ	4,500,000	5,500,000
තත්‍ය වටිනාකම ඃ	6,992,754	8,857,112

මේ යටතේ ඇති තත්‍ය වියදම් තුළ මූලධන ප්‍රතිපාදන යටතේ ඇති පුනරුත්ථාපන හා වැඩිදියුණු කිරීම්වලට අයත් ප්‍රතිපාදනවලින් කරන ලද වියදම් ද ඇතුළත් වීම තුළින් (වියදම් වර්ගීකරණය තුළ) මෙම තත්ත්වය ඇති වී තිබේ.

<u>**ගිවිසුම්ගත සේවා**</u>

තැපැල් හා ප්‍රචාරණ ද්‍රව්‍ය

විගණන වාර්තාවෙහි සඳහන් තැපැල් හා ප්‍රචාරණ වියදම් අඩු වීමට හේතු වී ඇත්තේ 2016 වසර තුළ ආරම්භ කිරීමට නියමිත ව තිබූ ප්‍රධාන පාඨමාලාවල ඇගයීම් ක්‍රියාවලිය විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවේ සම්භාර අගයට (Credit system) ගැලපෙන අයුරින් සංශෝධන කිරීම සහ පාඨමාලා අන්තර්ගතවල යම් යම් සංශෝධන සිදු කිරීමට සිදු වීම නිසා පාඨමාලා සඳහා බඳවා ගැනීමට පුවත්පත් දැන්වීම් පළ නොකිරීමයි.

ආරක්ෂක වියදම් හා පිරිසිදු කිරීමේ සේවා වියදම්

මෙහි තත්‍ය වියදම අඩුවීමට හේතුව වූයේ ගිවිසුම්ගත සම්පූර්ණ ගෙවීම් නොගෙවීම නිසයි (කාර්ය අතපසු කිරීම, නියමිත සේවක සංඛ්‍යාව නොසිටීම වැනි හේතු නිසා) ප්‍රධාන වශයෙන් මෙම ගෙවීම් ඇස්තමේන්තු කර ඇත්තේ ආයතනයේ උපයන ආදායම් තුළිනි.

<u>**මෙහෙයුම් වියදම්**</u>

කාර්ය මණ්ඩල සුභ සාධන වියදම්

සේවක සුභ සාධක ගිණුමේ සටහන් ව ඇති රු. 750,000/- ට අමතර ව රු. 597,920/-ක වියදම් සේවක සුභසාධන වැය ශීර්ෂයෙන් දරා ඇත.

මේ අනුව සේවක සුභසාධන වියදම් සඳහා දරා ඇති සම්පූර්ණ වියදම රු. 1,347,920/- කි.

5.3 නොවිසඳී ඇති විගණන ඡේද

මැතක දී විශ්‍රාම ගිය හා ඉවත් වූ කාර්ය මණ්ඩලයට පාරිතෝෂික දීමනා ගෙවන විට වැඩිපුර ගෙවූ වැටුප අය කර ගැනීම සඳහා අදාළ පාරිතෝෂික දීමනා මුදලින් ගණනය කරන ලද මුදල අඩු කර ගෙන ඉතිරි මුදල් ගෙවා ඇත.

සේවයෙන් ඉවත් වන කාර්ය මණ්ඩලයට අවසන් ගෙවීම් සිදු කිරීමේ දී වැඩිපුර ගෙවා තිබූ වැටුප් අඩු කර ගෙන ගෙවීම් සිදු කර ඇත.

වර්තමාන කාර්ය මණ්ඩලයේ සාමාජිකයින්ට වැඩිපුර ගෙවා ඇති මුදල් වාරික ව අයකර ගැනීම සඳහා පහත ක්‍රියාමාර්ගය අනුව කටයුතු කර ඇත.

අයවිය යුතු මුදල වසර 10කින් අය කර ගැනීම සඳහා ආයතන සභා අනුමැතිය ලැබී ඇති අතර, මුදල් රෙගුලාසි ප්‍රකාර ව මේ සඳහා මුදල් අමාත්‍යාංශ ලේකම්ගේ අනුමැතිය ලබා ගැනීමට ලිපියක් 2017.03.15 දින යොමු කර ඇති අතර, 2017.06.06 දින ද නැවත ලිපියක් මුදල් අමාත්‍යාංශයේ ලේකම් වෙත යොමු කර ඇත.

වැඩිපුර වැටුප් ගෙවා තිබූ විශ්‍රාම ගිය නිලධාරී පී. ඒ. කොඩිප්පිලි මහතා වෙත මුදල් ආපසු ගෙවන ලෙස ලිපියක් 2014.10.14 දින යොමු කර ඇති අතර, ඊට ප්‍රතිචාරයක් නොවූයෙන් 2016.09.21 දින ද නැවත ලිපියක් යොමු කර ඇත. පිළිතුරු ලැබී නොමැත. මේ පිළිබඳව 2017.09.27 දින පැවති 58 වන විගණන සහ කළමනාකරණ කමිටු රැස්වීමේ දී ද සාකච්ඡා කර ඇත.

එහි දී පී. ඒ. කොඩිප්පිලි මහතා වෙත වැඩිපුර ගෙවා ඇති මුදල් සම්බන්ධ ව සමථ මණ්ඩලයට යොමු කළ බව නීති නිලධාරී දැනුම් දෙන ලදි. කොඩිප්පිලි මහතාගේ පත්වීම් ලිපියේ සඳහන් කර ඇති වැටුප නිවැරදි ද යන්න පරික්ෂා කර ආයතනයට පැමිණ සාකච්ඡා කිරීමෙන් අනතුරු ව සමථ මණ්ඩලයට පැමිණීමට නියමිත බව නීති නිලධාරී දැනුම් දෙන ලදී. කොඩිප්පිලි මහතාගෙන් අදාළ විස්තර ලබා ගෙන වැටුප් කොමිසම සමග සාකච්ඡාවට කටයුතු කරන බව නීති නිලධාරී පවසන ලදී. එම තීරණය අනුව නැවත මුදල් ගෙවීමට ඒ මහතා කැමැත්ත ප්‍රකාශ කළ බව නීති නිලධාරී පවසන ලදී. කොඩිප්පිලි මහතාට හිමි හිග පාරිතෝෂික මුදල් ද ගෙවා නොමැත.

අදාළ මුදල් නැවත අය කර ගැනීමට කටයුතු කරන ලෙස විගණන හා කළමනාකරණ කමිටු සභාපති විසින් අධ්‍යක්ෂ (මුදල්) වෙත උපදෙස් ලබා දී ඇත.

6. පද්ධති හා පාලනයන්

(අ) ගිණුම්කරණය

විගණනය විසින් දක්වා ඇති ගිණුම්කරණ දෝෂ මින් ඉදිරියට ඇති නොවන පරිදි කටයුතු කරන ලෙස අධ්‍යක්ෂ (මුදල්) වෙත උපදෙස් දී ඇත.

(ආ) අයවැය පාලනය

ආයතනයේ සැලසුම්, අය-වැය ඇස්තමේන්තු හා සත්‍ය වියදම් මාසික ව නියාමනය කරමින් ආයතනයේ ඵලදායීත්වය හා කාර්යක්ෂමතාව වැඩි කිරීමට සැලසුම්, මුදල් හා අභ්‍යන්තර විගණන අංශවල නිලධාරීන්ගෙන් සමන්විත අභ්‍යන්තර මූල්‍ය කළමනාකරණ කමිටුවක් පිහිටුවා ඒ අනුව මාසිකව මූල්‍ය ප්‍රගතිය ඇගයීමට හා වාර්තා කිරීමටත්, නිවැරදි කළ යුතු තැන් නිවැරදි කර යහපත් මූල්‍ය පාලනයක් පවත්වා ගැනීමටත්, සාර්ථක භෞතික ප්‍රගතියක් ලබා ගැනීමටත් මේ වන විට කටයුතු යොදා ඇත.

(ඇ) තොග පාලනය

වාර්තාවේ දක්වා ඇති තොග සඳහා සුදුසු ක්‍රියාමාර්ග ගැනීමේ කටයුතු ආරම්භ කර ඇති අතර, ඉදිරියේ දී මෙවැනි ආකාරයේ ගැටලු ඇති නොවන පරිදි තොග කළමනාකරණය කිරීමට අවශ්‍ය අංශවලට උපදෙස් ලබා දී ඇත.

(ඇ) ප්‍රසම්පාදන ක්‍රියාවලිය

ආයතනයේ වාර්ෂික සැලැස්ම සකස් කරන අවස්ථාවේ දී ප්‍රසම්පාදන කටයුතුවල දීර්ඝ කාලීන ව ප්‍රමාද වීම් නිරීක්ෂණය වූ අතර විවිධ දෙපාර්තමේන්තුවල පවතින අවශ්‍යතා ගණනය කර ඒ අනුව ප්‍රසම්පාදන සැලැස්ම සකස් කර ඇති අතර, විධිමත් පරිදි ප්‍රසම්පාදන කටයුතු පවත්වා ගෙන යාමට කටයුතු කරනු ලැබේ.

ප්‍රසම්පාදන කටයුතු හා සම්බන්ධ කාර්ය මණ්ඩලය සඳහා නිසි පරිදි පුහුණුවක් ලබා දීමට කටයුතු කොට ඇති අතර, ඉදිරියේ දී ප්‍රසම්පාදන කටයුතු ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයට අනුකූල ව කර ගෙන යනු ලැබේ.

(ඉ) වත්කම් කළමනාකරණය

ආයතනය පිහිටි ඉඩම් නීත්‍යානුකූලව පවරා ගැනීම සඳහා අවශ්‍ය කටයුතු ආරම්භ කර ඇති අතර, ඒ අනුව අවශ්‍ය කටයුතු සිදු කරමින් පවතී.

එක්සත් ජාතීන්ගේ සංවර්ධන වැඩසටහන (UNDP) වෙතින් පවරා ගැනීමට නියමිත ව තිබූ GV-1823 හා 61-6298 වාහන දෙක ජාතික අධ්‍යාපන ආයතනය වෙත පවරා ගෙන ඇත. NA-7574 වාහනය පවරා දෙන ලෙස අධ්‍යාපන අමාත්‍යාංශය වෙත දැනුම් දී ඇත. පවරා ගැනීමට අවශ්‍ය කටයුතු සිදු කරමින් පවතී.

(ඊ) කාර්ය මණ්ඩල පරිපාලනය

කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුවේ 2016.09.30 දිනැති ලිපියෙන් පුරප්පාඩු 79 කට අනුමැතිය ලබා දී තිබූ අතර ඉන් 62 ක් බඳවා ගැනීම හා උසස් කිරීම් මගින් සම්පූර්ණ කර ඇති අතර, ඉතිරි පුරප්පාඩුව පවතින තනතුරු සඳහා බඳවා ගැනීම් සිදු කිරීමට කටයුතු කරමින් පවතී.

2017.09.21 දින අනුමැතිය ලැබී ඇති පුරප්පාඩු 125න් 07ක් සඳහා බඳවා ගැනීම් හා උසස් කිරීම් සිදු කර ඇති අතර, පුරප්පාඩු 14ක් සඳහා සම්මුඛ පරීක්ෂණ පවත්වා ඇත. ඉතිරි පුරප්පාඩු 30 සඳහා පුවත්පත් දැන්වීම් පලකර ඇත. අනෙකුත් තනතුරු සඳහා බඳවා ගැනීමට අවශ්‍ය කටයුතු කෙරමින් පවතී.

(උ) රූපවාහිනී අධ්‍යාපනික වැඩසටහන් ක්‍රියාත්මක කිරීම

මෙවැනි දෝෂ ඉදිරියේ දී ඇති නොවන පරිදි කටයුතු කිරීම සඳහා අවශ්‍ය ක්‍රියාමාර්ග ගෙන ඇත.

(ඌ) නේවාසිකාගාර පරිපාලනය

නේවාසික කමිටු රැස්වීම් පවත්වනු ලබන අතර, අධ්‍යාපන අමාත්‍යාංශය හා අනෙකුත් රාජ්‍ය ආයතන මගින් සංවිධානය කරනු ලබන වැඩමුළුවලට පැමිණෙන අයට හා ජාතික අධ්‍යාපන ආයතනය මගින් සංවිධානය කරනු ලබන වැඩමුළුවලට පැමිණෙන අයට නේවාසික පහසුකම් ලබා දීමට කටයුතු කර ඇත.

නේවාසිකාගාර විධිමත් පාලනය සඳහා අදාළ නීතිරීති ඇතුළත් ආයතන චක්‍රලේඛයක් සකස් කරමින් පවතී.

ආචාර්ය ටී. ඒ. ආර්. ජේ. ගුණසේකර

අධ්‍යක්ෂ ජනරාල්

ජාතික අධ්‍යාපන ආයතනය

ඇමුණුම 01

Advance No.	Name	Amount
162267	Ananda M	52,200.00
162288	Wimalarathana G.A	90,000.00
161822	Jayawardena M.R.P.I	40,000.00
160571	Jasar J.M	9,000.00
162736	Rambukwella H.W.W.M.S.R	36,400.00
160950	Rajapaksha A.A.R.C	38,800.00
160263	DE silva L.W.R	88,200.00
162201	Chinthani R.B.N	15,875.00
162392/93	Chinthani R.B.N	26,250.00
163030	Asoka G.H	24,000.00
162983	Asoka G.H	419.96
1601830	Asoka G.H	2,561.00
		423,705.96

ඇමුණුම 02

7018/11/M

සම්පත් බැංකුව
சம்பத் வங்கி
SampathBank
Attidiya

OFFICIAL CHEQUE

NOT NEGOTIABLE
A/C PAYEE ONLY

දිනය Date திகதி 2 8 0 7 2 0 1 7
D D M M Y Y Y Y

Pay DIRECTOR GENERAL A/C NO:607624 BOC-MAHARAGA-MA N.I.E 7018/11/M

හෝ ඇණවුම Or Order அல்லது கட்டளைப்படி

රුපියල් Rupees ரூபாய். Fifty Six Thousand Five Hundred Twenty Seven only

රු. Rs. ரூ. 56,527.00

ගෙවිය செலுத்தவும்

SAMPATH BANK PLC

Authorised Signatory Authorised Signatory

Sampath Bank PLC - Company No. PQ 144

⑈002670⑈ 7278⑆089⑆ 9004090000⑈

සම්පත් බැංකුව
சம்பத் வங்கி
SampathBank
Attidiya

OFFICIAL CHEQUE

NOT NEGOTIABLE
A/C PAYEE ONLY

දිනය Date திகதி 2 7 0 7 2 0 1 7
D D M M Y Y Y Y

Pay DIRECTOR GENERAL A/C NO.607624 BOC -MAHARAGAMA N.I.E 7018/11/M

හෝ ඇණවුම Or Order அல்லது கட்டளைப்படி

රුපියල් Rupees ரூபாய். Four Million only

රු. Rs. ரூ. 4,000,000.00

ගෙවිය செலுத்தவும்

SAMPATH BANK PLC

Authorised Signatory Authorised Signatory

Sampath Bank PLC - Company No. PQ 144

⑈002668⑈ 7278⑆089⑆ 9004090000⑈

මූල්‍ය ප්‍රකාශන වලට අදාළ සටහන්

1. වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්ති

1.1 පොදු :

ප්‍රකාශයට පත්කරනු ලැබූ, ආයතනයේ මූල්‍යමය තත්ත්වයන්, ආයතන කාර්ය ඵලයන් සකසා ඇත්තේ පෙර භාවිත කරනු ලැබූ පිළිගත් ගිණුම්කරණ පිළිවෙත් අනුව සහ පෙර සම්මත ගිණුම්කරණ සම්මුතීන්ට එකඟවය.

1.2 විදේශ විනිමය පරිවර්තනය

සෑම විදේශ විනිමය ගනුදෙනුවක්ම ගණනය කරනු ලැබෙනුයේ ගනුදෙනුව කරන ලද වේලාවට අදාළ වූ විදේශ විනිමය අනුපාතය අනුවය.

1.3 සූදානම් වීමේ පදනම

1.3.1 එකඟතාවේ ප්‍රකාශය

මූල්‍යමය ප්‍රකාශනයන්ට මූල්‍යමය තත්ත්වය, මූල්‍යමය කාර්ය ඵලය පිළිබඳ ප්‍රකාශනය, සාධාරණත්වයේ වෙනස්කම් පිළිබඳ ප්‍රකාශනය, මුදල් පාලනය පිළිබඳ ප්‍රකාශනය සහ මූල්‍යමය ප්‍රකාශයන්ට අදාළ සටහන් - ඇතුලත් වේ. මේ ප්‍රකාශය සූදානම් කර ඇත්තේ ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරී ආයතනය මගින් - ප්‍රකාශිත ශ්‍රී ලංකා රාජ්‍ය ගිණුම් ප්‍රමිතයට අනුකූලවය. (SLPSAS)

1.4 වත්කම් සහ වත්කම් තක්සේරු කිරීමේ පදනම

1.4.1 ණයකරුවන් සහ වෙනත් ලැබීම්

අපේක්ෂිත උපලබ්ධිත වටිනාකම් ලෙස ඉදිරියට ගෙන යනු ලැබේ. විශ්වාසය නොතැබිය හැකි උපලබ්ධිතයන් සඳහා ඇස්තමේන්තුවක් කරනු ලබන්නේ, වර්ෂය අවසානයට ඇති නියත නොගෙවන ලද ප්‍රමාණයන් පිළිබඳ කෙරෙන සමාලෝචනයක පදනම උඩය.

1.4.2 දේපල යන්ත්‍රෝපකරණ, උපකරණ අගය ක්ෂයවීම්

වත්කම් වාර්තා කරනු ලැබෙනුයේ එහි පිරිවැය මතය, හෝ එකතුවූ ක්‍ෂය වීම සෘණකර ප්‍රත්‍ය ගණනය කිරීමෙන් ලැබෙන අගය මතය, නොහොත් ධාරණ සංඛ්‍යාව මතය. දේපල ලබා ගැනීමේදී සෘජුවම වැය වූ මුදලද එහි පිරිවැයට ඇතුළත්වේ. ක්‍ෂය වීම් වියදම් ලෙස, ආදායම් ප්‍රකාශනයෙහි සටහන් වේ. පහත සඳහන් වාර්ෂික අනුපාතයන්ට අනුව, එම වටිනාකම්වල අගය ඇස්තමේන්තු කරන ලද කාර්යක්‍ෂම ජීවදර්ශකය උඩ කපා හරිනු ලැබේ.

කාර්යාලීය ලී බඩු හා උපකරණ	10%
පරිගණක උපකරණ	33 1/3%
පුස්තකාල පොත් සහ සඟරා	10%
යතුරුපැදි සහ බයිසිකල්	20%
යන්ත්‍රෝපකරණ	10%
මෝටර් රථ	20%
ගොඩනැගිලි	5%
ඡායා පිටපත් යන්ත්‍රෝපකරණ	10%

1.4.3 බඩු ලේඛන ඃ

බඩු ලේඛන අවම වටිනාකමට තක්සේරු කරනු ලබන අතර, උපලබ්ධිත ශුද්ධ වටිනාකම නොසැලකේ.

1.4.4 මුදල් සහ මුදලට සමාන දෑ

මුදල් හා මුදලට සමාන දෑ නිර්වචනය වන්නේ තමා වෙත ඇති මුදල්, සංසරණය වෙමින් පවතින මුදල් සහ බැංකු ගිණුම් ශේෂයේ ඇති මුදල්ය.

1.4.5 මුදල් ප්‍රවාහය

මුදල් ගලනය පිළිබඳ ප්‍රකාශනය සකසා ඇත්තේ වක්‍ර ක්‍රමය භාවිතයෙනි.

1.5 ගණකාධිකරණ ප්‍රදාන

දරන ලද වියදමට හානිපූරණයක් ලෙස ආයතනයට ලැබෙන ප්‍රදාන ආදායම ලෙස සැලකේ. වියදම දැරූ කාල පරිච්ඡේදයට අදාළව ක්‍රමානුකූල පදනමක් උඩ මේ වියදම එලෙස ආදායම් ප්‍රකාශනයට ඇතුලත් කෙරේ. වත්කම් පිරිවැය සඳහා ආයතනයට ලැබෙන ප්‍රදාන ප්‍රාග්ධනයටත් ක්‍රමක්ෂයටත් භාජනය වේ. අදාළ වත්කම් වල ප්‍රයෝජනවත් ජීව කාලය උඩ පදනම් වී මේ කාර්යය කෙරේ.

1.6 සේවක ප්‍රතිලාභ

1.6.1 පාරිතෝෂිකය සඳහා ප්‍රතිපාදන

''1983 අංක 12 පනත විශ්‍රාමික පාරිතෝෂිකය'' යටතේ ආයතනයට බැඳෙන සියළු සේවකයන්ට විශ්‍රාමික පාරිතෝෂකයක් ලබාදීමට ප්‍රතිපාදන සපයා ඇත. මෙහි වගකීම් බාහිර අරමුදලකින් නොවන අතර, ආයුගණිකව ද අගය කර නැත.

1.6.2. සහභාගී සැලසුම් - නිර්වචනය

ආදායම් ප්‍රකාශනයේ සේවක පාරිතෝෂික අරමුදල සහ සේවක සංගත අරමුදල වෙනුවෙන් කළයුතු දායකත්වය දරන ලද වියදම් ලෙස සලකා සඳහන් වේ.

1.7 පවත්නා වගකීම්

ශේෂ පත්‍රයේ සඳහන් දිනයට පසු අවුරුද්දක් තුළ, ආයතනය විසින් (ඉල්ලුම් කරනු ලැබ) කළ යුතු ගෙවීම් පවත්නා වගකීම් ලෙස සැලකේ. ජංගම නොවන වගකීම් වන්නේ ශේෂ පත්‍රයේ සඳහන් දිනයට අවුරුද්දකට පසුව ගෙවිය යුතු ගෙවීම්ය.

1.8 ශේෂ පත්‍ර දිනයට පසු සිද්ධීන්

ශේෂ පත්‍රයේ සඳහන් දිනයට පසුව සිදුවූ කාර්යයන් සළකා බලා, අවශ්‍ය වෙනස්කම් අදාළ ලෙස ඇතුළත් කොට ගිණුම සම්පූර්ණ කොට ඇත.

1.9 වත්කම් බැරකම්

1.9.1 ආදායම් සංජානනය

i වත්කම් බැරකම් ප්‍රකාශනයේ පිළිගත් මුදල් පදනම වනුයේ පුනරාවර්තන වියදම් සඳහා රජයේ දීමනාවය.

ii විභාග, සම්මන්ත්‍රණ, පාඨමාලා සහ වෙනත් අධ්‍යාපනික සහ සාමාජිකයන්ගේ කාර්ය භාරයන්ගේ අතිරික්තය / ඌණතාව එම කාර්යන් අවසන් වන වර්ෂයට අදාළව ආදායම් ගණනය කර ඇත.

1.9.2 වියදම්

i ආයතනය පවත්වා ගෙන යෑමේ දී දරණ ලද සෑම වියදමක්ම ද ආයතනය කාර්යක්ෂම ලෙස පවත්වා ගෙන යෑමේ දී ප්‍රාග්ධන වත්කම් ද අතිරික්ත / ඌණතාවනට එළඹීමෙන්, ආදායම් ගිණුමට බැර කොට ඇත.

ii ආයතනය විසින් කරන ලද, අත්කර ගැනීම්, ව්‍යාප්ත වීම්, ප්‍රාග්ධන සංවර්ධනය මේ ආදී ස්ථිර යැයි සැලකිය හැකි මාර්ග වලින් ආයතනයේ ඉපයීම් හැකියාව දියුණු කිරීමට ගන්නා ලද දෑ ප්‍රාග්ධන වියදම් ලෙස සලකා ඇත.

2.0 අසම්භාව්‍ය අවස්ථා

අසම්භාව්‍ය වගකීම්

2.1 පහත සඳහන් අවස්ථා නඩු තීන්දුවට භාජනය වී ඇති බැවින් වගකීම් ප්‍රමාණය ගණනය, තීරණය නොකළ හැකි බැවින්, ඒ සඳහා ප්‍රතිපාදන තීන්දු කිරීම අපහසුවේ.

1. MH33/1005/11 - ඩබ්ලිව්.ජේ.සී.එන්. වික්‍රමසිංහ මිය

අසම්භාව්‍ය වත්කම්

2.2 පහත සඳහන් නඩු උසාවියේ තීරණයකට භාජනය වන හෙයින් අසම්භාව්‍ය වත්කම් ලෙස සටහන් කොට ඇත.

1.	අංක 780/09/m/මුල්‍ය	රු.2,237,337.00
2.	අංක 4801/05/මුල්‍ය	රු.2,947,755.00
3.	ජේ.පී.එස්.එස්. පතිරණ මිය	රු.4,056,527.00
4.	කේ.ඩබ්.පී.ජේ. වීරවර්ධන මිය	රු. 198,497.00
5.	බී.කේ. විජේගුණවර්ධන මෙවිය	රු.1,335,286.00

2.3 හිගයක් ලෙස හඳුනාගත් රු.202,189.60 ක් වටිනා වත්කම් නීතිමය කටයුතු අවසන් වූ විට, වත්කම් සත්‍යායනයට භාජනය කෙරේ.

ජාතික අධ්‍යාපන ආයතනය
2016 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්වය පිළිබඳ වාර්තාව

	සටහන්	2016 රු. ශ	2015 රු. ශ
වත්කම්			
ජංගම වත්කම්			
මුදල් සහ මුදල් හා සමාන දෑ	1	320,852,665.67	316,977,765.46
කෙටිකාලීන ආයෝජන	2	384,007,069.95	321,948,287.31
ව්‍යාපාර, වෙනත් ලැබීම් සහ අත්තිකාරම්	3,4	77,542,828.90	76,161,196.03
බඩු ලේඛනය/තොග	5	78,249,224.87	30,083,566.38
පෙර ගෙවීම්	6	48,120.00	122,508.00
		860,699,909.39	**745,293,323.18**
ජංගම නොවන වත්කම්			
ලැබීම්	7	160,643.39	335,890.55
කෙරීගෙන යන වැඩ	8	4,776,934.50	1,200,949.33
යටිතල පහසුකම්, යන්ත්‍රෝපකරණ, ඉඩම් හා ගොඩනැගිලි	9	771,595,856.50	779,055,300.04
		776,533,434.39	**780,592,139.92**
මුළු වත්කම්		**1,637,233,343.78**	**1,525,885,463.10**
වගකීම්			
පවත්නා වගකීම්			
ව්‍යාපාර වෙනත් ගෙවිය යුතු සහ උපචිත වැය	10	130,409,358.98	74,970,040.06
පාඨමාලා ගාස්තු සහ වෙනත් ලැබී ඇති අත්තිකාරම්	11	49,977,626.07	62,941,477.62
		180,386,985.05	**137,911,517.68**
ජංගම නොවන වත්කම්			
විලම්බිත ආදායම	12	335,890.55	511,137.71
පාරිතෝෂික සඳහා ප්‍රතිපාදන	13	118,419,977.65	102,838,149.37
මුළු වගකීම්		**299,142,853.25**	**241,260,804.76**
ශුද්ධ වත්කම්		**1,338,090,490.53**	**1,284,624,658.34**
ශුද්ධ වත්කම් / සාධාරණය			
ප්‍රාග්ධන සංයුතිය සහ ප්‍රදානය	14	1,082,304,864.83	1,069,018,530.60
සමුච්චිත අරමුදල	15	(43,823,662.53)	(81,616,424.64)
ණය අරමුදල	16	67,734,281.98	65,347,543.13
සංචිත අරමුදල	17	231,875,009.25	231,875,009.25
මුළු ශුද්ධ වත්කම් / සාධාරණය		**1,338,090,493.53**	**1,284,624,658.34**

පිටු අංක 03 සිට 05 දක්වා ඇති ගිණුම්කරණ ප්‍රතිපත්ති හා මූල්‍ය ප්‍රකාශන, මූල්‍ය ප්‍රකාශනයේ අනුකූල කොටසකි.

නිවැරදි බවට සහතික කළේ :

පී. තේනබදු
නියෝජ්‍ය අධ්‍යක්ෂ ජනරාල්
(පාලන, මුදල් හා සහාය සේවා)

අනුමත කළේ :

ආචාර්ය ටී.ඒ.ආර්.ජේ. ගුණසේකර
අධ්‍යක්ෂ ජනරාල්

2017 මාර්තු 09
ජාතික අධ්‍යාපන ආයතනය
මහරගම

ජාතික අධ්‍යාපන ආයතනය
2016 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා
මුදල් ප්‍රවාහ ප්‍රකාශය

	සටහන්	2016 රු.	2015 රු.	අයවැයගත 2016 රු.
මෙහෙයුම් ආදායම්				
ආදායම්	18(20-25)	483,095,240.55	469,432,730.60	156,431,000.00
රජයේ සහ විදේශ පුනරාවර්තන ප්‍රදාන	19	313,226,000.00	341,723,342.44	568,526,000.00
මුලු ආදායම		**796,321,240.55**	**811,156,073.04**	**724,957,000.00**
මෙහෙයුම් වියදම්				
සේවක පඩිනඩි සංවේතන	26	330,648,046.79	292,034,774.92	316,698,000.00
ගමන් වියදම්	28	15,510,032.20	5,420,626.46	17,775,000.00
භාවිත කරන ලද පරිභෝජ්‍ය හා සැපයුම්	29	19,852,044.19	34,772,354.07	99,543,000.00
වියදම් ක්ෂයවීම් සහ ක්‍රමක්ෂයවීම්	30	54,915,047.11	50,755,415.38	0.00
නඩත්තු වියදම්	31	30,566,846.44	26,572,014.52	13,040,000.00
ගිවිසුම් සේවා	32	264,195,493.99	194,247,256.11	254,893,000.00
තැන්පතු වියදම්	33	15,344,104.00	28,567,170.37	0.00
මෙහෙයුම් වියදම්	34	27,100,592.19	20,688,609.22	23,008,000.00
මූල්‍යමය පිරිවැය	35	396,274.53	466,702.08	0.00
මුළු මෙහෙයුම් වියදම්		**758,528,481.44**	**653,524,923.13**	**724,957,000.00**
වර්ෂයට අතිරික්තය/හිඟය		**37,792,759.11**	**157,631,149.91**	**0.00**

පිටු අංක 03 සිට 05 දක්වා ඇති ගිණුම්කරණ ප්‍රතිපත්ති හා මූල්‍ය ප්‍රකාශන - මූල්‍ය ප්‍රකාශනයේ අනුකූල කොටසකි.

නිවැරදි බවට සහතික කළේ :

පී. තේනබදු
නියෝජ්‍ය අධ්‍යක්ෂ ජනරාල්
(පාලන, මුදල් හා සහාය සේවා)

අනුමත කළේ :

ආචාර්ය ටී.ඒ.ආර්.ජේ. ගුණසේකර
අධ්‍යක්ෂ ජනරාල්

2017 මාර්තු 09
ජාතික අධ්‍යාපන ආයතනය
මහරගම

ජාතික අධ්‍යාපන ආයතනය
සාධාරණය කිරීමේ වෙනස්කම් පිළිබඳ ප්‍රකාශනය -2016

2015 ජනවාරි 01 දිනට පැවති ශේෂය	ණය අරමුදල	ප්‍රත්‍ය ගණන සහ අනෙකුත් සංචිත	ප්‍රාග්ධන සංචිතය	සමුච්චිත අරමුදල	එකතුව
	62,944,248	231,875,009	1,006,050,770	(239,247,575)	**1,061,622,453**
ස්ථාවර වත්කම් සංචිත ආදායම	නැත	නැත	නැත	නැත	-
තැන්පත් ප්‍රාග්ධන සංචිතය	නැත	නැත	නැත	නැත	-
ප්‍රාග්ධන ප්‍රදානය	නැත	නැත	87,900,000	නැත	**87,900,000**
ප්‍රාග්ධන ප්‍රදානය (විදේශ ආධාර)	නැත	නැත	12,481,580	නැත	**12,481,580**
වැය කළහැකි ලාභ සංචිතය	නැත	නැත	නැත	නැත	-
ණය අරමුදලට පැවරීම	නැත	නැත	නැත	නැත	-
පසුගිය වර්ෂයේ යථාවත් කිරීම්/ගැලපීම	නැත	නැත	නැත	නැත	-
ආපදා ණයෙන් ලැබූ පොළිය	2,403,295	නැත	නැත	නැත	**2,403,295**
ණය අරමුදල	නැත	නැත	නැත	නැත	-
වර්ෂයේ අතිරික්තය	නැත	නැත	නැත	157,631,150	**157,631,150**
පරිත්‍යාග	නැත	නැත	(1,095,107)	නැත	**(1,095,107)**
භාණ්ඩාගාර සහ වෙනත් ප්‍රදාන	නැත	නැත	12,070,602	නැත	**12,070,602**
ප්‍රත්‍යා ගණණ අතිරික්තය හා අනෙකුත් සංචිත	නැත	නැත	නැත	නැත	-
පර්යේෂණ වර්ධන සඳහා මුදල් ප්‍රතිපාදන	නැත	නැත	නැත	නැත	-
අභාවිත තොග	නැත	නැත	නැත	නැත	-
අගය ක්‍ෂය වීම (විලම්භිත සංචිතය)	නැත	නැත	(48,389,314)	නැත	**(48,389,314)**
අධිගණනය කිරීම්	නැත	නැත	නැත	නැත	-
ප්‍රාග්ධනය සඳහා සැපයුම්	නැත	නැත	නැත	නැත	-
සැපයීම් වර්ධනය සඳහා මුදල් ප්‍රතිපාදන	නැත	නැත	නැත	නැත	-
2015 දෙසැම්බර් 31 වන දිනට ශේෂය	**65,347,543**	**231,875,009**	**1,069,018,531**	**(81,616,425)**	**1,284,624,659**
2016 ජනවාරි 01 වන දිනට ශේෂය	**65,347,543**	**231,875,009**	**1,069,018,531**	**(81,616,425)**	**1,284,624,659**
ස්ථාවර වත්කම් සංචිත ආදායම	නැත	නැත	නැත	නැත	-
තැන්පත් ප්‍රාග්ධන සංචිතය	නැත	නැත	නැත	නැත	-
ප්‍රාග්ධන ප්‍රදානය	නැත	නැත	21,000,000	නැත	**21,000,000**
ප්‍රාග්ධන ප්‍රදානය (විදේශ ආධාර)	නැත	නැත	43,438,912	නැත	**43,438,912**
වැයකළ හැකි ලාභ සංචිතය	නැත	නැත	නැත	නැත	-
ණය අරමුදලට පැවරීම	නැත	නැත	නැත	නැත	-
පසුගිය වර්ෂයේ යථාවත් කිරීම්/ගැලපීම	නැත	නැත	නැත	නැත	-
අපදා ණයෙන් ලැබූ පොළිය	2,386,739	නැත	නැත	නැත	**2,386,739**
ණය අරමුදල	නැත	නැත	නැත	නැත	-
වර්ෂයේ අතිරික්තය	නැත	නැත	නැත	37,792,759	**37,792,759**
පරිත්‍යාග	නැත	නැත	(733,558)	නැත	**(733,558)**
භාණ්ඩාගාර සහ වෙනත් ප්‍රදාන	නැත	නැත	2,876,305	නැත	**2,876,305**
ප්‍රත්‍යා ගණණ අතිරික්තය සහ වෙනත් සංචිත	නැත	නැත	නැත	නැත	-
පර්යේෂණ වර්ධනය සඳහා මුදල් ප්‍රතිපාදන	නැත	නැත	නැත	නැත	-
අභාවිත තොග	නැත	නැත	නැත	නැත	-
අගය ක්ෂය වීම (විලම්භීත සංචිතය)	නැත	නැත	(53,295,325)	නැත	**(53,295,325)**
අධි ගණනය කිරීම්	නැත	නැත	නැත	නැත	-
ප්‍රාග්ධන සඳහා සැපයුම්	නැත	නැත	නැත	නැත	-
පර්යේෂණ වර්ධනය සඳහා මුදල් ප්‍රතිපාදන	නැත	නැත	නැත	නැත	-
2016 දෙසැම්බර් 31 දිනට ශේෂය	**67,734,282**	**231,875,009**	**1,082,304,865**	**(43,823,666)**	**1,338,090,490**

ජාතික අධ්‍යාපන ආයතනය
2016 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා
මුදල් ප්‍රවාහ ප්‍රකාශය

	2016 රු.	2015 රු.
මෙහෙයුම් ක්‍රියාකාරකම් වලින් මුදල් ගලනය		
සාමාන්‍ය ක්‍රියාකාරකම් වල අතිරික්තය/(ඌනතාවය)	37,792,759	157,631,150
ගැලපුම		
මුදල් නොවන සංචලනයන් සඳහා		
ක්ෂය	54,915,047	50,755,415
පාරිතෝෂික සඳහා සැපයුම	21,279,142	8,789,598
ගැලපුම		
අපහරණ අලාභය සඳහා ගැලපීම් (දේ,පි,උ)		209,715
ප්‍රාග්ධන ක්ෂය වියදමට පෙර මෙහෙයුම් ක්‍රියාකාරකම්	**113,986,948**	**217,385,878**
තොග : අඩුවීම් / වැඩිවීම	(48,165,658)	42,420,666
ලැබීම් : අඩුවීම් / වැඩිවීම	(1,381,633)	(3,153,469)
වෙනත් ජංගම වත්කම් : අඩුවීම් / වැඩිවීම	74,388	67,734
ගෙවීම් : අඩුවීම් / වැඩිවීම	35,323,498	(42,601,524)
ක්‍රියාකාරී ප්‍රාග්ධනයෙන් ශුද්ධ මුදල් තුලනය	(14,149,405)	(3,266,593)
මෙහෙයුම් මගින් ජනනය කරන ලද මුදල්	99,837,543	214,119,285
ගෙවන ලද විශ්‍රාමික ප්‍රතිලාභ වැය	(5,697,314)	(4,100,422)
මෙහෙයුම් ක්‍රියාකාරකම්වලින් ජනනය කරන ලද ශුද්ධ/මුළු මුදල	**94,140,229**	**210,018,863**
ආයෝජන ක්‍රියාකාරකම් වලින් ලත් මුදල් ප්‍රමාණය		
කරගෙන යන වැඩ	3,575,985	
එකතු කිරීම් : යන්ත්‍රෝපකරණ උපකරණ	(47,455,604)	(49,752,380)
ආයෝජන : භාණ්ඩාගාර බිල්පත්	(62,058,783)	(30,514,656)
ආයෝජන ක්‍රියාකාරකම් සඳහා යෙදවූ ශුද්ධ/මුළු මුදල	**(105,938,402)**	**(80,267,036)**
මූල්‍ය කටයුතු මගින් ලත් මුදල් ප්‍රමාණය		
ප්‍රාග්ධන ප්‍රදාන සහ පරිත්‍යාග	13,286,334	55,067,760
ණය අරමුදල	2,386,739	2,403,295
මූල්‍ය කටයුතු සඳහා යොදන ලද ශුද්ධ මුදල	15,673,073	57,471,055
මුදල් සහ මුදල් සමාන දෑ : ශුද්ධ වැඩිවීම/අඩුවීම	3,874,901	187,222,882
මුදල් සහ මුදල් සමාන දෑ : වර්ෂය මුල	316,977,765	129,754,883
මුදල් සහ මුදල් සමාන දෑ : වර්ෂය අග	**320,852,666**	**316,977,765**